

# ශ්‍රී ලංකාවේ
# **බහුමාන දරිද්‍රතා දර්ශකය 2019 ප්‍රතිඵල:**
# ජාතික සහ ළමා විශ්ලේෂණයන්

OPHI
Oxford Poverty & Human Development Initiative

DCS

Co-funded by
the European Union

unicef
for every child
සෑම දරුවෙක් වෙනුවෙන්ම
ஒவ்வொரு சிறுவர்களுக்காகவும்

# ශ්‍රී ලංකාවේ **බහුමාන දරිද්‍රතා දර්ශකය 2019 ප්‍රතිඵල:** ජාතික සහ ළමා විශ්ලේෂණයන්

© UNICEF, 2023 ජූනි

ISBN: 978-955-1720-05-6

ඡායාරූපකරණය: UNICEF ශ්‍රී ලංකා / අර්ල් ජයසූරිය

# අන්තර්ගතයන්


ප්‍රණාමය vi

යොමුව 1

විධායක සාරාංශය 4

හැඳින්වීම 9

1.1. ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය අරමුණු 10

1.2. තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් වාර්තා කිරීම 11

1.3. වෙනත් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක 12

1.4. ඇල්කය(ර්)-ෆොස්ටර් ක්‍රමය 12

ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය 15

2.1. ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ සැලැස්ම 16

2.1.1. ප්‍රතිපත්ති සැලැස්ම සහ උපදේශන ක්‍රියාවලිය 16

2.1.2. දත්ත 16

2.1.3. ව්‍යුහය 17

2.2. ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රතිඵල 20

2.2.1. දරිද්‍රතා මට්ටම: ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය, H, A 20

2.2.2. දර්ශකයට අනුව දරිද්‍රතාවේ සංයුතිය 22

2.2.3. ප්‍රතිඵලයන්හි දෘඪතාව සහ සමතිරික්තතා විශ්ලේෂණය 38

ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය 45

3.1. ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ සැලැස්ම 47

3.2. ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රතිඵල 50

3.2.1. දරිද්‍රතා මට්ටම: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය, H, A 50

3.2.2. දර්ශකයට අනුව ළමා දරිද්‍රතාවේ සංයුතිය 54

3.2.3. ප්‍රතිඵලයන්හි දෘඪතාව සහ සමතිරික්තතා විශ්ලේෂණය 59

සමාප්තය 65

සම්බන්ධ යොමු 67

උපග්‍රන්ථය 68

# වගු ලැයිස්තුව

1 වගුව: ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකයේ මාන, දර්ශක, සහ බර තැබීම් ............ 18

2 වගුව: ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය, පැතිරි ප්‍රමාණය, සහ තීව්‍රතා මට්ටම් ............ 20

3 වගුව: නාගරික, ග්‍රාමීය, සහ වතු ප්‍රදේශ අනුව බහුමාන දරිද්‍රතාව ............ 25

4 වගුව: දිස්ත්‍රික්කය අනුව බහුමාන දරිද්‍රතාව ............ 27

5 වගුව: වයස් කාණ්ඩය අනුව බහුමාන දරිද්‍රතාව ............ 31

6 වගුව: ගෘහමූලිකත්වය අනුව බහුමාන දරිද්‍රතාව ............ 33

7 වගුව: විවිධ දරිද්‍රතා සීමාවන් සඳහා දිස්ත්‍රික්ක ශ්‍රේණිගත කිරීම් අතර සහසම්බන්ධතාව ............ 40

8 වගුව: විවිධ බර තැබීම් ව්‍යුහයන් සඳහා දිස්ත්‍රික්ක ශ්‍රේණිගත කිරීම් අතර සහසම්බන්ධතාව ............ 41

9 වගුව: ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය - වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්හි සමතිරික්තතා විශ්ලේෂණය (ආර්$_0$ මිණුම) ............ 42

10 වගුව: ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය - වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්හි සමතිරික්තතා විශ්ලේෂණය (ආර්$_0$ මිණුම) ............ 43

11 වගුව: ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා මාන, දර්ශක, සහ බර තැබීම් (වසර 4 හෝ ඊට අඩු වයසැති ළමුන්) ............ 49

12 වගුව: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය, පැතිරි ප්‍රමාණය, සහ තීව්‍රතා මට්ටම් ............ 52

13 වගුව: වයස් කාණ්ඩය අනුව ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ............ 55

14 වගුව: විවිධ දරිද්‍රතා සීමාවන් සඳහා පළාත් ශ්‍රේණිගත කිරීම් අතර සහසම්බන්ධතාව ............ 60

15 වගුව: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය - වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්හි සමතිරික්තතා විශ්ලේෂණය (ආර්$_0$ මිණුම) ............ 62

16 වගුව: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය - වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්හි සමතිරික්තතා විශ්ලේෂණය (ආර්$_0$ මිණුම) ............ 63

17 වගුව: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා විකල්ප ව්‍යුහය 1: (ගෘහවීකක මට්ටම් මිණුම) ............ 68

18 වගුව: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා විකල්ප ව්‍යුහය 2: (වසර 4 හෝ ඊට අඩු වයසැති ළමුන් - තනි පුද්ගල - සංජානන සංවර්ධනය සමග) ............ 69

19 වගුව: ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයයෙහි දෘඪතාවය පිළිබඳ විශ්ලේෂණය ............ 70

20 වගුව: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයයෙහි දෘඪතාවය පිළිබඳ විශ්ලේෂණය ............ 71

## රූපසටහන් ලැයිස්තුව

1 රූපය: ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ව්‍යුහය ....17

2 රූපය: දරිද්‍ර ජනගහනයෙන් කෙතරම් ප්‍රතිශතයක් කෙතරම් විහීනතා මට්ටමක් අත්විඳින්නේද? ....21

3 රූපය: ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය: වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන් .... 22

4 රූපය: නාගරික, ග්‍රාමීය, සහ වතු ප්‍රදේශ අනුව ජනගහනයේ සහ බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන ජනගහනයේ ව්‍යාප්තිය .... 24

5 රූපය: නාගරික, ග්‍රාමීය, සහ වතු ප්‍රදේශ අනුව බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකයන් විසින් ඇතිකරන ප්‍රතිශත දායකත්වය .... 25

6අ රූපය: දිස්ත්‍රික්කය අනුව බහුමාන දරිද්‍රතාවයේ ජනගහන අනුපාතය .... 26

6ආ රූපය: දිස්ත්‍රික්කය අනුව බහුමාන දරිද්‍රතාවයේ ජනගහන අනුපාතය ....28

7 රූපය: දිස්ත්‍රික්කය අනුව බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන ප්‍රතිශත දායකත්වය (බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව පෙළගස්වන ලද) ....29

8 රූපය: වයස් කාණ්ඩය අනුව බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන නිරපේක්ෂ දායකත්වය ....32

9 රූපය: ගෘහමූලිකත්වය අනුව බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන නිරපේක්ෂ දායකත්වය ....32

10 රූපය: පානීය ජලයේ එක් එක් සංරචකයකින් පමණක් විහීනතාවයට පත්වී ඇති ජනගහන සමානුපාතය, සහ පානීය ජලයේ එක් එක් සංරචකයකින් පමණක් විහීනතාවයට පත්වී ඇති සහ ජාතික බහුමාන දරිද්‍රතාවෙන්ද පෙළෙන ජනගහන සමානුපාතය ....35

11 රූපය: මූලික පහසුකම්හි එක් එක් සංරචකයකින් පමණක් විහීනතාවයට පත්වී ඇති ජනගහන සමානුපාතය, සහ මූලික පහසුකම්හි එක් එක් සංරචකයකින් පමණක් විහීනතාවයට පත්වී ඇති, සහ ජාතික බහුමාන දරිද්‍රතාවෙන්ද පෙළෙන ජනගහන සමානුපාතය ....36

12 රූපය: වාරණය නොකළ ජාතික ජනගහන දරිද්‍රතා අනුපාතයන් ....37

13 රූපය: විවිධ දරිද්‍රතා තීරක k අගයයන් සඳහා දිස්ත්‍රික් දරිද්‍රතා අනුපාතයන් ....38

14 රූපය: ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ ව්‍යුහය ....47

15 රූපය: දුප්පත් ළමා ජනගහනයෙන් (වසර 4 හෝ ඊට අඩු වයසැති) කෙතරම් ප්‍රතිශතයක් කෙතරම් විහීනතා මට්ටමක් අත්විඳින්නේද? ....53

16 රූපය: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය: වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන් ....54

17 රූපය: වයස් කාණ්ඩය (වසර 4 හෝ ඊට අඩු) අනුව ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන ප්‍රතිශත දායකත්වය .... 56

18 රූපය: ළමයාගේ (වසර 4 හෝ ඊට අඩු වයසැති ළමුන්ගේ) ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන නිරපේක්ෂ දායකත්වය ....56

19 රූපය: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය: වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාතයන් ....58

20 රූපය: විවිධ දරිද්‍රතා සීමාවන් (k) සඳහා පළාත් ජනගහන දරිද්‍රතාව (H) ....59

# ප්‍රණාමය

මෙම වාර්තාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, සහ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මූලාරම්භ ආයතනයේ සාමූහික උත්සාහයක ප්‍රතිඵලයක් වේ.

අපගේ විශේෂ ස්තුතිය ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකයේ සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ සාකච්ඡාවන්ට සහ විශ්ලේෂණයන්ට තීරණාත්මකවූ තාක්ෂණික විශේෂඥතාව සහිත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරීන් කණ්ඩායම වෙත හිමි වෙයි. මෙහිදී අධ්‍යක්ෂ ජනරාල් පී. එම්. පී අනුර කුමාර මහතා විසින් ලබාදෙන ලද සමස්ථ මග පෙන්වීම, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාණ) කේ. එම්. ඩී. එස්. ඩී. කරුණාරත්න මහත්මියගේ මග පෙන්වීම සහිතව නියැදි සමීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ කේ. ඒ. එස්. කොඩිකාර මහත්මියගේ අධීක්ෂණය යටතේ එම අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආචාර්ය ඩී. දිල්ශානි දීපවංශ මහත්මිය නායකත්වය සපයන ලද සංඛ්‍යාණ කාර්ය මණ්ඩලය බොහෝ සෙයින් අගය කෙරේ. උපදේශන ක්‍රියාවලියට සහභාගී වෙමින් ජාතික සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයන් ශ්‍රී ලංකාවට අදාල කර ගැනීම සඳහා වටිනා අදහස් දක්වන ලද රේඛීය අමාත්‍යංශයන්හි නියෝජිතයින් සහ විෂයානුබද්ධ විශේෂඥවරුන්ටද අපි බොහෝසේ ස්තුතිවන්ත වෙමු.

මෙම වාර්තාව සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි උපාය මාර්ගික, ප්‍රතිපත්ති, සන්නිවේදන, සහ තාක්ෂණික සහාය හිමිවූ අතර, ක්‍රිස්ටියන් ස්කූග් (නියෝජිත), එමා බ්‍රිගම් (හිටපු නියෝජ්‍ය නියෝජිත), මීරා බියර්බවුම් (සමාජ ප්‍රතිපත්ති විශේෂඥ), ලුයිස් මොරෙයිරා ඩැනියල්ස් (හිටපු සමාජ ප්‍රතිපත්ති ප්‍රධානී), සහ සජිත් දි මෙල් (සංඛ්‍යාණ සහ අධීක්ෂණ විශේෂඥ) යන මහත්ම මහත්මීන් විශේෂයෙන් සඳහන් කෙරේ. ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ යුරෝපා සංගම් ධූත මණ්ඩලය සහ යුරෝපා සංගමයේ මූල්‍යාධාරයන්ද අපි මෙහිදී කෘතඥතා පූර්වකව සිහිපත් කරමු.

ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මූලාරම්භ ආයතනය විසින් විශාල තාක්ෂණික හා ක්‍රියාමාර්ගික සහයෝගයක් සහ පුහුණුව සපයන ලද අතර ඊට මහාචාර්ය ආචාර්ය සැබීනා ඇල්කය(ර්) (අධ්‍යක්ෂ), ආචාර්ය ක්‍රිස්ටන් ඕල්ඩිජස්, සහ ආචාර්ය ජූලියැනා යැයෙල් මිලෝවිච්, ආචාර්ය මොනිකා පිනිල්ල්යැ, ඇලෙක්සැන්ඩ්‍රා ෆෝටැචිස්, සහ ආචාර්ය පුටු නාඩී ඇතුලත් කණ්ඩායමක්ද, රෝස් ජෙනිංග්ස් හා මායා ඊවන්ස් සන්නිවේදන සහායෙන්ද, ආචාර්ය අපර්නා ජෝන් හා අයිරිනී හට්සිමිකැලි පරිපාලනමය වශයෙන්ද දායකත්වය දැක්වීය.

# යොමුව


මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ නිල ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති මූල්‍යමය දරිද්‍රතා මිණුමට අනුපූරකයක් ලෙස ඉදිරිපත් කරනු ලබයි. බහුමාන දරිද්‍රතා දර්ශකය විසින් දුප්පත් ජනතාව හා ළමුන් විසින් අත්විඳිනු ලබන විවිධ මූල්‍යමය නොවන විහීනවීමේ මානයන් එකවිට ආවරණය කරනු ලබයි. එමගින් "කිසිවකු මග නොහරිමු" මූලධර්මයේ සංකල්පමය හා ජාතික අර්ථ දැක්වීමට අනුව "සියළු තන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම" යන පළමුවන තිරසර සංවර්ධන අරමුණ (ඉලක්කය 1.2, දර්ශකය 1.2.2) සපුරා ගනු පිණිස සාක්ෂි මත පදනම්වූ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා දරිද්‍රතාව පිළිබඳව වඩා පුළුල් චිත්‍රයක් සපයනු ලබයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඉතිහාසයේ ප්‍රථම වරට 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත යොදාගනිමින් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය නිල සංඛ්‍යාතීන් ලෙස 2019 වර්ෂය සඳහා සකස් කරනු ලැබ ඇත. මෙම වාර්තාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි ශ්‍රී ලංකාවේ දේශීය කාර්යාලය, සහ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මූලාරම්භ ආයතනය එක්ව සිදුකළ සාමූහික අභ්‍යාසයක ප්‍රතිඵලයකි.

ජාතික දරිද්‍රතාව සමග තනිපුද්ගල ළමා දරිද්‍රතා මිණුම සෘජුවම හා පූර්ණ වශයෙන් සම්බන්ධ කළ ලොව ප්‍රථම බහුමාන දරිද්‍රතා දර්ශකය ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය වන අතර එය "බ්‍රෝච(ර්) ප්‍රවේශය" ලෙසද හඳුන්වනු ලබයි. ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අධ්‍යාපනය, සෞඛ්‍යය, සහ ජීවන තත්වය යන මානයන් තුනට කාණ්ඩ කරන ලද දර්ශකයන් 10 ක් ඇතුලත් වේ. වයස අවුරුදු 5 ට අඩු ළමයින් සඳහා වන පුරෝගාමී ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයෙහිද ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයෙහි ඇති සියළුම දර්ශකයන් එලෙසම ඇතුලත්වන අතර ඌනපෝෂණය හා මුල් ළමාවිය සංවර්ධනය ආවරණය කිරීම සඳහා හතරවන මානයක්ද ඊට එක්කර ඇත.

2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ අගය 0.067 ක්වේ. එමඟින් ගම්‍ය වනුයේ ශ්‍රී ලංකාවේ දුගී ජනතාව අත්විඳිනා දුගී බව ශ්‍රී ලංකාවේ සියළුම ජනතාව බහුමාන දරිද්‍රතා දර්ශකයේ සියළුම සංරචක වලින් දුගී බවට පත්වුවහොත් ඔවුන්ට අත් විඳීමට සිදුවන දුගී බවෙන් සියයට 6.7 ක් වන බවයි. 2019 වර්ෂය සඳහා ජාතික බහුමාන ජනගහන දරිද්‍රතා අනුපාතය සියයට 16 ක් වන අතර එය නාගරික, ග්‍රාමීය සහ වතු යන අංශයන් සඳහා පිළිවෙලින් සියයට 4.4, 16.6 හා 51.3 යන අගයන් ගනී. 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ මූල්‍යමය දරිද්‍රතාව සියයට 14.3 ක් වේ. මෙම වාර්තාවේ සම්බන්ධිත තනි පුද්ගල ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය මත සහ එය වයස් කාණ්ඩය හා ස්ත්‍රී-පුරුෂ භාවය අනුව වෙන් වෙන් වශයෙන් දක්වනු ලබන නව්‍ය පරිච්ඡේදයක්ද අඩංගුවේ. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව ශ්‍රී ලංකාවේ අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමුන්ගෙන් සියයට 42.2 ක් වන ඉහළ ප්‍රතිශතයක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙයි.

අවසාන වශයෙන්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙනුවෙන් මම එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල වෙත ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන්ද, ශ්‍රී ලංකාව සඳහා ප්‍රථම වරට ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සකස් කිරීම සඳහා ලබා දුන් තාක්ෂණික සහය වෙනුවෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මූලාරම්භ ආයතනයේ අධ්‍යක්ෂිකා මහාචාර්ය ආචාර්ය සැබීනා ඇල්කය(ර්) සහ ඇයගේ කණ්ඩායම වෙතද බලවත් ස්තුතිය ප්‍රකාශ කරනු කැමැත්තෙමි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව ඵලදායි ලෙස අවම කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති සම්පාදනයේදී මෙම වාර්තාවේ සඳහන් තොරතුරු උපකාරීවනු ඇතැයි සිතමි.




**පී. එම්. පී. අනුර කුමාර**
*අධ්‍යක්ෂ ජනරාල්*
*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය, සහ සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සකස් කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි සහයෝගය සහිතව සහභාගීවීමට ලැබීම ගෞරවයකි. තිරසර සංවර්ධනයේ 2030 න්‍යාය පත්‍රයට සමගාමීව ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාව පිළිබඳව පුළුල් චිත්‍රයක් ලබා දෙනු ලබන, සහ මේ වන විට නිල සංඛ්‍යාතීන් ලෙසද පිළිගෙන ඇති මෙම දර්ශකයන් දෙකෙහි සොයා ගැනීම් මෙම වාර්තාව විසින් ඉදිරිපත් කරනු ලබයි.

ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ 2019 දත්ත මත පදනම්වන මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ දුප්පත් ජනතාව විසින් අත්විඳිනු ලබන බහුවිධ විහීනතාවයන් හෙළිදරව් කරනු ලබයි. ආසන්න වශයෙන් සෑම සය දෙනෙකුගෙන්ම එක් අයකු (16%) බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතර ඔවුන්ගේ විහීනතාවයන් ඔවුන් පදිංචි දිස්ත්‍රික්කය සහ වයස අනුව බොහෝ සෙයින් වෙනස් වේ. බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන්නන් මූල්‍යමය දරිද්‍රතාවෙන්ද පෙළීම අවශ්‍යම නොවන බවද එහිදී හෙළි විය. තවදුරටත්, සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව, අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමුන්ගෙන් සියයට 42.2 ක ප්‍රතිශතයක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතර සෑම ළමයින් තිදෙනෙක් ගෙන්ම එක් ළමයෙක් ඌනපෝෂිතව සිටීමේ පුවත තැතිගන්වනසුලු වෙයි. ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සමග සෘජුවම හා අඛණ්ඩව සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය මුල්ම නිල ළමා දරිද්‍රතා මිණුම වීමෙන් ළමා දරිද්‍රතා මිණුම් අතර එය පුරෝගාමී වෙයි. දර්ශකයන් දෙකෙහිම එක සමාන දර්ශකයන් ඇතුලත්වන අතර ඌනපෝෂණය හා මුල් ළමාවිය සංවර්ධනය ආවරණය කරනු ලබන හතරවන මානයක් සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අළුතින් එක්කර ඇත.

බහුමාන දරිද්‍රතා දර්ශකයන් ගණනය කිරීමේදී සහ මෙම වාර්තාව පිළියෙල කිරීමේදී දැක්වූ කැපවීම සහ බොහෝ වෙහෙසවී ක්‍රියා කිරීම වෙනුවෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කණ්ඩායම වෙත මෙන්ම එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි ශ්‍රී ලංකා කාර්යාලයේ කණ්ඩායම සහ එහි දකුණු ආසියානු කලාප කාර්යාලය දක්වන ලද අඛණ්ඩ සහයෝගය සහ බැඳී සිටීම වෙනුවෙන් මාගේ ස්තූතිය ඔවුන් වෙත පලකරනු කැමැත්තෙමි. එවන් දක්ෂ සගයින් සමග කටයුතු කිරීමට ලැබීම සතුටක් විය.

බලපෑම ප්‍රභල හා වේගවත් කරනු ලබන සම්පත් බෙදා දීමට මග පෙන්වීමෙන්, ප්‍රතිපත්ති සම්බන්ධීකරණයෙන් සහ බහුආංශික මැදිහත්වීම්වලට ප්‍රමුඛස්ථානය ලබාදීම මගින් දරිද්‍රතාව එහි සියළුම මානයන්ගෙන් තුරන්කර දැමීම සඳහා ගන්නාවූ රාජ්‍ය පියවරයන් සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය වැඩිදුරටත් උපකාරීවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.



**සැබීනා ඇල්කය(ර්)**
*අධ්‍යක්ෂ*
*ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මුලාරම්භ ආයතනය*

දරිද්‍රතාවට විවිධාකාරයේ මුහුණුවර පවතින අතර විශේෂයෙන්, ළමාවියේ දරිද්‍රතාවේ බලපෑම ජීවිත කාලයටම පැවතිය හැක. නිසි අහාර, රැකවරණය හා උත්තේජනය ලැබීමෙන් විහීනවීම හේතුවෙන් මුල් ළමාවිය සංවර්ධනය බරපතල ලෙස අවහිරවී එහි අහිතකර බලපෑම වැඩිහිටිවිය දක්වාද ගලායා හැක. විශේෂයෙන්, ළමා දිවියේ මුල් වසර කීපය ගැහැනු හා පිරිමි ළමුන්ගේ ගොඩනැගීම් හා බිඳවැටීම් සිදු වන අතර එම අවධිය ඔවුන්ගේ මතු සංවර්ධනය, ඔවුන්ගේ ප්‍රජාවන්ට හා දේශයන්ට සිදුකළ හැකි සමාජ හා ආර්ථික මෙහෙවර, සහ විවිධාකාරයේ ජීවිත පැවතුම් සඳහා අපේක්ෂාවන් ඇතිකර ගැනීමට ඔවුන්ගේ ඇති හැකියාව සකස් කරයි. කරුණු එසේ වන මුත්, බොහෝ රටවල, ළමා දරිද්‍රතාව මැනීම බොහෝවිට නිත්‍ය කාර්යයක් ලෙස සිදු නොකරමින්, ඉපැහැදිලිව ජාතික පුමුඛතාවක් ලෙස වැළඳ ගැනීම පමණක් සිදුකර ඇත.

පසුගිය වසර වලදී, ශ්‍රී ලංකාව ආකර්ශණීය ගමන් පථයක් මතට පිවිසෙනු ලැබ ඇත. මේ වනවිට, ශ්‍රී ලංකාව පුද්ගලයින්ගේ දරිද්‍රතාව මැනීම මූල්‍ය හිඟතාව මත පමණක් සිදු කීරීමෙන් ඔබ්බට ගොස් දරිද්‍රතාව එතුළින්ම විද්‍යාමාන වන අධ්‍යාපනය, සෞඛ්‍යය හා ජීවන තත්වය ඇතුලත් බහුවිධවූ ක්‍රියා මාර්ගයන් හඳුනාගෙන ඒ පිළිගනු ලැබ ඇත. ඊට සමගාමීව, ශ්‍රී ලංකාව මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය අදෘශ්‍යමානව පවත්වා ගනිමින් සිටි, කිසිදු ළමා දරිද්‍රතා මිණුමක් නොමැතිව සිටි තත්වයේ සිට බහුමාන ළමා දරිද්‍රතාව මැනීමේ ගමන් මාර්ගයේ පුරෝගාමීව එය ස්ථිර ලෙස ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයටද ඇතුලත් කරගැනීමේ උසස් තත්වය දක්වා ප්‍රගතිගාමීව විකාසයවී ඇත.

මෙම වාර්තාව යම් රටකට අවේණිකවූ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයක් සහ ඊට ආසන්නව සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයේ පටන් එහි සැලැසුම් කිරීමේ ක්‍රියාවලිය දක්වා වැදගත් විෂය අභ්‍යන්තර තොරතුරු රාශියක් ඉදිරිපත් කරනු ලබයි. මෙම වාර්තාව බහුමාන දරිද්‍රතා දර්ශකයන්හි ප්‍රතිපත්ති අදාලත්වයද විවිධ විහීනවීම් දරිද්‍රතාවට සිදුකරන බලපෑම කෙතරම්ද, කාහටද සහ කොතැනටද යන්න තෝරා දෙමින් එය විස්තරාත්මකව පැහැදිලි කරයි. මෙය ළමුන්ගේ සහ සමාජයේ යහපැවැත්ම වඩා පුළුල් ලෙස ඉහළ නැංවීම ඉලක්ක කරගත් ප්‍රතිපත්තිමය මැදිහත්වීම් නිවැරදිව ස්ථානගත කරගන්නේ කෙසේද යන ගැටළුව විසඳීම සඳහා ඉතා වැදගත්වන තොරතුරු රැසක් ඉදිරිපත් කරයි.

වයස අවුරුදු 5 ට අඩු සෑම ළමුන් 10 දෙනෙකුගෙන්ම 4 දෙනෙකුට වැඩි දෙනෙක්ම බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන බව, එනම් ඔවුන්ගේ යහපැවැත්මට අත්‍යාවශ්‍ය වන නිසි පෝෂණය, රැකවරණය හා උත්තේජනය යන සාධකයන්ගෙන් ඔවුන් විහීනව සිටීම කණගාටුදායක පුවතක් වේ. සෑම පුද්ගලයින් 6 දෙනෙකුගෙන්ම එක් අයකු දරිද්‍රතාවෙන් පෙළෙන බව දක්වන එහි ජාතික සාමාන්‍ය දර්ශක අගය පාදකව ජාතික බහුමාන දරිද්‍රතාවට වඩා ළමා බහුමාන දරිද්‍රතාව බොහෝ ඉහළ අගයක් වේ. මෙම හඳුණා ගැනීම, බොහෝවිට ළමයින් විසමානුපාතිකව දරිද්‍රතාවෙන් පෙළේ යන ප්‍රකට ගෝලීය රටාව යළි සනාත කරයි.

මෙම සොයාගැනීම් වලට ඉදිරියෙන්, අවසාන වශයෙන් වඩා වැදගත් හා ප්‍රශංසනීය තොරතුර වනුයේ, ශ්‍රී ලංකාව දරිද්‍රතාව මිනුම් කිරීම එහි සියළුම ආකාරයන්ගෙන් සමන්විතව සිදුකිරීම සහ එම සංඛ්‍යාතීන් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා යොදාගන්නේ කෙසේද යන්න මත මේ වන විටත් යම් සංවාදයන් ඇරඹී තිබීමයි. මෙම බලවත් උත්සාහයේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට සහාය වීමට ලැබීම සහ මෙම වැදගත් ප්‍රතිපත්ති මෙවලම එහි උපරිම විභවය දක්වා යොදා ගැනීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රජය සමග නොකඩවා කටයුතු කිරීමට ලැබීම ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ලද වරප්‍රසාදයක් කොට සලකමි.

**ක්‍රිස්ටියන් ස්කුග්**
*නියෝජිත*
*ලංකාවේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල*

# විධායක සාරාංශය

වර්ෂ 2021 දී, විවිධ අමාත්‍යාංශ සමග සමීපව උපදෙස් ලබාගනිමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව සඳහා ප්‍රථම නිල ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සංවර්ධනය කරන ලදි. ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය නිතිපතා යාවත්කාලීන කර ප්‍රකාශයට පත්කරනු ලබන, තිරසර සංවර්ධන අරමුණු ඉලක්කය 1.2.2 සඳහා වන දර්ශකය ලෙසද වාර්තා කරනු ලබන, සහ මූල්‍යමය දරිද්‍රතා මිණුමට අනුපූරකයක් ලෙස භාවිතා කරනු ලබන නිත්‍ය හා නිල බහුමාන දරිද්‍රතා මිනුම් සංඛ්‍යාතියක් වේ.

කුඩා දරුවන් විසින් අත්විඳිනු ලබන පෝෂණ හා සංජානන සංවර්ධන ඌනතාවයන් ඉදිරි ජීවිත කාලය පුරාවටම අම්හිරි ප්‍රතිවිපාක ලබාදෙන බැවින් දරිද්‍රතා මිනුම් වටා සලකා බැලිය යුතු ප්‍රධානම සංගහනයක් වනුයේ අඩු වයසැති ළමයින්වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමුන් සඳහා ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සමග හරියටම සමපාත වන හා එහි පවතින සියළුම දර්ශකයන් සහ ඊට අමතරව ඌන පෝෂණය හා මුල් ළමාවිය සංවර්ධනය සඳහා නව දර්ශකයන් ඇතුලත් ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සකස්කර ඇත. ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය යන ද්විත්වයේම දත්ත පදනම වනුයේ ගෘහවීකක ආදායම් හා වියදම් සමීක්ෂණයයි. බහුමාන දරිද්‍රතා දර්ශකයන් ඇතුලත් කිරීම සඳහා 2019 ගෘහවීකක ආදායම් හා වියදම් සමීක්ෂණය නවීකරණය කරන ලද අතර බහුමාන දරිද්‍රතා දර්ශකයන් ද්විත්වය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා එම නවීකරණ තත්වයන් ඉදිරි ගෘහවීකක ආදායම් හා වියදම් සමීක්ෂණයන් සඳහාද එසේම පවත්වාගෙන යා යුතුව ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රථම නිල ළමා දරිද්‍රතා මිනුම වන ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සමග කෙලින්ම සහ නිශ්චිතවම සම්බන්ධවේ.

බහුමාන දරිද්‍රතා දර්ශකය හුදු සංඛ්‍යාතියක් පමණක් නොවන ප්‍රතිපත්තිමය මෙවලමක් ද වෙයි. එය ඉහළ බලපෑමක් ඇති කරන ලෙස මුදල් ප්‍රතිපාදන බෙදාදීම, ස්ථානගත මැදිහත්වීම්, ප්‍රතිපත්ති සැළසුම් කිරීම සහ සම්බන්ධීකරණය, සහ දරිද්‍රතාව අධීක්ෂණය කිරීම මගින් සීමිත සම්පත් සහිතව දරිද්‍රතාව සීඝ්‍රයෙන් අවමකර ගැනීම සඳහා උචිතවන තොරතුරු සපයයි. මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ නිල හා නිත්‍ය ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ එහි සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රධාන සොයාගැනීම් තවදුරටත් ස්ථානය, වයස, සහ ඒවා ප්‍රතිපත්තීන් සමග ඇති සබඳතාවයට අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලබයි.

මෙම වාර්තාව ශ්‍රී ලංකාව බහුමාන දරිද්‍රතා දර්ශක සංවර්ධනය කිරීමට තුඩුදුන් පෙළඹවීම, ප්‍රතිපත්තිමය වශයෙන් ඉතා වැදගත් මෙම මිනුම නිර්මාණය කිරීමට අනුගමනය කළ ක්‍රියා මාර්ගය, සහ මිනුම් ක්‍රමවේදයද පැහැදිලි කරනු ලබයි. බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රතිඵල බහුමාන දරිද්‍රතාවේ තරම සහ සංයුතිය වයස, ප්‍රදේශය, දිස්ත්‍රික්කය, සහ ගෘහ මූලිකයාගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන්කර දක්වනු ලබයි. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රතිඵල අවුරුදු 4 හා ඊට අඩු (අවුරුදු 5 ට අඩු) වයසැති ළමුන් සඳහා ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට කෙලින්ම සම්බන්ධිත නමුත්, කුඩා ළමුන්ට විශේෂිත අවශ්‍යතාද හෙළිදරව් කරන තනිපුද්ගල මිණුමක් සඳහා තවදුරටත් සොයා විමසුම් කරයි.


# වැදගත් ප්‍රතිඵල

## ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය

- ආසන්න වශයෙන් ශ්‍රී ලංකාවේ සෑම හය දෙනෙකුගෙන්ම එක් අයකු (සියයට 16 ක්) බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙයි.
- වතු අංශයේ ජනගහනයෙන් අඩකට වඩා (සියයට 51.3 ක්) දරිද්‍රතාවෙන් යුතුව දිවි ගෙවන නිසා වතු අංශයේ දරිද්‍රතාව වෙත ප්‍රතිපත්තිමය අවධානය යොමු විය යුතුවේ.
- ග්‍රාමීය අංශයද දැඩි ලෙස අවධානය ලැබිය යුතු කලාපයක් බව සෑම දුප්පත් පුද්ගලයින් 10 දෙනෙකු ගෙන්ම අට දෙනෙකුම (සියයට 80.9 ක්) ග්‍රාමීය අංශයේ වීමෙන් පෙන්වයි.
- දිස්ත්‍රික්කයන් අතර දරිද්‍රතා මට්ටම් එහි අවමය වන සියයට 3.5 වාර්තා කළ කොළඹ දිස්ත්‍රික්කයේ සිට උපරිමය සියයට 44.2 ක් වාර්තා කරන නුවරඑළිය දිස්ත්‍රික්කය දක්වා සැලකිය යුතු ලෙස වෙනස් අගයයන් ගනියි. සමාන බහුමාන දරිද්‍රතා මට්ටම් ඇති දිස්ත්‍රික්ක සඳහා පවා උසස් බලපෑමක් සහ පිරිවැය ඵලදායි ප්‍රතිචාරයන් සහිත ප්‍රතිපත්ති සැළසුම් කිරීමට නම් ඒ ඒ දර්ශකය දරිද්‍රතා දර්ශකයට දරන සංයුතීන්ද සැලකිල්ලට ගත යුතුවේ.
- ශ්‍රී ලංකාවේ දුප්පත්ම වයස් කාණ්ඩය වන වයස අවුරුදු 65 හා ඊට වැඩි වයස් කාණ්ඩයේ පසුවන්නන්ගෙන් සියයට 17.9 ක්ම දරිද්‍රතාවෙන් පෙළෙන අතර ඔවුන්ගේ බහුමාන දරිද්‍රතාව සහ දරිද්‍රතාවේ තීව්‍රතාවද ඉහළම වේ.
- කඩිනම් ප්‍රතිපත්ති අවධානය ලැබිය යුතු විහීනතාවයන් වනුයේ, සෞඛ්‍ය හා මූලික පහසුකම් සඳහා කඩිනමින් ළඟා වීමට නොහැකි වීම, සහ ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන සහ ආරක්ෂිත පානීය ජලය නොමැති වීමයි.
- දිස්ත්‍රික්කය හා වයස අනුව වෙනස් වන විහීනවීම් රටාවන් අනුව ප්‍රතිපත්තීන් සහ අයවැය ප්‍රතිචාරයන්ද වෙනස්විය යුතුවේ.


## ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය


- ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව ශ්‍රී ලංකාවේ සෑම ළමුන් 10 දෙනෙකුගෙන්ම 4 දෙනෙකුට වඩා (සියයට 42.2 ක්) බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙයි.
- ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව දරිද්‍රතාවයෙන් පෙළෙන සියළුම ළමුන් තනිපුද්ගල මට්ටමේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුවද දරිද්‍රතාවයෙන් පෙළෙයි. අමතරව, එක් එක් ළමයාගේ පෝෂණයෙන් හා සංජානන සංවර්ධනයෙන් විහීනවීම් ඇතුලත් හතරවන මානයක්ද ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට එක්කර ඇත.
- අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමුන්ගෙන් තුනෙන් එකක්ම (සියයට 33.4 ක්) ළමා බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතර අඩු බර හෝ වයසට සරිලන උසෙන් අඩු හෝ වේ.
- අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමුන්ගෙන් හයෙන් එකක් (සියයට 16.4 ක්) ළමා බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතරම මුල් ළමාවිය සංවර්ධනයෙන්ද විහීනව ඇත.
- වසරකට අඩු වයසැති ළදරුවන් සහ වසර 4 ක් වයසැති ළමුන් අතරින් ආසන්න වශයෙන් අඩක්ම දුප්පත් වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ඌන පෝෂණය හේතුවෙන් වන අතර වසර 4 ක් වයසැති දුප්පත් ළමුන් සඳහා එය පෙර පාසල් යාම අහිමි වීමයි.
- ගැහැණු හා පිරිමි ළමයින්ගේ දරිද්‍රතා මට්ටම් අතර සංඛ්‍යානමය වශයෙන් සැළකිය යුතු වෙනසක් දක්නට නොමැති වීම දිරිගන්වනසුලු තත්වයක් වේ.




ආසන්න වශයෙන් ශ්‍රී ලංකාවේ සෑම හය දෙනෙකුගෙන්ම එක් අයකු (සියයට 16 ක්) **බහුමාන දරිද්‍රතාවයෙන්** පෙළෙයි.

**වතු අංශයේ** ජනගහනයෙන් අඩකට වඩා (සියයට 51.3 ක්) දරිද්‍රතාවෙන් යුතුව දිවි ගෙවන නිසාවෙන් වතු අංශයේ දරිද්‍රතාව වෙත ප්‍රතිපත්තිමය අවධානය යොමු විය යුතුවේ.




**ග්‍රාමීය අංශයද** දැඩි ලෙස අවධානය ලැබිය යුතු කලාපයක් බව සෑම දුප්පත් පුද්ගලයින් 10 දෙනෙකුගෙන් අට දෙනෙකුම (සියයට 80.9 ක්) ග්‍රාමීය අංශයේ වීමෙන් පෙන්වයි.









දිස්ත්‍රික්කයන් අතර දරිද්‍රතා මට්ටම් එහි අවමය වන සියයට 3.5 වාර්තා කළ කොළඹ දිස්ත්‍රික්කයේ සිට උපරිමය සියයට 44.2 ක් වාර්තා කරන නුවරඑළිය දිස්ත්‍රික්කය දක්වා සැලකිය යුතු ලෙස වෙනස් අගයයන් ගනී.

සමාන බහුමාන දරිද්‍රතා මට්ටම් ඇති දිස්ත්‍රික්ක සඳහා පවා උසස් බලපෑමක් සහ පිරිවැය ඵලදායි ප්‍රතිචාරයන් සහිත ප්‍රතිපත්ති සැළසුම් කිරීමට නම් ඒ ඒ දර්ශකයේ දරිද්‍රතා දර්ශක සංයුතීන්ද සැලකිල්ලට ගත යුතුවේ.





ශ්‍රී ලංකාවේ දුප්පත්ම වයස් කාණ්ඩය වන වයස අවුරුදු 65 හා ඊට වැඩි වයස් කාණ්ඩයේ පසුවන්නන්ගෙන් සියයට 17.9 ක්ම දරිද්‍රතාවෙන් පෙළෙන අතර ඔවුන්ගේ බහුමාන දරිද්‍රතාව සහ දරිද්‍රතාවේ තීව්‍රතාවද ඉහළම වේ.



කඩිනම් ප්‍රතිපත්ති අවධානය ලැබිය යුතු විහීනතාවයන් වනුයේ, **සෞඛ්‍ය හා මූලික පහසුකම් සඳහා ප්‍රවිශ්ඨවීමට නොහැකිවීම**, සහ **ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන සහ ආරක්ෂිත පානීය ජලය නොමැති වීමයි.**




දිස්ත්‍රික්කය හා වයස අනුව වෙනස් වන විහීනවීම් රටාවන් අනුව ප්‍රතිපත්තීන් සහ අයවැය ප්‍රතිචාරයන්ද වෙනස්විය යුතුවේ.




ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව ශ්‍රී ලංකාවේ සෑම ළමුන් 10 දෙනෙකුගෙන්ම 4 දෙනෙකුට වඩා (සියයට 42.2 ක්) **බහුමාන දරිද්‍රතාවයෙන්** පෙළෙයි.



ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව දරිද්‍රතාවයෙන් පෙළෙන සියළුම ළමුන් තනිපුද්ගල මට්ටමේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුවද දරිද්‍රතාවයෙන් පෙළෙයි. අමතරව, එක් එක් ළමයාගේ පෝෂණය හා සංජානන සංවර්ධනයේ විහීනවීම් ඇතුලත් හතරවන මානයක්ද ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට එකතුකර ඇත.





අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමුන්ගෙන් තුනෙන් එකක්ම (සියයට 33.4 ක්) **ළමා බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන** අතර **අඩු බරැති හෝ වයසට සරිලන උසෙන් අඩු** හෝ වේ.




අවුරුදු 4 හා ඊට අඩු වයසැත ළමුන්ගෙන් හයෙන් එකක් (සියයට 16.4 ක්) **ළමා බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන** අතරම **මුල් ළමාවිය සංවර්ධනයෙන්ද විහීනව** ඇත.



වසරකට අඩු වයසැති ළදරුවන් සහ වසර 4 ක් වයසැති ළමුන් අතරින් ආසන්න වශයෙන් අඩක්ම **දුප්පත්** වී ඇත්තේ ප්‍රධාන වශයෙන් **ඌන පෝෂණය** හේතුවෙන් වන අතර වසර 4 ක් වයසැති දුප්පත් ළමුන් සඳහා එය **පෙර පාසල් යාම අහිමි වීමයි.**



**ගැහැණු හා පිරිමි ළමයින්ගේ දරිද්‍රතා මට්ටම්** අතර සංඛ්‍යාණමය වශයෙන් සැළකිය යුතු වෙනසක් නොමැතිවීම දිරිගන්වනසුලු තත්වයක් වේ.



# 1

# හැඳින්වීම

## 1.1. ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය අරමුණු

දරිද්‍රතාව පිටුදැකීම ප්‍රධානතම ගෝලීය අභියෝගය වන අතර තිරසර සංවර්ධනය සඳහා අත්හල නොහැකි අවශ්‍යතාවයකි. ප්‍රථම තිරසර සංවර්ධන අරමුණ 'සියළු තන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම' ඉලක්ක කරයි. සෑම ආකාරයකම දුගීබව මැඩ පැවැත්වීම ශ්‍රී ලංකා රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයටද එහි මධ්‍ය අරමුණක් ලෙස ඇතුලත් කර ඇත. ශ්‍රී ලංකාව නිදහස ලද 1948 සිට, පිළිවෙළින් පැවති රජයන් දරිද්‍රතාව අවම කිරීම සඳහා නොයෙක් ප්‍රතිපත්තීන්, වැඩසටහන්, සහ ක්‍රමෝපායන් හඳුන්වාදීම සහ ක්‍රියාවට නැංවීම සිදුකර ඇත. අද එහි ළමා මරණ අනුපාතය කලාපය තුළ වාර්තාවන අවම අගයක් ගන්නා අතර, ආරක්ෂාකාරී ප්‍රසූත උවටැන් ළඟාකර ගැනීමේ හැකියාව, පූර්ණ මව්කිරි ලබාදීම, සහ ප්‍රතිශක්තිකරණය සඳහා වාර්තා කරන අගයයන්ද ඒවාහි සර්ව සාධාරණ මට්ටම්වලට ආසන්නව පවතී. ජල හා සනීපාරක්ෂක පහසුකම්ද වැඩි දියුණු වී ඇති අතර ගැහැණු සහ පිරිමි අසමානතාවයකින් තොරව, ආසන්න වශයෙන් සෑම ළමයෙක්ම පෙර පාසල් පහසුකම් අත්විඳී. පසුගිය දශක කීපය පුරා (ලෝක කෝවිඩ්-19 වසංගතයට පෙර) පැවති අචල ආර්ථික වර්ධන ප්‍රගතිය සිත්ගන්නා දරිද්‍රතා පිටු දැකීමකට සහ මානව සංවර්ධනයකට ඉඩ සලස්වා ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2002 වසරේ සිට 'මූලික අවශ්‍යතා සඳහා වියදම' යන ක්‍රමවේදය යොදා ගනිමින් මූල්‍යමය දරිද්‍රතාව මනිනු ලබයි. මූල්‍යමය මිනුම ලබා ගැනීම ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය විසින් එක්රැස් කරනු ලබන තොරතුරු පාදක කරගෙන සිදුකරනු ලබයි. එහි 2012/13 සමීක්ෂණය පදනම් කරගෙන යාවත්කාලීන කළ දරිද්‍රතා රේඛාවට අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව 2002 වසරේ වාර්තා කළ සියයට 46.8 සිට 2019[1] වසර වනවිට සියයට 14.3 දක්වා චමත්කාරජනක ලෙස අඩුවී ඇත. කෙසේ වෙතත්, දරිද්‍රතාවේ එම සමස්ථ ජාතික මට්ටමේ පහළ යාම අතරම සමහර දිස්ත්‍රික්කයන්හි වර්ධනයේ විෂම බව සහ කුඩා ප්‍රමාණයේ දරිද්‍රතා කලාපයන් පවතී.

දරිද්‍රතාව යනු තවදුරටත් අදායම හෝ පරිභෝජන වියදමේ හෝ පිළිබිඹුවක් මගින් පමණක් වටහාගත නොහැකි, පුළුල් හා බහුවිධ සංසිද්ධියක් වෙයි. එනිසා, දුප්පත් ජනතාව ලබන අත්දැකීම් අධ්‍යාපනය, සෞඛ්‍යය, සහ ජීවන තත්වය වැනි බොහෝ මානයන් අනුබද්ධයෙන් වටහා ගැනීම අත්‍යාවශ්‍ය වේ. දරිද්‍රතාව සහ විෂමතාව මැනීම සහ එය සමාජයෙන් තුරන් කිරීමේ අරමුණට ළඟාවීම සඳහාද මෙම තොරතුරු අත්‍යාවශ්‍ය වේ. මෙහිදී, දරිද්‍රතාව ඵලදායි හා කාර්යක්ෂම අයුරින් අවමකර ගැනීමට අවශ්‍යවන ජාතික මට්ටමේ ප්‍රතිපත්තිමය සුසංයෝගය සෑබෑ කරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රතිපත්ති රාමුවක් තනා ගැනීම ඉතා වැදගත් වෙයි. එක්රැස්ව, විවිධ හරස් කැපුම් මත රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීම සිදුකළ හැකි නිසා පුළුල් පාර්ශවකරුවන් පරාසයක් සම්බන්ධ කරගැනීමද අත්‍යාවශ්‍ය කරුණක් වේ.

ඒ අනුව, පරිභෝජන එළැඹුමට අමතරව බහුමාන එළැඹුම භාවිතයෙන්ද කලින් කලට දරිද්‍රතාව මිණුම් කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තීරණය කර ඇත. මෙම ප්‍රකාශණය දරිද්‍රතාවේ බහුමාණ මිණුම් ඉදිරිපත් කරනු ලබයි. මෙහිදි ගෝලීය වශයෙන් පිළිග නු ලැබ ඇති ඇල්කයර්) ෆොස්ටර් ක්‍රමවේදය යොදාගනු ලබයි. ඇල්කයර්) ෆොස්ටර් ක්‍රමවේදය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මුලාරම්භ ආයතනය විසින් උග්‍ර දරිද්‍රතාව මැනීම සඳහා දියුණු වෙමින් පවතින රටවල් සියයකට[2] අධික සංඛ්‍යාවක් ආවරණය කරමින් 2010 වසරේ සිට යොදා ගනු ලබයි. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සහ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා හා මානව සංවර්ධන මුලාරම්භ ආයතනය සමග සහයෝගයෙන් සහ 2019 වසරේදී පවත්වන ලද ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය විසින් එක්රැස් කරනු ලැබූ තොරතුරු භාවිතා කර ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම වරට ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ අවුරුදු 5 ට වඩා අඩු වයසැති ළමයින් සඳහා ඊට සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයද සම්පාදනය කරන ලදි.

1 නිල දරිද්‍රතා රේඛාව 2002 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත පදනම්ව 2004 දී ප්‍රථම වරට ප්‍රකාශ කෙරිනි. ඊට අනුව ජනගහන දරිද්‍රතාව 2002 සිට 2019 දක්වා සියයට 22.7 සිට 3.2 දක්වා අඩු විය. හොඳම අන්තර් ජාතික භාවිතාවන්ට අනුව 2016 දී නිල දරිද්‍රතා රේඛාව 2012/13 සමීක්ෂණ දත්ත මත සංශෝධනය කර 2019 දී ප්‍රකාශයට පත් කරන ලදි.

2 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මුලාරම්භ ආයතනය බලන්න.

මේ වනතුරුම, ශ්‍රී ලංකාව ළමයින් සඳහා වෙනම දරිද්‍රතා රේඛාවක් යොදා ගෙන නොතිබිනි. ළමා දරිද්‍රතා මිනුම් අතර පුරෝගාමී අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමුන් සඳහා වන තනි පුද්ගල ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය හා සමාන දර්ශකයන් ඇතුලත්වන අතර ඌනපෝෂණයෙන් හා මුල් ළමාවිය සංවර්ධනයෙන් වන විහීනවීම් ආවරණය කිරීම සඳහා හතරවන මානයක් ඊට අළුතින් එක්කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය ළමුන්ගේ දරිද්‍රතාව මිනීම සෘජුවම හා සම්පූර්ණයෙන්ම ඊට සම්බන්ධ කළ ලෝකයේ ප්‍රථම ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය බවට පත් වෙයි. මෙම සම්බන්ධයට අනුව ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය මගින් දරිද්‍රතාවෙන් පෙළෙන බවට හඳුනාගනු ලැබෙන සියළුම ළමුන් ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුවද දරිද්‍රතාවෙන් පෙළෙයි.

සමහර ළමුන් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය මගින් දුප්පත් ලෙස හඳුනා ගත නොහැකි ආකාරයේ ගෘහවීකක මට්ටමේ විහීනතාවයන්ට එකවිට මුහුණ දෙමින් සිටියි. අමතරව, ළමයින් සඳහා විශේෂිතව හඳුනා ගනු ලැබූ විහීනතාවයන්ද සලකා බැලීමෙන් පසුව නිසි පෝෂණයෙන් හෝ මුල් ළමාවිය සංවර්ධනයෙන් හෝ එම ද්විත්වයෙන්ම හෝ විහීනව සිටින ළමුන් සත්‍ය වශයෙන්ම දරිද්‍රතාවෙන් පෙළෙන ළමුන් ලෙස ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය විසින් හඳුනා ගනු ලබයි. ඒ අනුව ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට විනිවිද පෙනෙන ආකාරයට තොරතුරු එක්කරන අතර එය ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට සම්බන්ධ වූ නිල සංඛ්‍යාතියක් වෙයි. මෙම දර්ශකයන් ද්විත්වය ශ්‍රී ලංකාවේ ජාතික දරිද්‍රතාව මැඩ පැවැත්වීමට සහ ඉන් ඔබ්බට ගොස් ළමා දරිද්‍රතාව තුරන් කිරීමද ඉලක්ක කරගත් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි.

## 1.2. තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් වාර්තා කිරීම

තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක දර්ශකාංක 1.2.2, එනම්, "ජාතික අර්ථ දැක්වීම් වලට අනුව සියළුම ආකාරයේ දරිද්‍රතාවන් ගෙන් පෙළෙන ගැහැණු, පිරිමි, සහ ළමුන් ගේ සමානුපාතිකය" සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය එහි පැතිරි ප්‍රමාණය, සහ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ, සහ වැඩිහිටි පිරිමි, ගැහැණු සහ සියළුම වයස් වල ළමුන් සඳහා වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලබයි. එයට සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයද තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක දර්ශකාංක 1.2.2 තුළ වාර්තා කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය වෙනත් ජන කණ්ඩායම් සඳහාද වෙන් වෙන් වශයෙන් දර්ශකයන් සැපයුවද එම පැතිකඩයන් එවා වාර්තා කරන අවස්ථාවන්හිදී ගෝලීය තිරසර සංවර්ධන අරමුණු දත්ත පාදකයන්ට ඇතුලත් කළ නොහැකි වේ. දර්ශකයේ දරිද්‍රතා සංයුතිය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඒවාහි එලකිරීමද සිදුකළ නොහැක. එමනිසා මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිළිබඳ වඩා විස්තරාත්මක රූපයන් සපයන අතර, තිරසාර සංවර්ධන අරමුණු ප්‍රාදේශීයකරණය (තිරසර සංවර්ධන අරමුණු අන්තර් සම්බන්ධිතව ඉදිරියට ගෙනයාම සඳහා ස්ථානීය උපායන්), හෝ තිරසර සංවර්ධන අරමුණු න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයාම සඳහා ඒකාබද්ධ ප්‍රතිපත්තීන් ඉදිරියට ගෙනයාමට බලාපොරොත්තු වන සැවොම මෙහි දක්වන තොරතුරු පදනම භාවිතා කිරීමට මෙයින් දිරිගන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය තුළ ඇති සමහරක් දර්ශකයන් වෙන් වෙන් වශයෙන් ඒ අයුරින්ම තිරසර සංවර්ධන අරමුණු සඳහා දර්ශකයන් ලෙස වාර්තා කරනු ලබයි. ඊට උදාහරණ ලෙස 'පාසල් කාලය සහ පාසල් යාම' ආශ්‍රිත 4 වන අරමුණ, 'පානීය ජලය' ආශ්‍රිත 6 වන අරමුණ, 'සනීපාරක්ෂාව' ආශ්‍රිත 11 වන අරමුණ, සහ 'නිදන්ගත රෝග සහ සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය' ආශ්‍රිත 3 වන අරමුණ දැක්විය හැක. ඒ අනුව, ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය පහළ යන විට තිරසර සංවර්ධන අරමුණු දර්ශකය 1.2.2 ද පහළ යන අතර ඉහත 3, 4, 6. සහ 11 යන අරමුණු දර්ශකයන්ද පහළ යයි.

මූල්‍යමය සහ බහුමාන දරිද්‍රතාව අවම කිරීම සඳහා සිදුකරන කාර්යයන්හි විවිධ පැතිකඩයන් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාව දරන උත්සාහයන්, නිරූපිත වර්ෂ වලදී උසස් මට්ටමේ ආර්ථික හා දේශපාලන වේදිකාවන්හිදී ඉදිරිපත් කරනු ලබන තත් කාර්ය ජාතික විමසුම් තුළින්ද එළි දක්වනු ඇත.

## 1.3. වෙනත් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක

මෙම ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය ප්‍රචාරයට පැමිණවීම තුළින් සිය ජාතික දත්ත, ප්‍රතිපත්ති ප්‍රමුඛතාවන් සහ දුප්පත් ජනතාවගේ සහ දුගී ජන කොටස්වල අපේක්ෂාවන් හොඳින්ම පිළිබිඹු වනසේ ස්ථිර නිල බහුමාන දරිද්‍රතා දර්ශකයන් නිර්මාණය කරගත් තවත් බොහෝ රටවල් අතරට ශ්‍රී ලංකාවද එක්වෙයි.

ශ්‍රී ලංකාව සියළුම ආකාරයෙන් පවතින දරිද්‍රතාවන් බලසම්පන්න ලෙස අවම කිරීම සඳහා බහුමාන දරිද්‍රතා දර්ශකයන් නිර්මාණය කිරීමේ සහ භාවිතා කිරීමේ හොඳ පුරුදු බෙදාහදා ගන්නා රටවල් 60 කට සහ අන්තර් ජාතික ආයතන 20 කට අධික සංඛ්‍යාවක් සහිත දකුණු-දකුණු ජාලයක් වන බහුමාන දරිද්‍රතා සමානයින්ගේ ජාලය (www.mppn.org) ට සහභාගී වෙයි.

එම නිසා, බහුමාන දරිද්‍රතාව සඳහා ප්‍රාමාණික සංකල්පයක් සකස් කිරීම, බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය තුළට නව ස්ථාවර සමීක්ෂණ සංරචකයන් නිර්මාණය කිරීම, බහුමාන දරිද්‍රතා දර්ශකය ඇස්තමේන්තු කිරීම සහ විශ්ලේෂණය (මෙම වාර්තාවේ සිදුකර ඇති පරිදි) සහ ඵලදායි මැදිහත්වීම් යොමු කිරීම සඳහා එහි ප්‍රතිඵල යොදා ගැනීම ආදිය පිළිබඳව සිය අත්දැකීම් වලින් ඉගෙනීමට කැමති රටවලට සහය වීම සඳහා ශ්‍රී ලංකාව සූදානම්ව සිටියි.

## 1.4. ඇල්කයර්-ෆොස්ටර් ක්‍රමය

මෙම ඡේදය ඇල්කයර්-ෆොස්ටර් ක්‍රමය[3] පිළිබඳව දළ, සංක්ෂිප්ත විශලේෂණයක් ඉදිරිපත් කරයි. මෙම ක්‍රමය බහුමාන දරිද්‍රතාව මිනීම සඳහා ලෝකයේ බොහෝ රටවලට පොදුවන රාමුවකි. එය ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ගණනය කිරීම සඳහාද යොදාගත් ක්‍රමය වේ.

ඇල්කයර්-ෆොස්ටර් ක්‍රමය පාදකවී ඇත්තේ කෙනකුගේ ජීවිතයට එකවිට සෘණාත්මක ලෙස බලපෑම් කරන විහීනවීම් සංඛ්‍යාව ගණන් ගැනීම මතයි. මෙය බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් හඳුනා ගැනීමට ඉවහල් වන ලෙස ඒ ඒ පුද්ගලයින් සඳහා ඒ ඒ විහීනවීම් පැතිකඩයන් ගොඩනංවා ගැනීමට ඉඩ සලසයි. ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ අගය වනුයේ බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ දරිද්‍රතාවයෙහි ඇති තීව්‍රතාවයේ සංයුතියක් වේ. ඇල්කයර්-ෆොස්ටර් ක්‍රමය එහි විශ්ලේෂණය තුළ: හඳුනා ගැනීම සහ ඒකරාශී කිරීම යන ප්‍රධාන පියවරවල් දෙකක් අනුගමනය කරයි. එහිදී එක් එක් පියවරයන් අනුක්‍රමිකව ක්‍රියාවට නංවනු ලබයි. දරිද්‍රතාවෙන් පෙළෙන්නන් හඳුනා ගැනීම පැහැදිලි කිරීම සඳහා වන එක් විධියක් වනුයේ හඳුනා ගැනීමෙන් අවසන් වන එහි මිණුම නිර්මාණය කිරීමේ ආරම්භක පියවරයන් පරීක්ෂා කිරීමයි.

### හඳුනා ගැනීම

- → බහුමාන දරිද්‍රතාව සමන්විතවන දර්ශකයන් සමූහය අර්ථ දක්වන්න.
- → විහීනකමින් තොර වීමට අවශ්‍යවන ප්‍රමාණය දැක්වෙන විහීනකමේ සීමාව සකස් කරන්න.
- → විහීනකමේ සීමාව මත එක් එක් දර්ශකයන් තුළ විහීනව සිටිනා පුද්ගලයින් හඳුනා ගන්න.
- → එක් එක් දර්ශකයේ ඇති වැදගත්කම අනුව ප්‍රතිශතයන්හි එකතුව 100 වන ලෙස බර තැබීම සකස් කරන්න.
- → ඔහු හෝ ඇය අත්දකිනා විහීනතාවයන්ගේ බර තබන ලද අගයයන් එකට එකතු කර එක් එක් දරශකය සඳහා ඇති විහීනවීමේ ලකුණු සංඛ්‍යාව ගණනය කරන්න.
- → විහීනවීමේ ලකුණු සංඛ්‍යාවට අදාළ වන බහුමාන දරිද්‍රතාවේ සීමාව නිර්ණය කරන්න.
- → ඔහුගේ හෝ ඇයගේ විහීනවීමේ ලකුණු සංඛ්‍යාව බහුමාන දරිද්‍රතාවේ සීමාවට සමාන හෝ විශාල වන්නේ නම් ඔහු හෝ ඇය බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන්නකු බවට හඳුනා ගන්න.

3 ඇල්කයර් සහ ෆොස්ටර් 2011, ඇල්කයර්, ෆොස්ටර්, සෙත්, සැන්ටොස්, රෝචි සහ බැලොන් 2015, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මූලාරම්භ ආයතනය 2019 බලන්න



ඒ අනුව මූලික වශයෙන්, එක් එක් පුද්ගලයා එක් එක් දර්ශකය යටතේ විහීනතාවයට පත්වී ඇති හෝ නැති බව සටහන් වේ. මෙය එක් එක් දර්ශකය සඳහා හඳුනාගත් විහීනතා සීමාව සමග එක් එක් පුද්ගලයාගේ එහි සිද්ධිය සැසඳීමෙන් සිදු කරනු ලබයි. මෙයින් සෑම පුද්ගලයාටම අදාල දර්ශකය යටතේ විහීනතාවයට පත්වී ඇති නම් 1 හෝ එසේ නැති නම් 0 ලෙස සෑම දර්ශකයක් සඳහාම සටහන් වන ද්වීමය විචල්‍ය කට්ටලය බැගින් ලැබේ.

මෙම ද්වීමය විචල්‍ය කට්ටලය ගණනය කිරීමෙන් පසුව සෑම පුද්ගලයෙක් සඳහාම ඔහු අත්දකිනා විහීනවීම් සමානුපාතය බහුමාන දරිද්‍රතා දර්ශකයේ  ව්‍යුහය තුළ එක් එක් දර්ශකයේ ඇති සාපේක්ෂ වැදගත්කම සලකා ලබා දෙනු ලැබූ බර තැබීම් සහිතව පෙන්වනු ලබන විහීනවීමේ ලකුණු ප්‍රමාණයක් ලබා දෙනු ලබයි. විහීනවීමේ ලකුණු ප්‍රමාණය 0 (පුද්ගලයා කිසිම බර තබනු ලැබූ විහීනතාවයක් අත් නොවිඳනා බව පෙන්වන) සිට 1 (පුද්ගලයා බර තබනු ලැබූ සෑම විහීනතාවයක්ම අත් විඳිනා බව පෙන්වන) දක්වා වන පරාසයේ අගයන් ගන්නා ලෙස අර්ථ දක්වා ඇත.

බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් හඳුනා ගැනීමට විහීනවීමේ ලකුණු ප්‍රමාණය දරිද්‍රතා සීමාවක් හෝ k-අගය සමග සසඳනු ලැබේ. අත්දකිනා බර තබනු ලැබූ දර්ශකයන් ගොනුවක් මගින් නිරූපිත විහීනවීම් ප්‍රමාණය මෙම දරිද්‍රතා සීමාවට සමාන හෝ විශාලවන සියළුම පුද්ගලයින් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් ලෙස හඳුනාගනු ලැබේ.

## ඒකරාශී කිරීම

දුප්පත් ලෙස හඳුනාගත් ලැබූ පුද්ගලයින්ගේ තොරතුරු දරිද්‍රතා මිනුම වන බහුමාන දරිද්‍රතා දර්ශකය තුළට, සහ සම්බන්ධිත සහ අනුරූප ආංශික දර්ශකයන් වන ජනගහන දරිද්‍රතා අනුපාතය හෝ පැතිරී ප්‍රමාණය, සහ දරිද්‍රතාවේ තීව්‍රතාව තුළටද ඒකරාශි කරනු ලැබේ.

**ජනගහන දරිද්‍රතා අනුපාතය (H)** හෝ බහුමාන දරිද්‍රතා දර්ශකයේ පැතිරී ප්‍රමාණය යනු බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙනා ජනගහන සමානුපාතය වේ.

**දරිද්‍රතා තීව්‍රතාව (A)** බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙනා පුද්ගලයින්ගේ සාමාන්‍ය විහීනතාව මත බර තබන ලද දර්ශකයන්හි සමානුපාතය පිළිබිඹු කරයි.

**බහුමාන දරිද්‍රතා දර්ශකය (MPI)** යනු ඉහත H සහ A හි ගුණිතයයි.

$$MPI = H \times A$$

බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් හඳුනා ගැනීමෙන් පසුව බහුමාන ජනගහන දරිද්‍රතා අනුපාතය දරිද්‍රතා තීව්‍රතාවෙන් ගුණකිරීම මගින් බහුමාන දරිද්‍රතා දර්ශකය ගණනය කරනු ලබයි. බහුමාන දරිද්‍රතා දර්ශකය දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් අත්විඳිනා බර තබන ලද විහීනතාවයන්ගේ එකතුව සියළුම පුද්ගලයින් අත්විඳිය හැකි සියළුම විහීනතාවයන්ගෙන් බෙදීමෙන් ලැබෙනා අගයට සමානවේ. බහුමාන දරිද්‍රතා දර්ශකය, එහි විශේෂ ලාක්ෂණිකයන් අතර, උප සමූහ විසංයෝජනය කිරීමේ හැකියාව ඇතුළු දරිද්‍රතාව හා බැඳි බොහෝ ස්වසිද්ධීන් සපුරාලනු ලබයි (ඇල්කයර් සහ ෆොස්ටර් 2011). බහුමාන දරිද්‍රතා දර්ශකය දරිද්‍රතා පැතිරී ප්‍රමාණය සහ/හෝ තීව්‍රතාවේ වෙනස්වීම් සඳහා වගවීම නිසා එය දරිද්‍රතාව සඳහා නිල සංඛ්‍යාතිය වේ. එය දුප්පත්ම ජන කණ්ඩායම් අතර ප්‍රගතිය දෘශ්‍යමාන කිරීමෙන් 'කිසිවකු මග නොහැරීම' යන තිරසර සංවර්ධන අරමුණද දිරි ගන්වයි.

බහුමාන දරිද්‍රතා දර්ශකය දරිද්‍රතාවෙන් පෙළෙන සහ යම් දර්ශකයකින් විහීන බවට හඳුනාගත් පුද්ගලයින්ගේ ප්‍රතිශතය දක්වන වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්ගේ බර තබන ලද එකතුව ලෙසද සමාන ලෙසම ගණනය කළහැකි බව මෙහිදී සටහන් කිරීම වැදගත් වේ. වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන් දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් වැඩිම විහීනතාව අත්විඳින දර්ශකය සමග දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් සංඛ්‍යාවද පෙන්වීම අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඉතා ප්‍රයෝජනවත් වෙයි. අමතර වශයෙන්, දරිද්‍රතාවට වැඩිම දායකත්වය දක්වන දර්ශකයන් (ඒවාහි බර තැබීම සලකා) හඳුනා ගැනීම සඳහා බහුමාන දරිද්‍රතා දර්ශකයට එක් එක් දර්ශකයේ ඇති බර තබන ලද දායකත්වය ගණනය කිරීමද ප්‍රයෝජනවත් වේ. බහුමාන දරිද්‍රතාවේ සංයුතිය පිළිබඳව විස්තරාත්මක තොරතුරු සපයන මෙම මානමය විභේදන අංගය දරිද්‍රතා විශ්ලේෂණයට අමතර ප්‍රතිපත්ති අදාලත්වයක් එක් කරයි.

බහුමාන දරිද්‍රතා දර්ශකය කලින් කලට සිදුවන වෙනස්වීම් අධීක්ෂණය කිරීම සඳහා වන නිශ්චිත මෙවලමක් වේ. සාර්ථක ප්‍රතිපත්තීන් නිසා කිසියම් විහීනවීමක් අඩුවූ සැනින්ම බහුමාන දරිද්‍රතා දර්ශකයද පහළ යනු ඇත. එම විහීනවීමට ඇති බර තැබීම ඉහළ නම් බහුමාන දරිද්‍රතා දර්ශකය වඩා වැඩි අගයකින් පහළ යනු ඇත.

මෙම ක්‍රමය යොදා ගැනීමෙන්, ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය විසින් දුප්පත් ජනයා එකවිට අත්විඳිනු ලබන විහීනවීම් පිළිබිඹු කරනු හැකි වෙයි. මීළඟ ඡේදයේදී අදාලත්වය සහ දත්ත ඇති බව පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් සමග ශ්‍රී ලංකාව සඳහා බහුමාන දරිද්‍රතා දර්ශකය සංකල්පගත කළ ආකාරය පැහැදිලි කරනු ලබයි.

# 2

# ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය



## 2.1. ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ සැලැස්ම

ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය දරිද්‍රතාව පිටුදැකීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වන ජාතික අවශ්‍යතාව පිළිබිඹුවන ආකාරයට ගොඩනංවා ඇත. මෙම දරිද්‍රතා මිණුමේ සැලැස්ම ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මුලාරම්භ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් සකස් කරන ලද ගෝලීය බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව සකස් කර ඇත.

### 2.1.1. ප්‍රතිපත්ති සැලැස්ම සහ උපදේශන ක්‍රියාවලිය

ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය නිර්මාණය කර ඇත්තේ දරිද්‍රතාව අවම කිරීම සඳහා වගකිව යුතු තීරණාත්මක සාධක හඳුනා ගැනීම සහ පවතින දරිද්‍රතාව මැඩ පැවැත්වීමේ ක්‍රමෝපායන් ඇගයීම සහ ඒවාට සහයවීම අරමුණු කරගෙනයි. මෙම අරමුණ වඩා කාර්යක්ෂමව ඉටු කරගැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි ශ්‍රී ලංකා කාර්යාලය සහ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මුලාරම්භ ආයතනය සමග එක්ව සාරථක පියවර රාශියක් ගෙන ඇත.
විශේෂ වශයෙන්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව:

1. දේශීය සංදර්භය තුළ වඩාත්ම සුදුසු දරිද්‍රතා මානයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන රාශියක සහභාගිත්වය සහිතව වටමේස සාකච්ඡා පවත්වන ලදි.
2. ළමා දරිද්‍රතාවට විශේෂයෙන් සම්බන්ධිත අමතර තොරතුරු රැස් කිරීම සඳහා ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ ප්‍රශ්නාවලියට නව ඒකකයක් ඇතුලත් කරගන්නා ලදි.
3. ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ඇස්තමේන්තු කිරීම සඳහා වඩාත්ම සුදුසු ක්‍රමය කුමක්ද යන්න සාකච්ඡා කිරීමට සමුළුවක් පවත්වන ලද අතර වෙනත් රටවල උදාහරණ එහිදී පෙන්වන ලදි.
4. දරිද්‍රතා දර්ශකයන් විශ්ලේෂණය කරනු ලබන නිලධාරීන්ගේ තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදි.
5. දර්ශකයන් සකස් කිරීමේදී අන්තර් ජාතික විශේෂඥයින් සමග නොකඩවා කටයුතු කරන ලදි.
6. ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සම්බන්ධ අවසාන තීරණ ගැනීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමග පාර්ශවකාර රැස්වීම් කීපයක් පවත්වන ලදි.

### 2.1.2. දත්ත


ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත භාවිතා කර සකස් කර ඇත. 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සියළුම දිස්ත්‍රික්ක නියෝජන කරන පරිදි තෝරාගත් නිවාස ඒකක 19,911 ක් මගින් මුළු දිවයිනම ආවරණය කරන ලදි. සමීක්ෂණයේදී තෝරාගත් නිවාස ඒකකයන් තුළ ඇති සියළුම ගෘහඒකකයන් වලින් තොරතුරු එක්රැස් කරනු ලබයි. එහි නියැදිය පියවර දෙකේ ස්තෘත නියැදීමක් වේ. පළමු පියවරේදී 2011 ජන හා නිවාස සංගණනය සඳහා දිවයිනම ආවරණය වන පරිදි තනන ලද සංගණන කාණ්ඩයන් යොදා ගනිමින් ප්‍රාථමික නියැදි ඒකක තෝරා ගන්නා අතර දෙවැනි පියවරේදී ද්විතීයික හෝ අවසාන නියැදි ඒකක ලෙස ඒවා තුළින් නිවාස ඒකක තෝරා ගනියි. මෙම නියැදියේ ප්‍රමාණය දිවයිනේ දිස්ත්‍රික් මට්ටම දක්වා සංඛ්‍යාන විද්‍යාත්මකව විශ්වසනීය ඇස්තමේන්තු ලබා දීමට බෙහෙවින් ප්‍රමාණවත් වේ.

## 2.1.3. ව්‍යුහය

ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ව්‍යුහය ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මුලාරම්භ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් සංවර්ධනය කල ගෝලීය බහුමාන දරිද්‍රතා දර්ශකයේ අයුරින්ම ශ්‍රී ලංකාවේ සන්දර්භයට අදාළව යොදා ගන්නා ලදි (1 වන රූපය).

**දර්ශක සහ මානයන්:** ඉතාමත් සුපරීක්ෂාකාරීව තෝරා ගන්නා ලද දර්ශකයන් සමූහයක් බහුමාන දරිද්‍රතා දර්ශකයේ ඇතුලත්ව ඇත. එක් එක් ගෘහඒකකය මෙම දර්ශකයන් තුළින් අත්විඳිනු ලබන විහීනතාවයන්ගේ පැතිකඩයන් භාවිතයෙන් බහුමාන දරිද්‍රතා දර්ශකය ගොඩනංවා ඇත. ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය සතුව මානයන් තුනකට කාණ්ඩ කළ දර්ශකයන් 10 ක් පවතී (විස්තර සඳහා 1 වන රූපය සහ 1 වන වගුව බලන්න).

**1 රූපය:** ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ව්‍යුහය



**1 වගුව:** ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකයේ මාන, දර්ශක, සහ බර තැබීම්

| ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය | | | |
|---|---|---|---|
| මානය | දර්ශකය | විහිනවීමේ සීමාව: ගෘහඒකකයක් හා එහි සියළුම සාමාජිකයින් විහීන තත්වයට පත්වීමට නම්, ගෘහඒකකය/ ඒකකයේ/ ඒකකයට ..... | බර තැබීම |
| අධ්‍යාපනය (1/3) | පාසල් කාලය* | ඔවුන් පාසල් යන කාලයේ පැවති අනිවාර්ය මට්ටමට (වයස අනුව වෙනස් වන) අඩු පාසල් මට්ටමක් සහිත හෝ කිසිදා පාසල් නොගිය, හෝ විශේෂ අධ්‍යාපනය ලබන වයස අවුරුදු 17 හෝ ඊට වැඩි එක් සාමාජිකයෙක් හෝ සිටියි | 1/12 |
| | පාසල් යාම | පාසල් යන වයසේ (අවුරුදු 5 - 16) සිටින පාසල් නොයන එක් ළමයෙකු හෝ සිටියි | 1/4 |
| සෞඛ්‍යය (1/3) | නිදන්ගත රෝග | එක් මසක් හෝ වැඩි කාලයක් ඔවුන්ගේ සාමාන්‍ය කටයුතු හෝ රැකියාව නතර කිරීමට තරම්වූ නිදන්ගත රෝගයකින් පීඩා විඳින එක් සාමාජිකයෙක් හෝ සිටියි | 1/6 |
| | සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | සෞඛ්‍ය පහසුකම් සඳහා ළඟා වීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගතවේ | 1/6 |
| ජීවන තත්වය (1/3) | නිවාස† | නිවසේ බිත්ති, ගෙබිම හෝ වහල සඳහා ස්ථිර නොවන ද්‍රව්‍ය යොදා ගෙන ඇත | 1/18 |
| | සනීපාරක්ෂාව‡ | වැඩි දියුණු නොකළ පහසුකම් හෝ වෙනත් ගෘහඒකකයක් සමග හවුලේ භාවිතා කරන | 1/18 |
| | පානීය ජලය§ | ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් නොමැති, හෝ ඒ සපයා ගැනීම සඳහා විනාඩි 15 කට සමාන හෝ වැඩි කාලයක් ගතවන හෝ දුර කි. මී. 1 කට වැඩි, හෝ පසුගිය මාසයේ පානීය ජලය ප්‍රමාණවත් නොවූ, හෝ පානීය ජලයේ තත්වය වැඩි දියුණු නොකළ තත්වයේ ඇති | 1/18 |
| | ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | ආහාර පිසීම සඳහා දර, භූමිතෙල්, ලී කුඩු හෝ දහයියා යොදා ගනියි | 1/18 |
| | වත්කම් | රූපවාහිනී, සෝදන යන්ත්‍ර, ශීතකරන, පරිගණක, යතුරු පැදි, ත්‍රී රෝද රථ, කාර්, වෑන්, බස්, ලොරි ආදියෙන් එකක් වත් අහිමි සහ ඉඩම්, සත්වපාලන, කෘෂිකාර්මික/ ධීවර උපාංග (ට්‍රැක්ටර්, පාහින යන්ත්‍ර, සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර, ධීවර බෝට්ටු, මාළු දැල් ආදියෙන් එකකට වඩා වැඩියෙන් නොමැති | 1/18 |
| | මූලික පහසුකම් | ආසන්නම බස් නැවතුමට ළඟා වීමට විනාඩි 15 කට සමාන හෝ වැඩි කාලයක් හෝ ප්‍රාථමික හෝ ද්විතීයික පාසලට ළඟා වීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගතවන | 1/18 |

* **ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පනතට අනුව අවම පාසල් කාලය:** 1940 ට පෙර උපන්: වසර 3, 1940 සහ 1991 අතර උපන්: වසර 5, 1992 සහ 2010 අතර උපන්: වසර 9, 2011 හෝ පසුව උපන්: වසර 11.

† **ස්ථිර නොවන ද්‍රව්‍ය** (විහීන තත්වයට පත්වෙන)
**බිත්ති:** පොල් අතු, තල් අතු, ලී, ටකරං, ඇස්බැස්ටස්, යකඩ තහඩු හෝ වෙනත් ද්‍රව්‍ය
**ගෙබිම:** මැටි, ලී, වැලි හෝ වෙනත් එවැනි ද්‍රව්‍ය
**වහල:** ටකරං, පොල් අතු, තල් අතු, පිදුරු හෝ වෙනත් එවැනි ද්‍රව්‍ය

‡ **වැඩි දියුණු නොකළ සනීපාරක්ෂක පහසුකම්:** ජල මුද්‍රිත ගතකට හෝ ඇලකට සම්බන්ධ කළ, ජල මුද්‍රිත නොවන වේදිකාව සහිත වැසිකිළි, ජල මුද්‍රිත නොවන වේදිකාව රහිත විවෘත වල වැසිකිළි, පහසුකම් නොමැති - කැළෑ/ පඳුරු හෝ වෙනත්

§ **ආරක්ෂාකාරී නොවන පානීය ජල ප්‍රභවයන්:** ආරක්ෂා නොකළ ළිඳ, පුද්ගලික ජලනල ව්‍යාපෘති, ගඟ/ වැව/ පීල්ල, වැසි වතුර, ජල බවුසර් හෝ වෙනත්

§ **පසුගිය මාසයේ පානීය ජලය ප්‍රමාණවත් නොවූ:** එක් වරක් හෝ නොදන්නා.



## විහීනවීමේ සීමාව සහ දරිද්‍රතා සීමාව

ඇල්කයර්-ෆොස්ටර් ක්‍රමය සීමාවන් දෙකක් භාවිතා කරයි. පළමුව, දර්ශක සීමාව යොදා ගනිමින් යම් පුද්ගලයකු එක් එක් දර්ශකයෙන් විහීනතාවයට පත්වී ඇති හෝ නැති බව නිශ්චය කරයි. යම් පුද්ගලයෙකුගේ සාධනය දර්ශක සීමාවට වඩා අඩු නම් ඔහු හෝ ඇය එම දර්ශකයෙන් විහීනතාවයට පත්ව ඇති ලෙස සැලකේ. විහීනතා සීමාවන් මූලික වශයෙන් ප්‍රාමාණික ලෙස තීරණය කරනු ලබයි. 1 වන වගුව සියළුම දර්ශකයන් ලැයිස්තුව ඒවාහි අදාල සීමාවන් සමග සාරාංශ ගත කරයි. දෙවනුව, ඇල්කයර්-ෆොස්ටර් ක්‍රමය කෙනෙකු බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන්නේද නැතිද යන්න ඔහු හෝ ඇය අත්විඳිනු ලබන විහීනකම් වල බර තබන ලද දායකත්වයේ ප්‍රමාණයට අනුව නිශ්චය කිරීම සඳහා හරස්-දර්ශක සීමාවක් වන දරිද්‍රතා සීමාව (k) යොදා ගනියි. බොහෝමයක් සිදුවීම් වලදී, දරිද්‍රතා සීමාව තාක්‍ෂණික දෘඩතා පරීක්‍ෂාවන් මගින් තහවරු කරනු ලැබූ ප්‍රාමාණික අගයක් වේ. අපි ශ්‍රී ලංකාවේ දරිද්‍රතා සීමාව 1/3 හෝ සියයට 33.3 ලෙස සකස් කරමු. ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා තෝරාගත් මානයන් තුන මත, සියයට 33.3 ක හෝ ඊට ඉහළ බර තබන ලද විහීනතාවයක් අත්විඳින (උක්ත මානයෙන් සම්පූර්ණයෙන්ම විහීනතාවයට පත්වීමට සමානව හෝ වැඩියෙන්) සෑම පුද්ගලයෙක්ම බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන්නෙකු ලෙස සැලකේ.

**බර තැබීම:** සෑම මානයකටම බර තැබීම සමාන වන අතර සෞඛ්‍යය සහ ජීවන තත්වයට අයත් දර්ශකයන් සඳහා ඒ තුළ බර තැබීම් සමාන වේ. අධ්‍යාපනය සඳහා වන මානය තුළ, පාසල් අධ්‍යාපනය ලැබීම පාසල් ගිය වසර ගණන සඳහා වන දර්ශකයට වඩා වැඩි බර තැබීමක් සහිත වේ.[4] බර තැබීම් වල එකතුව තුනෙන් එකක් හෝ ඊට වැඩි වන යම් දර්ශකයන් සමූහයකින් විහීනතාවයට පත්ව ඇති පුද්ගලයෙක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අයෙකු ලෙස හඳුනාගත යුතු වේ.

4 පාසල් අධ්‍යාපනය ලැබීමට පාසල් ගිය වසර ගණන සඳහා වන දර්ශකයට වඩා වැඩි බරක් තැබීමට හේතු වන්නේ පාසල් යාම අනිවාර්ය වන වයසේ (අවු. 5-16) සිටින ළමුන්ගේ පාසල් යාමට වැඩි වැදගත්කමක් ලබා දීමට ගත් තීරණයයි.

## 2.2. ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රතිඵල

මෙම පරිච්ඡේදය 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත ගොනුව භාවිතා කර ගණනය කරන ලද ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රතිඵල ඉදිරිපත් කරනු ලබයි. අපි පළමුව ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සේම ජනගහන දරිද්‍රතා අනුපාතය හෝ පැතිරී ප්‍රමාණය, සහ දරිද්‍රතාවෙන් පෙළෙන්නන් අතර දරිද්‍රතාවේ තීව්‍රතාව ඉදිරිපත් කරමු. ඉන් පසුව එක් එක් දර්ශකයට අනුව පුද්ගලයින්ගේ දරිද්‍රතාවේ ආකාරය, සහ විවිධ උප කණ්ඩායම් අතර දුප්පත් කවුරුන්ද යන්න පෙන්වමු. අවසාන ඒකකයේදී බර තැබීම හා දරිද්‍රතා සීමාවන් වෙනස් කළද බහුමාන දරිද්‍රතා දර්ශකය ආසන්නව සමාන ප්‍රතිපත්ති තොරතුරු සපයන බව පෙන්වනු ලබන දෘඪතා විශ්ලේෂණය, සහ එක් එක් දර්ශකය විසින් දිවයිනේ පවතින දරිද්‍රතාව පිළිබඳව අනන්‍ය තොරතුරු සැපයීමෙන් දායක වන බව පෙන්වන සමතිරික්තතා විශලේෂණය ඉදිරිපත් කරයි.

### 2.2.1. දරිද්‍රතා මට්ටම: ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය, H, A

ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා පැතිරී ප්‍රමාණයසියයට 16 ක් වේ. ආසන්න වශයෙන් ශ්‍රී ලංකාවේ සෑම පුද්ගලයින් හය දෙනෙකුගෙන්ම එක් පුද්ගලයෙක් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන බව ඉන් අදහස් වේ.[5] එක් එක් දුප්පත් පුද්ගලයා විසින් අත්විඳිනු ලබන විහීනතාවයන්ගේ බර තබන ලද සාමාන්‍ය දායකත්වය පිළිබිඹු කරන දරිද්‍රතාවේ තීව්‍රතාව සියයට 41.6 ක් වෙයි. ඉන් ගම්‍ය වනුයේ එක් එක් දුප්පත් පුද්ගලයා, සාමාන්‍ය වශයෙන්, බර තබන ලද දර්ශකයන් ගෙන් සියයට 41.6 ක විහීනතාවයක් අත්විඳිනු ලබන බවයි. ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ අගය 0.067 ක් වේ. බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහන ප්‍රතිශතය (දරිද්‍රතා පැතිරී ප්‍රමාණය, H) දුප්පත් පුද්ගලයින් මුහුණ දෙනු ලබන විහීනතාවයන්ගේ බර තබන ලද සාමාන්‍ය දායකත්වයෙන් (තීව්‍රතාව, A) ගුණ කිරීමෙන් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය ගණනය කරනු ලබයි. මෙම 0.067 අගයෙන් සෑම කෙනෙක්ම සියළුම දර්ශකයන් ගෙන් විහීනතාවයට පත්වුවහොත් ඔවුන්ට අත්විඳීමට සිදුවන විහීනතාවයෙන් සියයට 6.7 ක විහීනතාවයක් දුප්පත් ජනතාව සාමාන්‍ය වශයෙන් අත්විඳින බව පෙන්වයි.[6] ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය වඩාත්ම නිශ්චිත සහ වෙනස්වීම් වලට වඩාත්ම සංවේදී බැවින් එය නිල සංඛ්‍යාතිය වන මුත් තාක්ෂණික නොවන පරිශීලකයින් සඳහා දරිද්‍රතාවේ පැතිරී ප්‍රමාණය වඩාත් සමීප විය හැකි බැවින් මෙම වාර්තාව සෑම විටම එම ද්විත්වයම පිළිබඳව සාකච්ඡා කරයි.

2 වන වගුව ජනගහන දරිද්‍රතාව හෝ ශ්‍රී ලංකාවේ ජනගහනය අතර දරිද්‍රතාවේ ප්‍රමාණය, H, දරිද්‍රතාවේ පැතිරී ප්‍රමාණය ලෙසද හඳුන්වනු ලබන (හෝ බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන ලෙස හඳුනාගත් පුද්ගලයින්ගේ සමානුපාතය), සහ දරිද්‍රතා තීව්‍රතාව (හෝ දුප්පත් පුද්ගලයින් විහීනතාවයට පත්වී ඇති දර්ශකයන්ගේ බර තබන ලද සාමාන්‍ය සමානුපාතය), A, ඇතුළු 2019 ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අදාල ප්‍රධාන සංඛ්‍යානමය අගයන් පෙන්වයි.

**2 වගුව:** ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය, පැතිරී ප්‍රමාණය, සහ තීව්‍රතා මට්ටම්

| දරිද්‍රතා සීමාව (k) | දර්ශකය | අගය | විශ්‍රම්භ ප්‍රාන්තරය (95%) | |
|---|---|---|---|---|
| k අගය = 33% | බහුමාන දරිද්‍රතා දර්ශකය | 0.067 | 0.062 | 0.071 |
| | සිදුවීම හෝ ජනගහන දරිද්‍රතාව (H) | 16.0 % | 15.0 % | 17.1 % |
| | තීව්‍රතාව (A) | 41.6 % | 41.2 % | 42.1 % |


මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදුකළ ගණනය කිරීම්

5 සියළු නියැදි සමීක්ෂණ ඇස්තමේන්තු වල දෝශ සීමාවන් පවතින බැවින් 2 වන වගුවේ ඒවාහි 95% විශ්‍රම්භ ප්‍රාන්තර ඇස්තමේන්තුන්ද දක්වා ඇත. ඒ අනුව ජාතික ජනගහන දරිද්‍රතාවේ සත්‍ය අගය 15.0% සහ 17.1% අතර පවතින බව 95% ක විශ්වාසයකින් යුතුව ප්‍රකාශ කළ හැකි වේ.

6 ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ සත්‍ය අගය 0.062 සහ 0.071 අතර පවතින බවද 95% ක විශ්වාසයකින් යුතුව ප්‍රකාශ කළ හැකි වේ.

2 වන රූපය එක් එක් විහීනවීම් ලකුණු පරාසයන් තුළ හඳුනා ගත් දුප්පත් පුද්ගලයින් ප්‍රතිශතය පෙන්වයි. එය දුප්පත් පුද්ගලයින් මුහුණදෙනු ලබන බරතබනු ලැබූ විහීනතාවයන්ගේ සමානුපාතය ව්‍යාප්ත වී ඇති ආකාරය පිළිබඳව පැහැදිලි අදහසක් සපයයි. සියයට 33.3 දරිද්‍රතා සීමාවට අනුරූපව දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් අවම වශයෙන් බර තබන ලද දර්ශකයන් ගෙන් සියයට 33.3 ක විහීනතාවයක් අත්විඳියි. උපරිම අගය වන සියයට 83.3 න් ශ්‍රී ලංකාවේ දුප්පත්ම පුද්ගලයා බර තබන ලද විහීනතාවයන්ගෙන් සියයට 83.3 ක් අත්විඳින බව අපට පෙන්වයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ කිසිම පුද්ගලයකු සියළුම දර්ශකයන්ගෙන් විහීනතාවයට පත්වී නොමැත. මෙම තොරතුරු සියළුම දුප්පත් පුද්ලයින්ගෙන් සියයට 70 කට ආසන්න ප්‍රතිශතයක් බර තබන ලද දර්ශකයන්ගෙන් සියයට 33 සහ 42.9 අතර ප්‍රමාණයකින් විහීනතාවයට පත්වී ඇති බව පෙන්වයි. අනෙක් අතට සම්පූර්ණ මානයන් දෙකකින් හෝ වැඩි ප්‍රමාණයකින් විහීනවන, එනම් බර තබන ලද දර්ශකයන්ගෙන් සියයට 63 ක් හෝ එයට වැඩි ප්‍රමාණයකින් විහීන වන බැවින් දුප්පත් ජනගහනයෙන් සියයට 2.9 ක් වැඩිම දරිද්‍රතා තීව්‍රතාවක් අත්විඳියි. නමුත් දර්ශක අගයන් පෙන්වන ආකාරයට, දරිද්‍රතාවෙන් පෙළෙන බොහෝ පුද්ගලයින් බහුමාන දරිද්‍රතා රේඛාවට ඉතා ආසන්නව සිටියි.

**2 රූපය:** දරිද්‍ර ජනගහනයෙන් කෙතරම් ප්‍රතිශතයක් කෙතරම් විහීනතා මට්ටමක් අත්විඳින්නේද?




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෲ විසින් සිදුකළ ගණනය කිරීම්

## 2.2.2. දර්ශකයට අනුව දරිද්‍රතාවේ සංයුතිය


ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාව, කෙතරම් පුද්ගලයින් ප්‍රමාණයක් සාමාන්‍ය වශයෙන් දුප්පත්ද (පැතිරී ප්‍රමාණය) සහ ඔවුන් කෙතරම් දුප්පත්ද (තීව්‍රතාව) යන්න පහදා දීමෙන් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය මගින් විස්තර කෙරී ඇත. අපි දැන් ඔවුන් දුප්පත් වන්නේ කෙසේද යන්න විශ්ලේෂණය කිරීමට උනන්දු වෙමු. එනම් ඔවුන් අත්විඳිනු ලබන විහීනතාවයන් මොනවාද යන්න සෙවීමයි. මෙම තොරතුරු වඩාත්ම ඵලදායි ලෙස දරිද්‍රතාව අවම කරනා ආකාරයට රාජ්‍ය ප්‍රතිපත්තීන් සංවර්ධනය කිරීමට උපකාරී වේ.

### වාරණය කළ ජාතික ජනගහන දරිද්‍රතා අනුපාත

අපි බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන සහ එක් එක් දර්ශකයන්ගෙන් විහීනතාවයට පත්ව ඇති ජනගහනයේ ප්‍රතිශතය පිළිබඳව පළමුව අධ්‍යයනය කරමු. ඒවා වාරණය කළ ජාතික ජනගහන දරිද්‍රතා අනුපාතයන් ලෙස හඳුන්වයි. මෙම වාරණය කළ ජාතික ජනගහන දරිද්‍රතා අනුපාතයන් විශ්ලේෂණය කිරීම මගින් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව දරිද්‍ර ලෙස හඳුනා ගත් පුද්ගලයින් වඩාත්ම පීඩාවට පත්වී ඇති දර්ශකයන් හඳුනා ගත හැකිවේ. යම් පුද්ගලයෙකුගේ යම් විහීනතාවයක (යම් වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයක) කෙබඳු හෝ අඩු කිරීමක් ජාතික ජනගහන දරිද්‍රතා අනුපාතය අඩු කිරීමට හා ශ්‍රී ලංකාවේ දුප්පත් ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමට දායක වෙයි.

3 වන රූපය පුද්ගලයින් ඉහළ ප්‍රතිශතයක් (14.5% ක්) බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතරම ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන දර්ශකයෙන්ද විහීනතාවයට පත්වී ඇති බව පෙන්වයි. ආහාර පිසීම සඳහා දර, භූමිතෙල්, ලී කුඩු හෝ දහයියා වෙනුවට පිරිසිදු බලශක්ති විකල්පයන් හඳුන්වා දීම මගින් ශ්‍රී ලංකාවේ මිලියන 30 කට අධික ජනතාවකට බලපාන මෙම තත්වය අවම කරගත හැකිවේ. තව දුරටත්, සියයට 14.5 ක ප්‍රතිශතයක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතරම ආරක්ෂාකාරී, ගුණාත්මක හෝ ප්‍රමාණවත් පානීය ජල පහසුකම් නොමැති කමින් පීඩා විඳියි. ඊට අමතරව, ආසන්න වශයෙන් සෑම පුද්ගලයින් අට දෙනෙකුගෙන්ම එක් පුද්ගලයෙක් බහුමාන දරිද්‍රතාවෙන්

**3 රූපය:** ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය: වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදුකළ ගණනය කිරීම්

පෙළෙන අතරම ආසන්නම බස් නැවතුමට විනාඩි 15 කට සමාන හෝ වැඩි කාලයක් හෝ ප්‍රාථමික හෝ ද්විතීයික පාසලට ලඟා වීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගත වන (12.6%), සහ සෞඛ්‍ය පහසුකම් සඳහා ළඟාවීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගතවන (11.9%) තරම් දුරක ඇති නිවසක වෙසෙයි.

පාසල් යාම, නිදන්ගත, රෝග සහ සනීපාරක්ෂාව වැනි විහීනවීම් අඩු විහීනතා අනුපාතයන් සහිත වේ. කෙසේ වෙතත්, ඒවායේ එකතුව සමස්ත ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට සියයට 15 කින් පමණ දායක වන බැවින් ඒ කෙරෙහිද අවධානයෙන් පසුවිය යුතුවේ.

## ප්‍රදේශය, දිස්ත්‍රික්කය, වයස් කාණ්ඩය සහ ගෘහමූලිකත්වය අනුව දරිද්‍රතා මට්ටම

ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ සංයුතිය අයවැය සහ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවන් හැඩ ගස්වා ගැනීම සඳහා භාවිතා කළහැකි ආකාරය අධ්‍යයනය කිරීම සඳහා අපි ප්‍රදේශය සහ දිස්ත්‍රික්කය, වයස් කාණ්ඩය සහ ගෘහ මූලිකයාගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විහීනතා රටාවන් වෙනස් වන ආකාරය ඉදිරිපත් කරමු. එම විසංයෝජනයන් විසින් විෂමතාවන් සහ ඉහළ දරිද්‍රතාවන් සහිත ප්‍රදේශයන් හෙළිකරන බැවින් දරිද්‍රතාව ඉහළ ප්‍රදේශ සහ කණ්ඩායම් ඉලක්ක කර සුදුසු මැදිහත් වීම් ක්‍රියාත්මක කළ හැකිවේ.


“විසංයෝජනයන් විසින් විෂමතාවන් සහ ඉහළ දරිද්‍රතාවන් සහිත ප්‍රදේශයන් හෙළිකරන බැවින් දරිද්‍රතාව ඉහළ ප්‍රදේශ සහ කණ්ඩායම් ඉලක්ක කර සුදුසු මැදිහත් වීම් ක්‍රියාත්මක කළ හැකිවේ.”



## ප්‍රදේශය අනුව විසංයෝජනය

3 වන වගුව ශ්‍රී ලංකාවට සුවිශේෂී වන නාගරික/ ග්‍රාමීය/ වතු ප්‍රදේශ සඳහා දරිද්‍රතාව බෙදී යාම පෙන්වයි. ඉහළම දරිද්‍රතාව වතු ප්‍රදේශවල පවතින අතර ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ පිළිවෙලින් ඒ පසු පසින් වේ. බහුමාන දරිද්‍රතාවේ පැතිරී ප්‍රමාණය හෝ ජනගහන දරිද්‍රතා අනුපාතය නාගරික අංශයේ සියයට 4.4 ක් ද, ග්‍රාමීය අංශයේ සියයට 16.6 ක් ද, සහ වතු අංශයේ සියයට 51.3 ක් ද වේ. තීව්‍රතාවයද ග්‍රාමීය ප්‍රදේශ (40.9%) හා නාගරික ප්‍රදේශ (40.6%) සමග සැසඳීමේදී වතු ප්‍රදේශයන්හි ඉහළම අගය (46.1%) ගනියි. ඒ අනුව වතු ප්‍රදේශයන් ප්‍රතිපත්ති අවධානය යොමුවිය යුතු දරිද්‍රතා පවතින ප්‍රදේශයන් ලෙස ඉස්මතුවී පෙනේ.

**4 රූපය:** නාගරික, ග්‍රාමීය, සහ වතු ප්‍රදේශ අනුව ජනගහනයේ සහ බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන ජනගහනයේ ව්‍යාප්තිය




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදුකළ ගණනය කිරීම්

**3 වගුව:** නාගරික, ග්‍රාමීය, සහ වතු ප්‍රදේශ අනුව බහුමාන දරිද්‍රතාව


| ප්‍රදේශය | ජනගහන කොටස (%) | බහුමාන දරිද්‍රතා දර්ශකය | | | පැතිරී ප්‍රමාණය හෝ ජනගහන දරිද්‍රතාව (H) | | | තීව්‍රතාව (A) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය | |
| නාගරික | 17.2% | 0.018 | 0.014 | 0.023 | 4.4% | 3.4% | 5.6% | 40.6% | 39.5% | 41.8% |
| ග්‍රාමීය | 78.3% | 0.068 | 0.063 | 0.073 | 16.6% | 15.4% | 17.8% | 40.9% | 40.4% | 41.3% |
| වතු | 4.5% | 0.236 | 0.199 | 0.278 | 51.3% | 43.6% | 58.9% | 46.1% | 44.5% | 47.7% |

මූලාශ්‍රය: 2019 ගෘහවීකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදුකළ ගණනය කිරීම්

ප්‍රතිපත්ති ප්‍රතිචාරයන් දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් සංඛ්‍යාවද සැලකිල්ලට ගතයුතු වෙයි. 4 වන රූපය පෙන්වන පරිදි, වතු ප්‍රදේශ වල වෙසෙන්නේ ශ්‍රී ලාංකිකයන් ගෙන් සියයට 4.5 ක් පමණි. නමුත් එහි දුප්පත් ජනතාවගෙන් සියයට 14.4 ක් විසීම වතු ප්‍රදේශ ඉතා තීරණාත්මක කණ්ඩායමක් බවට පත් කරයි. එසේ වුවද, බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින්ගෙන් විශාල බහුතරය (සියයට 80.9 ක්) ග්‍රාමීයව වෙසෙයි. එම නිසා ග්‍රාමීය ප්‍රදේශ වලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු වේ.

5 වන රූපය පෙන්වන පරිදි, දරිද්‍රතාවේ සංයුතියද ප්‍රදේශය අනුව වෙනස් වෙයි. ග්‍රාමීය සහ වතු ප්‍රදේශ වල සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය, පාසල් ගිය කාලය, මූලික පහසුකම්, වත්කම්, ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන සහ පානීය ජලය යන උප මානයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුවේ. වතු ප්‍රදේශ වල නිවාස පහසුකම් ගැටළුව ප්‍රමුඛ වන අතර පාසල් යාම සහ නිදන්ගත රෝග ග්‍රාමීයව කැපී පෙනෙයි. නාගරික අංශයේ විශාලම ගැටළුව වී ඇත්තේ අනිවාර්ය පාසල් යන වයසේ පසුවන ළමුන් පාසල් නොයාමයි.

**5 රූපය:** නාගරික, ග්‍රාමීය, සහ වතු ප්‍රදේශ අනුව බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකයන් විසින් ඇතිකරන ප්‍රතිශත දායකත්වය





මූලාශ්‍රය: 2019 ගෘහවීකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

## දිස්ත්‍රික්කය අනුව විසංයෝජනය

බහුමාන දරිද්‍රතාව දිස්ත්‍රික්ක මට්ටමේදී බොහෝ ලෙස වෙනස් වෙනස් අගයන් ගනියි (4 වන වගුව, 6අ රූපය සහ 6ආ රූපය බලන්න). බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව කොළඹ (3.5%) සහ ගම්පහ (5.2%) අවම දරිද්‍රතාව වාර්තා කරන අතර නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් පහෙන් දෙකකට වඩා (44.2% ක්) දරිද්‍රතාවෙන් යුතුව දිවි ගෙවයි. නමුත් විශ්‍රම්භ පරාසයන් එකිනෙක අතර පරතරයන් නොමැති බවද (6අ රූපය) පෙන්වන බැවින් බොහෝ දිස්ත්‍රික්ක සඳහා නිශ්චිත අනුස්ථානයන් ලබා දිය නොහැක. වතු, ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ වල ජනගහන ප්‍රමාණය සැලකිය යුතු කරුණක් වූ සේම දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිචාර සැළසුම් කිරීමේදීද ජනගහන ප්‍රමාණයන් සැලකිල්ලට ගත යුතු වෙයි. කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන් අවම බහුමාන දරිද්‍රතා අගයක් වාර්තා කළද ඒවායෙහි ජනගහනය විශාල නිසා එම දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයින්ගේ සත්‍ය ප්‍රමාණය, වැඩි බහුමාන දරිද්‍රතා අගයක් පෙන්නුම් කරන වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්ට වඩා වැඩි වේ.

**6අ රූපය:** දිස්ත්‍රික්කය අනුව බහුමාන දරිද්‍රතාවයේ ජනගහන අනුපාතය




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්


**4 වගුව:** දිස්ත්‍රික්කය අනුව බහුමාන දරිද්‍රතාව

| දිස්ත්‍රික්කය | ජනගහන කොටස (%) | බහුමාන දරිද්‍රතා දර්ශකය | | | පැතිරි ප්‍රමාණය හෝ ජනගහන දරිද්‍රතාව (H) | | | තීව්‍රතාව (A) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය[7] | |
| කොළඹ | 9.8% | 0.014 | 0.01 | 0.02 | 3.5% | 2.5% | 4.8% | 39.9% | 38.1% | 41.7% |
| ගම්පහ | 7.9% | 0.019 | 0.014 | 0.027 | 5.1% | 3.6% | 7.1% | 37.9% | 36.3% | 39.4% |
| යාපනය | 6.1% | 0.039 | 0.027 | 0.058 | 10.0% | 6.7% | 14.7% | 39.6% | 37.6% | 41.5% |
| ගාල්ල | 6.0% | 0.041 | 0.028 | 0.059 | 10.0% | 7.0% | 14.2% | 40.7% | 39.4% | 42.0% |
| පුත්තලම | 3.0% | 0.044 | 0.027 | 0.071 | 10.0% | 6.2% | 15.8% | 43.9% | 40.5% | 47.3% |
| කළුතර | 3.9% | 0.046 | 0.035 | 0.061 | 11.5% | 8.7% | 15.0% | 40.4% | 38.6% | 42.2% |
| කුරුණෑගල | 5.7% | 0.048 | 0.036 | 0.063 | 11.8% | 8.9% | 15.4% | 40.8% | 39.2% | 42.4% |
| මුලතිව් | 5.4% | 0.054 | 0.024 | 0.114 | 13.8% | 6.2% | 28.1% | 38.8% | 35.8% | 41.8% |
| අම්පාර | 3.5% | 0.058 | 0.04 | 0.085 | 13.9% | 9.5% | 19.9% | 41.9% | 40.1% | 43.7% |
| ත්‍රිකුණාමලය | 3.7% | 0.059 | 0.039 | 0.09 | 14.6% | 9.5% | 21.9% | 40.5% | 39.1% | 41.9% |
| කිලිනොච්චිය | 1.6% | 0.06 | 0.037 | 0.096 | 15.2% | 9.3% | 24.0% | 39.1% | 36.9% | 41.4% |
| අනුරාධපුරය | 1.9% | 0.071 | 0.052 | 0.097 | 18.0% | 13.1% | 24.4% | 39.5% | 37.9% | 41.0% |
| මාතර | 1.3% | 0.074 | 0.056 | 0.098 | 17.4% | 13.1% | 22.8% | 42.8% | ඇ/නැ | ඇ/නැ |
| කෑගල්ල | 2.0% | 0.075 | 0.053 | 0.107 | 18.2% | 12.6% | 25.5% | 41.6% | 40.1% | 43.0% |
| මාතලේ | 3.2% | 0.081 | 0.056 | 0.115 | 20.4% | 14.2% | 28.4% | 39.7% | 37.7% | 41.8% |
| හම්බන්තොට | 3.7% | 0.081 | 0.06 | 0.11 | 20.4% | 14.9% | 27.2% | 40.0% | ඇ/නැ | ඇ/නැ |
| මඩකලපුව | 2.8% | 0.085 | 0.058 | 0.123 | 20.2% | 13.9% | 28.4% | 42.1% | 39.4% | 44.9% |
| පොළොන්නරුව | 6.1% | 0.085 | 0.056 | 0.128 | 20.2% | 13.4% | 29.4% | 42.1% | 39.6% | 44.7% |
| මහනුවර | 3.0% | 0.096 | 0.077 | 0.118 | 21.9% | 17.6% | 26.8% | 43.7% | 42.1% | 45.4% |
| වව්නියාව | 3.2% | 0.11 | 0.069 | 0.169 | 26.3% | 16.3% | 39.4% | 41.7% | ඇ/නැ | ඇ/නැ |
| මන්නාරම | 2.7% | 0.112 | 0.075 | 0.163 | 27.0% | 17.7% | 38.9% | 41.4% | ඇ/නැ | ඇ/නැ |
| රත්නපුර | 3.5% | 0.116 | 0.091 | 0.146 | 28.0% | 22.1% | 34.8% | 41.3% | 40.0% | 42.7% |
| මොණරාගල | 2.9% | 0.141 | 0.107 | 0.184 | 32.7% | 25.0% | 41.5% | 43.2% | 40.8% | 45.7% |
| බදුල්ල | 4.2% | 0.153 | 0.122 | 0.191 | 36.6% | 29.1% | 44.7% | 41.8% | 40.0% | 43.7% |
| නුවරඑළිය | 3.1% | 0.193 | 0.157 | 0.236 | 44.2% | 35.8% | 52.9% | 43.8% | 42.1% | 45.4% |

සටහන්: ඇ/නැ (ඇස්තමේන්තු කර නැත)
මූලාශ්‍රය: 2019 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

7 ඇ) සෑම පුද්ගලයෙකුම ආසන්න වශයෙන් ඒකාකාරීව දරිද්‍ර වීම නිසා හෝ ආ) දුප්පත් පුද්ගලයින් සුළු ප්‍රමාණයක් සිටීම හේතුවෙන් මාතර, හම්බන්තොට, වවුනියා සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි බහුමාන දරිද්‍රතාවේ තීව්‍රතාවය සඳහා විශ්‍රම්භ පරාසය ගණනය කර නැත.

**6ආ රූපය:** දිස්ත්‍රික්කය අනුව බහුමාන දරිද්‍රතාවයේ ජනගහන අනුපාතය





මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවන් ප්‍රස්තාරගත කිරීමට සහ වැඩි බලපෑමක් සහිත ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා 7 වන රූපය එක් එක් දිස්ත්‍රික්කයෙහි ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට එක් එක් බර තබන ලද දර්ශකයන්ගේ ප්‍රතිශත දායකත්වය පෙන්වයි. 4 වන වගුවේ පෙන්වන ලද ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක අංකයන්ට අනුව දිස්ත්‍රික්ක උපරිම දරිද්‍රතාවේ සිට අවම දරිද්‍රතාවය දක්වා පෙළ ගස්වා ඇත. අවම බහුමාන දරිද්‍රතා මට්ටමක් සහිත කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් යාම බහුමාන දරිද්‍රතා දර්ශකයට වැඩිම දායකත්වයක් දක්වයි. පාසල් ගිය වසර ගණන පුත්තලම් දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවට වඩාත් සුවිශේෂී ලෙස දායකත්වය දක්වන අතර සෞඛ්‍ය පහසුකම් සඳහා ලඟාවීම අනෙකුත් සියළුම දිස්ත්‍රික්කවල දරිද්‍රතාවට වැඩිම දායකත්වය සපයයි.

ප්‍රතිපත්ති සඳහා ප්‍රතිශත දායකත්වය භාවිතා කිරීමට, ආසන්න වශයෙන් සමාන බහුමාන දරිද්‍රතා දර්ශකයන් සහිත මාතලේ සහ හම්බන්තොට උදාහරණය සලකන්න (7 වන රූපය). එහිදී ප්‍රති-දරිද්‍රතා ප්‍රතිපත්ති සමාන වෙන බව උපකල්පනය කෙරිය හැක. නමුත් බහුමාන දරිද්‍රතාවට අධ්‍යාපන දර්ශකයන් දෙකෙන්ම ( ) සහ නිදන් ගත රෝග ( ) දර්ශකයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කය මාතලේ දිස්ත්‍රික්කයට වඩා වැඩි දායකත්වයන් දක්වන අතර මාතලේ දිස්ත්‍රික්කය වැඩි දායකත්වයක් දක්වන්නේ නිවාස, සනීපාරක්ෂාව ( ) සහ වත්කම් ( ) සඳහා වේ. එක් එක් දිස්ත්‍රික්කයන්හි පවතින විවිධ දර්ශක සංයුතීන්ට ගැලපෙන විවිධ ප්‍රතිපත්තීන් සහ අයවැය ප්‍රතිචාරයන් අවශ්‍යවන බැවින් සියළු ප්‍රදේශ සඳහා ඒකාකාරී ප්‍රවේශය පිරිවැය ඵලදායී නොවන බව මින් මනාව පැහැදිලි වෙයි.

**7 රූපය:** දිස්ත්‍රික්කය අනුව බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන ප්‍රතිශත දායකත්වය (බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව පෙළගස්වන ලද)




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්


OK
ORIES

## වයස අනුව විසංයෝජනය

භූගෝලීය ස්ථාන වලට අමතරව ප්‍රමුඛතා කණ්ඩායම් හඳුනා ගැනීම සඳහා ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය පුද්ගලයින්ගේ වයස් කාණ්ඩය අනුවද එය වෙන් කර පෙන්වයි. වඩාත් දුප්පත් වන්නේ වයස අවුරුදු 65 හෝ ඊට වැඩි පුද්ගලයින් සහ 5 ත් 17 ත් අතර පසුවන ළමයින් බව 5 වන වගුව පෙන්වයි. වයස අවුරුදු 65 හෝ ඊට වැඩි පුද්ගලයින් වාර්තා කරන ජනගහන දරිද්‍රතාව (17.9%), තීව්‍රතාව (42.5%), සහ බහුමාන දරිද්‍රතාව (0.076) ඉදිරියෙන්ම සිටින අතර ඊට පසුපසින් අවුරුදු 5 ත් 17 ත් අතර පසුවන ළමයින් සිටියි (ඔවුන් ගෙන් සියයට 16.9 ක් බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙයි). ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව අවුරුදු 4 හෝ ඊට අඩු වයසේ පසුවන ළමයින් අවම දරිද්‍රතාවක් වාර්තා කර ඇති නමුත් ඔවුන්ගේ තත්වය වටහා ගැනීම සඳහා වැඩිමනත් දර්ශකයන් යොදා ගැනීම විශේෂිත වශයෙන් වැදගත් වන නිසා මෙම ජාතික බහුමාන දරිද්‍රතා වාර්තාවේ 3 වන කොටසේ ළමා දරිද්‍රතා අධ්‍යයනය ඔවුන්ව විශේෂ කොට ඉලක්ක කරයි.

**5 වගුව:** වයස් කාණ්ඩය අනුව බහුමාන දරිද්‍රතාව

| වයස් කාණ්ඩය | ජනගහන කොටස (%) | බහුමාන දරිද්‍රතා දර්ශකය | | | දරිද්‍රතා පැතිරී ප්‍රමාණය හෝ ජනගහන දරිද්‍රතාව (H) | | | තීව්‍රතාව (A) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය | |
| 0-4 | 6.6% | 0.057 | 0.052 | 0.064 | 14.0% | 12.6% | 15.5% | 41.0% | 40.3% | 41.7% |
| 5-17 | 21.2% | 0.071 | 0.066 | 0.076 | 16.9% | 15.8% | 18.1% | 41.8% | 41.2% | 42.4% |
| 18-35 | 22.9% | 0.061 | 0.056 | 0.067 | 14.8% | 13.7% | 16.0% | 41.3% | 40.7% | 41.9% |
| 36-64 | 37.2% | 0.066 | 0.062 | 0.071 | 16.0% | 15.0% | 17.1% | 41.4% | 41.0% | 41.9% |
| 65+ | 12.2% | 0.076 | 0.070 | 0.083 | 17.9% | 16.5% | 19.4% | 42.5% | 41.9% | 43.2% |

මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්


වයස් කාණ්ඩය අනුව දරිද්‍රතාවයේ සංයුතිය විශ්ලේෂණය කිරීම ප්‍රතිපත්ති ක්‍රියාවන් සඳහා ප්‍රබල අන්තර් දෘෂ්ටීන් සපයයි. 8 වන රූපය ඒ ඒ වයස් කාණ්ඩයේ ඒ ඒ දර්ශකය ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට දක්වන දායකත්වයන් පෙන්වයි. එහි ස්තම්භයන්හි උස එක් එක් වයස් කාණ්ඩයන්හි ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට සමාන වේ. වයස් කාණ්ඩයන් හරහා, සෞඛ්‍ය පහසුකම් සඳහා ළඟාවීමේ විහීනතාව සෑම වයස් කාණ්ඩයකම ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට තුනෙන් එකකින් පමණ දායක වන අතර අවුරුදු 5 ට අඩු වයසේ පසුවන ළමයින්ගේ එය ඊට ඉහළ වේ (33.5%). ආහාර පිසීම සඳහා ඝන ඉන්ධන භාවිතය සහ වැඩි දියුණු කළ පානීය ජල ප්‍රභවයන් නොමැති වීම ඊට පසුපසින් සිටියි. පාසල් යන වයසේ සිටින මුත් පාසල් නොයන එක් දරුවකු හෝ සිටින නිවසක වාසය කිරීම මගින් අවුරුදු 5 ත් 17 ත් අතර වයස් කාණ්ඩය ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට දක්වන දායකත්වය අනිකුත් වයස් කාණ්ඩ ඊට දක්වන දායකත්වයන්ට වඩා වැඩි වේ. වයස්ගත පුද්ගලයින් අතර, නිදන් ගත රෝග දර්ශකය ඉහළ වන අතර අවුරුදු 5 ට අඩු වයසේ පසුවන ළමයින් අතර එය අවම අගයක් ගනියි. කෙසේ වෙතත්, ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට සියළුම වයස් කාණ්ඩයන් දක්වන දායකත්වය අතර ඉහළම අගයන් ගන්නේ ජීවන තත්ව මානය වන අතර සියළුම වයස් කාණ්ඩ සියළුම දර්ශකයන්ගෙන් ඊට බෙහෙවින් සමානවන දායකත්වයන් දක්වයි.

**8 රූපය:** වයස් කාණ්ඩය අනුව බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන නිරපේක්ෂ දායකත්වය




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

**9 රූපය:** ගෘහමූලිකත්වය අනුව බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන නිරපේක්ෂ දායකත්වය




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

## ගෘහ මූලිකත්වය අනුව විසංයෝජනය

ස්ත්‍රී සහ පුරුෂ අතර අසමානතාවයන් හඳුනා ගැනීම සඳහා ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය ගෘහමූලිකයාගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විසංයෝජනය කළ විට ස්ත්‍රී සහ පුරුෂ ගෘහමූලික නිවාසවීකක අතර ජනගහන දරිද්‍රතාවේ, තීව්‍රතාවේ සහ බහුමාන දරිද්‍රතා දර්ශකයේ සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු වෙනසක් නොමැති බව හෙළි විය. ස්ත්‍රී මූලික ගෘහවීකකයන්හි දරිද්‍රතාවේ පැතිරී ප්‍රමාණය (17.2%) පුරුෂ මූලික ගෘහවීකකයන්හි දරිද්‍රතාවේ පැතිරී ප්‍රමාණයට (15.7% ට) වඩා වැඩි අගයක් ගත්තද ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේද දැකිය හැකි (පිළිවෙලින් 0.072 හා 0.065) එම වෙනස්කම් සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු මට්ටම්වල නොපවතින බව 6 වන වගුව පෙන්වයි.[8]

**6 වගුව:** ගෘහමූලිකත්වය අනුව බහුමාන දරිද්‍රතාව

| ගෘහ මූලිකත්වය | ජනගහන කොටස (%) | බහුමාන දරිද්‍රතා දර්ශකය | | | දරිද්‍රතා පැතිරී ප්‍රමාණය හෝ ජනගහන දරිද්‍රතාව (H) | | | තීව්‍රතාව (A) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය | |
| පුරුෂ මූලික ගෘහවීකක | 78.7% | 0.065 | 0.061 | 0.070 | 15.7% | 14.7% | 16.8% | 41.5% | 41.0% | 42.0% |
| ස්ත්‍රී මූලික ගෘහවීකක | 21.3% | 0.072 | 0.066 | 0.079 | 17.2% | 15.7% | 18.8% | 41.9% | 41.2% | 42.6% |

මූලාශ්‍රය: 2019 ගෘහවීකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

ගෘහ මූලිකත්වය අනුව දරිද්‍රතාවේ සංයුතිය පිළිබඳව සිදු කළ අධ්‍යයනය එක් එක් විහීනතාවයන්ගේ වාරණය කළ ජනගහන දරිද්‍රතාවන් කණ්ඩායම් දෙක අතර සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු ලෙස වෙනස් නොවන බව පෙන්වන අතර එම දර්ශකයන් කණ්ඩායම් දෙකම හරහා සමස්ථ දරිද්‍රතාවට සමාන ලෙස දායක වන බව ඉන් අරුත් දෙයි. කාන්තාවන් සඳහා බහුමාන දරිද්‍රතා දර්ශකය (ස්තම්භයේ උස) වැඩි අගයක් ගන්නා නමුත් (එය සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු වෙනසක් නොවූවද) ගෘහවීකක වර්ග දෙක අතර සංයුතීන් සමාන වන බව 9 වන රූපය පෙන්වයි.

8 මෙම නිගමනයට වීමට හේතු වන්නේ ඇස්තමේන්තු දෙකේ විශ්‍රම්භ පරාසයන් එකිනෙක ඡේදනය වී තිබීමයි. කෙසේ වෙතත් මෙම නිගමනයේ දෘඩතාව තහවුරු කිරීම සඳහා සුදුසු සංඛ්‍යාන පරීක්ෂාවක් සිදු කළ යුතු වෙයි.

### තෝරාගත් දර්ශකයන්හි සංඝටකයන් අනුව විසංයෝජනය

ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේදී සලකා බලනු ලබන පානීය ජලය සහ මූලික පහසුකම් වැනි සමහරක් දර්ශකයන් සඳහා සංඝටකයන් කීපයක් බැගින් පවතී. මෙම කොටසේදී සමහර සංඝටකයන්ගෙන් පමණක් විහීනතාවයට පත්වී ඇති නමුත් අනිකුත් ඒවායින් එසේ නොවන ජනගහන සමානුපාතය මෙන්ම, සමහර සංඝටකයන්ගෙන් විහීනතාවයට පත්වී ඇති සහ එවිටම බහුමාන දරිද්‍රතාවෙන්ද පෙළෙන ජනගහන සමානුපාතයද විශ්ලේෂණය සඳහා අපි උනන්දු වෙමු. එක් දර්ශකයක කිසියම් සංඝටකයකින් විහීනතාවයට පත්වී සිටීම යනු එම දර්ශකයෙන් විහීන තත්වයට පත්වී සිටීම බවද, පුද්ගලයා දුප්පත් වීම ඉන් අදහස් නොවන බවද මෙහිදී සඳහන් කළ යුතුවේ.

## පානීය ජලය

පානීය ජලය සඳහා වන දර්ශකය සෑදී ඇත්තේ අංග තුනකිනි: 1) පහසුවෙන් ප්‍රවේශවිය හැකි බව, 2) ප්‍රමාණවත් ලෙස තිබීම, සහ 3) ගුණාත්මක වීම: එබැවින් ගෘහඒකකයක් සහ එහි වෙසෙන සියළුම සාමාජිකයින් මෙම දර්ශකයෙන් විහීනතාවයට පත්වී ඇති බව හඳුනා ගැනීමට නම්:


1. ගෘහඒකකයට ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් සඳහා **ප්‍රවේශවිය නොහැකි වීම** හෝ ඊට ලඟාවීමට කාලය/දුර මිනිත්තු 15/කි.මී. 1 ඉක්මවා යාම, හෝ
2. පසුගිය මාසය සඳහා **ප්‍රමාණවත් ලෙස පානීය ජලය නොතිබීම**, හෝ
3. පානීය ජලයේ **ගුණාත්මක බව දියුණු කොට නොතිබීමට** ලක්වී තිබිය යුතු වේ.

10 වන රූපයේ පානීය ජලයේ ගුණාත්මකභාවයේ පමණක් විහීනවීම් (41.6%) සහ අනෙක් සංඝටක දෙකෙහි (5% ක් පමණ) අතර විශාල අසමානතාවන් පෙන්වීම ආරක්ෂාකාරී පානීය ජලයේ විහීනතාවයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ ඔවුන් තම පානීය ජලය සකස් කර ගැනීමට භාවිතා කරන ක්‍රමය විය යුතු බවට ඉඟි කරයි. මින් අදහස් වන්නේ බොහෝ විට පානීය ජලයේ විහීනතාවයට පත්වී ඇති නිවාස සඳහා පසුගිය මාසයේදී ප්‍රමාණවත් ලෙස හා පහසුවෙන් ළඟාවිය හැකි අයුරින් පානීය ජලය ලැබී ඇති බවයි. නමුත් ඒ සකස් කිරීම සඳහා තැන්පත් වීම සඳහා තැබීම හෝ පෙරීම සඳහා රෙදි කැබැල්ලක් භාවිතා කිරීම හෝ කිසිම ක්‍රමයක් භාවිතා නොකිරීම නිසා ඔවුන් ඉන් විහීනතාවයට පත්වී ඇත. මේ අයුරින් විහීනතාවයට පත්වී ඇති බොහෝ දෙනා බහුමානව දරිද්‍ර නොවන බවද පෙනෙයි. 10 වන රූපය, පානීය ජලයේ ගුණාත්මකභාවයෙන් පමණක් විහීනතාවයට පත්වී ඇති අයවලුන්ගෙන් බහුමානව දරිද්‍ර වන්නේ සියයට 6 ක් පමණක් බැවින්, සහ දුප්පත් නොවන ජනගහනයෙන්ද සියයට 35 ක් ම මේ ආකාරයෙන් විහීනතාවයට පත්වී ඇති බැවින් දුප්පත් සේම දුප්පත් නොවන ජනගහනය සඳහාද එය ප්‍රතිපත්ති-ප්‍රමුඛ අවශ්‍යතාවක් බවද පෙන්වයි.

ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් සඳහා ප්‍රවේශය (5.2%), හෝ ප්‍රමාණවත් ලෙස පානීය ජලය තිබීම (5.6%) යන සංඝටකයන්ගෙන් විහීනතාවයට පත්වී ඇති ජනගහන ප්‍රතිශතයන් අතර කුඩා වෙනසක් දැකිය හැකි අතර මෙම සංඝටකයෙන් පමණක් විහීනතාවයට පත්වී ඇති සහ ඒ සමගම බහුමාන දරිද්‍රතාවෙන්ද පෙළෙන ජනගහන ප්‍රතිශතයන් පිළිවෙලින් 2.1% සහ 1.1% වේ. ඉහත අවස්ථා දෙකේදීම ප්‍රවේශවීමේ පැත්තෙන් පෙනෙන වෙනස කුඩා වුවද විහීනතාවයට පත්වී ඇති අයගෙන් අඩකට වඩා දුප්පත් අයවලුන් නොවේ. එබැවින් ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් සඳහා ප්‍රවේශය ඉහළ නැංවීම ප්‍රමුඛතාවක් විය යුතු වේ.




**10 රූපය:** පානීය ජලයේ එක් එක් සංරචකයකින් පමණක් විහීනතාවයට පත්වී ඇති ජනගහන සමානුපාතය, සහ පානීය ජලයේ එක් එක් සංරචකයකින් පමණක් විහීනතාවයට පත්වී ඇති සහ ජාතික බහුමාන දරිද්‍රතාවෙන්ද පෙළෙන ජනගහන සමානුපාතය





මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

## මූලික පහසුකම්

මූලික පහසුකම් දර්ශකය සංඝටක දෙකකින් සමන්විත වේ: 1) ප්‍රවාහන පහසුකම් සඳහා කාලය, සහ 2) අධ්‍යාපන පහසුකම් සඳහා කාලය. ගෘහඒකකයක් සහ එහි වෙසෙන සියළුම සාමාජිකයින් මෙම දර්ශකයෙන් විහීනතාවයට පත්වී ඇති බව හඳුනා ගැනීමට: 1) ගෘහඒකකයට ආසන්නම බස් නැවතුමට ලඟා වීමට විනාඩි 15 ක් හෝ වැඩි කාලයක් ගතවිය යුතු, හෝ 2) ගෘහඒකකයට ප්‍රාථමික හෝ ද්වීතියික පාසලකට ලඟා වීමට විනාඩි 30 ක් හෝ ඊට වැඩි කාලයක් ගත විය යුතු හෝ වේ. 11 වන රූපය විහීනතාවයන් දෙකම ජාතික වශයෙන් වැදගත් බව සහ ආසන්නව 10 දෙනෙක්ගෙන් එක් අයකුට එහි බලපෑම පවතින බව පෙන්වයි. දුප්පත් ජනගහනය සඳහා මෙම සංඝටක දෙකම වැදගත් වන බව සහ ඒ සඳහා ක්‍රියා මාර්ග ගතයුතු බව පහතින් ඇති ස්තම්භයන් පෙන්වයි. ආසන්නම බස් නැවතුමට ලඟා වීමට ගතවන කාලය සමග සංසන්දනය කළ විට දුප්පත් ජනගහනය ප්‍රාථමික හෝ ද්වීතියික පාසලකට ලඟා වීමට ගතවන කාලයෙන් කුඩා නමුත් සැලකිය යුතු ලෙස ඉහළ විහීනතාවකට පත්වී ඇති බව නිරීක්ෂණය වේ. මෙම සංඝටකයන් දෙකම වැදගත් වන බව සහ අධ්‍යාපන පහසුකම් සඳහා ඇති දුර අඩු කිරීම නොසලකා සිටිය නොහැකි බවද මෙම හෙළි කිරීම් හඟවයි.

**11 රූපය:** මූලික පහසුකම්හි එක් එක් සංරචකයකින් පමණක් විහීනතාවයට පත්වී ඇති ජනගහන සමානුපාතය, සහ මූලික පහසුකම්හි එක් එක් සංරචකයකින් පමණක් විහීනතාවයට පත්වී ඇති, සහ ජාතික බහුමාන දරිද්‍රතාවෙන්ද පෙළෙන ජනගහන සමානුපාතය





මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

## වාරණය නොකළ ජාතික ජනගහන දරිද්‍රතා අනුපාතයන්

ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රධාන ප්‍රතිඵලයන් විශ්ලේෂණය සමාප්ත කිරීම සඳහා, 12 වන රූපය එක් එක් දර්ශකය සඳහා වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාතයන් ඉදිරිපත් කරයි. වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාතය අනුරූප දර්ශකයෙන් විහීනතාවයට පත්වී ඇති සම්පූර්ණ ජනගහනයේ ප්‍රතිශතය ඔවුන් දුප්පත් වීම හෝ නොවීම නොසලකා පෙන්වනු ලබයි.

12 වන රූපය පෙන්වන ආකාරයට, ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් සඳහා ඇති ප්‍රවේශය සඳහා වන විහීනතාව (ජනගහනයෙන් සියයට 65.8 ක් මෙම දර්ශකයෙන් විහීනතාවයට පත්වී සිටියි), ආහාර පිසීමේ ඉන්ධන (58.4%), වත්කම් (38.9%) සහ ආසන්නම බස් නැවතුමට හෝ ප්‍රාථමික හෝ ද්විතීයික පාසලකට ළඟා වීම ආදී පෙර සඳහන් කළ මූලික පහසුකම් සඳහා ප්‍රවේශය (34.3%) යන දර්ශකයන් ඉහළම විහීනතාවයන් සහිත වේ. අනෙක් අතට සමහර දර්ශකයන් බෙහෙවින් අඩු විහීනතා අනුපාතයන් පෙන්වයි. විශේෂිත වශයෙන් සියළුම දර්ශකයන් අතර අවම විහීනතාව පාසල් යාම (2.3%) වන අතර සනීපාරක්ෂාව (2.6%) සහ නිදන්ගත රෝග (4.1%) යන දර්ශකයන් ගෙන්ද සාපේක්ෂව අඩු ජනතාවක් විහීනතාවයට පත්වී ඇත.

**12 රූපය:** වාරණය නොකළ ජාතික ජනගහන දරිද්‍රතා අනුපාතයන්



## 2.2.3. ප්‍රතිඵලයන්හි දෘඪතාව සහ සමතිරික්තතා විශ්ලේෂණය


මෙම අවසාන කොටසේදී තෝරා ගත් k-අගය (දරිද්‍රතා සීමාව) සඳහා, සහ සලකා බලන ලද සහ එක් එක් මානයන් සඳහා වෙනස් ලෙස බර තබන ලද වෙනස් ව්‍යුහයන් සඳහා දෘඪතා පරීක්ෂාවන් සමග සමතිරික්තතා විශ්ලේෂණය විස්තර කෙරේ. ඉහත කොටස්හි ඉදිරිපත් කරන ලද ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයන්හි ප්‍රතිඵල, සලකා බලන ලද දරිද්‍රතා රේඛාව (k = 33%) වෙනස් කළවිට පවා සහ මානයන්, එබැවින් දර්ශකයන්ට වැඩි හෝ අඩු බර තැබීම් සහිත විට එහි සංකල්පමය වෙනස්වීම් වලට එතරම් සංවේදී නොවන බව මෙම විශ්ලේෂණය තහවුරු කරයි.

### විකල්ප දරිද්‍රතා සීමාවන්ට සහ මානයන් සඳහා විකල්ප බර තැබීම් වලට දෘඪතාව

13 වන රූපය දරිද්‍රතා සීමාවේ විවිධ මට්ටම් සඳහා එක් එක් දිස්ත්‍රික්කයන්හි H අගය (ජනගහන දරිද්‍රතාව) ප්‍රස්තාර ගත කරයි. මෙම රූපයේ ඡේදනය වන රේඛාවන් මගින් ගත හැකි සියළුම k සීමාවන් සඳහා ජාතික දරිද්‍රතාව අනුව දිස්ත්‍රික්ක අතර පෙළ ගැස්වීම නිරවුල් නොවන බව පෙන්වයි. කෙසේ වෙතත් බොහෝ රේඛා ඡේදනය නොවේ. සියයට 1 සිට සියයට 52 දක්වා ඇති සෑම දරිද්‍රතා සීමාවක් සඳහාම කොළඹ දිස්ත්‍රික්කය සියළුම දිස්ත්‍රික්කයන් අතර අඩුම දරිද්‍රතාව සහිත බවද අපට දැකගත හැකි වෙයි. එබැවින් කොළඹ දිස්ත්‍රික්කයේ බහුමාන දරිද්‍රතාවේ සාමාන්‍ය පැතිර ප්‍රමාණය මෙම සීමාව තුළ තෝරාගත් දරිද්‍රතා සීමාවේ බලපෑමෙන් ස්වායත්තව දිවයිනේ අඩුම අගය ගනියි.

සාමාන්‍ය වශයෙන්, මෙහි අනෙක් පස සියයට 1 සිට සියයට 52 දක්වා ඇති සෑම දරිද්‍රතා සීමාවක් සඳහාම බහුමාන දරිද්‍රතාවේ උපරිම සාමාන්‍ය පැතිර ප්‍රමාණය සහිත නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා සත්‍ය වේ. සියයට 1 සිට සියයට 50 දක්වා ඇති සෑම දරිද්‍රතා සීමාවක් සඳහාම දිවයිනේ ජාතික බහුමාන දරිද්‍රතාවේ අඩුම සාමාන්‍ය පැතිර ප්‍රමාණය සහිත දිස්ත්‍රික්ක දෙක ලෙස කොළඹ දිස්ත්‍රික්කය සහ ගම්පහ දිස්ත්‍රික්කය හඳුනා ගැනේ. සියයට 60 ත් සියයට 63 ත් අතර ජාතික බහුමාන දරිද්‍රතාවෙන් ඉහළම සිටින්නේ නුවරඑළිය, බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන් වේ.

**13 රූපය:** විවිධ දරිද්‍රතා තීරක k අගයයන් සඳහා දිස්ත්‍රික් දරිද්‍රතා අනුපාතයන්




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය ශ්‍රී ලංකාවේ ජනගහනයේ නියැදියක් මත පිහිටා ඇත යන සත්‍යය මත එය සැම විටම නියැදි දෝෂයට යටත් වේ. දිස්ත්‍රික්ක ඔවුන්ගේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව පෙළ ගැස්වීමේ දෘඪතාව තක්සේරු කිරීමේදී සම්මත දෝෂයන් සලකා බැලීම වැදගත් වේ. මේ සඳහා අපි මුලින්ම තෝරාගත් සියයට 33 හි දරිද්‍රතා සීමාව, මාන තුන සඳහා සමාන බර තැබීම්, සහ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ සම්මත දෝශයන්ට[9] වග වීම සමග සෑම දිස්ත්‍රික්කයන් යුගලකම ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක අගයයන් සසඳමු. ඉන් පසුව 1) පළමුවන දිස්ත්‍රික්කය දෙවන දිස්ත්‍රික්කයට වඩා දුප්පත්ද, 2) දෙවන දිස්ත්‍රික්කය පළමුවන දිස්ත්‍රික්කයට වඩා දුප්පත්ද, හෝ 3) වඩා දුප්පත් වන්නේ කුමන දිස්ත්‍රික්කයද කියා සංඛ්‍යානමය වශයෙන් තීරණය කළ නොහැකිද ලෙස පැනවීමට හැකිදැයි කියා විමසමු. මෙම දිස්ත්‍රික්ක පෙළ ගැස්වීම පදනම ලෙස ගනු ලැබේ. ඉන් පසු අපි දරිද්‍රතා සීමාව සියයට 30 ට සහ සියයට 40 ට සහ මාන බර තැබීමේ පහත දැක්වෙන යෝජනාවට අනුව දෘඪතා පරීක්ෂාවන් සිදු කරමු.

අපි එම තෝරාගත් බර තැබීමේ යෝජනාව යටතේ විකල්ප දරිද්‍රතා සීමාවන් k=30% සහ k=40% සඳහා දිස්ත්‍රික් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය ඇස්තමේන්තු කරමු. පදනමට අනුව ලැබූ දිස්ත්‍රික්ක පෙළ ගැස්වීම එහිදී වෙනස් නොවූයේ නම් අපි යුගල වශයෙන් කළ සංසන්දනය කිරීම දෘඪ ලෙස සලකමු. දිස්ත්‍රික්ක හරහා ජාතික බහුමාන දරිද්‍රතා මට්ටම් වල යුගල වශයෙන් කළ සංසන්දනය කිරීම් 300 කින් අඩක් (51.33%) පදනම මත නිශ්චිතව වෙනස් බව, සහ සියයට 80 ක් පමණ විකල්ප සීමාවන් යටතේද නිශ්චිතව වෙනස් බව, සහ දුප්පත්ම කුමක්ද ලෙස ඇති පෙළ ගැස්වීම එසේම පවතින බවද හෙළිවිය. මේ අනුව දරිද්‍රතා සීමාවේ වෙනස් කිරීම් වලට එදිරිව ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව දිස්ත්‍රික්ක පෙළ ගැස්වීම විශාල වශයෙන් ස්ථාවරව පවතින බව පෙනී යයි.

දැන් මාන බර තැබීමේ යෝජනාවට එදිරිව දිස්ත්‍රික්ක පෙළ ගැස්වීමේ ස්ථාවරත්වය දෙසට හැරෙමින්, පදනම (k=33% සහ එක් එක් මානය මත 33% ක් බැගින් බර තැබූ), සහ විකල්ප බර තැබීමේ යෝජනාවන්ට යටත්ව ලබාගත් පෙල ගැස්වීම් අතර සම්බන්ධතාව පරීක්ෂා කිරීම සඳහා ඉහත ආකාරයේම යුගල වශයෙන් කළ සංසන්දනය කිරීමේ පරීක්ෂාවන් සිදු කරමු. එක් මානයකට සියයට 50 ක් සහ අනිත් දෙකට සියයට 25 බැගින් ලබා දෙන පෙර විස්තර කරන ලද විකල්ප යෝජනාවන් තුන අපි මෙහිදී සලකමු.

9 මෙම තොරතුරු දැනටමත් පෙර කොටසේ 4 වන වගුවේ දක්වා ඇත.



ඉන් පසුව, අපි ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට සහ විකල්ප බර තැබීම් ව්‍යුහයන් සහිත ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක තුනට අනුව දිස්ත්‍රික්ක පෙළ ගැස්වීම සංසන්දනය කරමු. මෙහි ප්‍රතිඵල, ජාතික බහුමාන දරිද්‍රතා ව්‍යුහයට අනුව සැලකිය යුතු ලෙස වෙනස් වන යුගල වශයෙන් කළ සංසන්දනයන්ගෙන් සියයට 82.5 ක්, සෞඛ්‍යය දර්ශකයට සියයට 50 ක බර තැබීමක් සහිත විටද, දුප්පත්ම දිස්ත්‍රික්කයන් සමානවී සැලකිය යුතු ලෙස වෙනස් වෙන බව පෙන්වයි. මෙම ප්‍රතිශතය අධ්‍යාපනය මානයට සියයට 50 ක් බර තැබූ විට සියයට 84.4 ක් දක්වාද, ජීවන තත්වය මානයට සියයට 50 ක් බර තැබූ විට සියයට 90.3 දක්වාද ඉහළ යයි. මෙම ප්‍රතිඵල, මානයන් සඳහා බර තැබීමේ ව්‍යුහය වෙනස් කරන විට දිස්ත්‍රික් මට්ටමට ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ පෙළ ගැස්වීම ස්ථාවරව පැවතීමේ සහ බොහෝ විට පවත්වාගෙන යාමේ ප්‍රබලත්වය පෙන්වයි.[10]

ඉහත යුගල වශයෙන් පෙළ ගැස්වීමේ විශ්ලේෂණය වඩාත්ම විශ්වාස කටයුතු විශ්ලේෂණය වන අතර ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ දෘඪතාව පරීක්ෂා කිරීම සඳහා භාවිතා කරන විශ්ලේෂණයද එය වෙයි. කෙසේ වෙතත්, සමහර පරිශීලකයින්ට ශ්‍රේණිගත කිරීමේ සහසම්බන්ධතාවන් වඩාත් සමීප විය හැකි බැවින්, නියැදි දෝෂය නොසලකා හරින බැවින් ශ්‍රේණිගත කිරීමේ සහසම්බන්ධතාවන් නිරවද්‍ය බවින් අඩු බවද සිහි කරමින් අපි එම විශ්ලේෂණයද පහතින් ඉදිරිපත් කරමු.

7 වන වගුව තෝරාගත් දරිද්‍රතා සීමාව, k=33%, සහ විකල්ප දරිද්‍රතා සීමාවන් 30%, 35%, 40%, 45%, සහ 50% යොදා ගනිමින් සිදු කළ දිස්ත්‍රික්ක පෙළ ගැස්වීම සඳහා ස්පියර්මන් සහ කෙන්ඩල් ටෝ-බී ශ්‍රේණිගත කිරීමේ සහසම්බන්ධතා සංගුණකයන් ඉදිරිපත් කරයි. k=30% සහ k=50% අතර විකල්ප දරිද්‍රතා රේඛාවන් සඳහා ස්පියර්මන් සංගුණකය 0.8 ඉක්මවයි. k=30% සහ k=50% අතර එක් එක් අගයන් සඳහා 0.7 ඉක්මවා යමින් සහ k=30% සහ k=35% සඳහා 0.9 දක්වා ඉහළ යමින්[11] කෙන්ඩල් ටෝ-බී සංගුණකයද සමාන ප්‍රතිඵල ලබා දෙයි. මෙයින් ගම්‍ය වන්නේ අපි 30% සහ 50% අතර විකල්ප දරිද්‍රතා රේඛාවන් සැලකූ විට, දරිද්‍රතා සීමාව, k=33% යොදා ගත් විට ඔවුන් වාර්තා කළ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව සිදුකළ දිස්ත්‍රික්ක ශ්‍රේණිගත කිරීම විශාල දුරකට (අවම වශයෙන් සියයට 70 ක අවස්ථාවන්හිදී) ආරක්ෂිතව පවතින බවයි.

**7 වගුව:** විවිධ දරිද්‍රතා සීමාවන් සඳහා දිස්ත්‍රික්ක ශ්‍රේණිගත කිරීම් අතර සහසම්බන්ධතාව

| | | k = 33% |
|---|---|---|
| k = 30% | ස්පියර්මන් | 0.995 |
| | කෙන්ඩල් ටෝ-බී | 0.967 |
| k = 35% | ස්පියර්මන් | 0.982 |
| | කෙන්ඩල් ටෝ-බී | 0.913 |
| k = 40% | ස්පියර්මන් | 0.941 |
| | කෙන්ඩල් ටෝ-බී | 0.807 |
| k = 45% | ස්පියර්මන් | 0.907 |
| | කෙන්ඩල් ටෝ-බී | 0.767 |
| k = 50% | ස්පියර්මන් | 0.872 |
| | කෙන්ඩල් ටෝ-බී | 0.713 |

මූලාශ්‍රය: 2019 ගෘහවීකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

අපි මානයන්ගේ බර තැබීම ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයෙහි යොදාගත් සමාන බර තැබීමෙන් (එක් එක් මානයට තුනෙන් එකක් හෝ සියයට 33 ක් බැගින් බර තැබීමෙන්) වෙනස් කළ විට දිස්ත්‍රික් ශ්‍රේණිගත කිරීම සැසඳීමද විශ්ලේෂණය කරමු. ඒ සඳහා එක් මානයකට සියයට 50 ක් සහ අනිත් දෙකට සියයට 25 බැගින් ලබා දෙන විකල්ප ව්‍යුහයන් තුන අපි මෙහිදී සලකන අතර මානයන් හරහා බර තැබීමේ සංයෝජනයන් හතර සඳහා ස්පියර්මන් සහ කෙන්ඩල් ටෝ-බී ශ්‍රේණිගත කිරීමේ සහ-සම්බන්ධතා සංගුණකයන් ගණනය කරමු. මෙම විශ්ලේෂණය ස්පියර්මන් සංගුණකය 0.8 ඉක්මවන බවද, කෙන්ඩල් ටෝ-බී සංගුණකයද 0.7 ඉක්මවන බවද හෙළි කරයි (8 වන වගුව). මෙම ප්‍රතිඵලය අපි විකල්ප මාන-බර තැබීමේ ව්‍යුහයන් සැලකූ විට, මාන තුනටම සමාන බර තැබීම යොදා ගත් විට ඔවුන් වාර්තා කරන ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව සිදුකළ දිස්ත්‍රික්ක ශ්‍රේණිගත කිරීම විශාල දුරකට (අවම වශයෙන් සියයට 70 ක් අවස්ථාවන්හිදී) ආරක්ෂිතව පවතින බවද හෙළිකරයි.

10 මෙම ප්‍රතිපලයන්හි සාරාශයක් සඳහා උපග්‍රන්ථයේ ඇති 19 වන වගුව බලන්න

11 බද්ධ ශ්‍රේණි සඳහා වග වන බැවින් කෙන්ඩල් ටෝ-බී ශ්‍රේණිගත කිරීමේ සහ-සම්බන්ධතාව සැම විටම ස්පියර්මන්ට වඩා අඩුවේ.

**8 වගුව:** විවිධ බර තැබීම් ව්‍යුහයන් සඳහා දිස්ත්‍රික්ක ශ්‍රේණිගත කිරීම් අතර සහසම්බන්ධතාව

| | | ශ්‍රේණිගත කිරීමේ සහසම්බන්ධතා සංගුණකයන් | ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක | | |
|---|---|---|---|---|---|
| | | | බර තැබීම 1 | බර තැබීම 2 | බර තැබීම 3 |
| අ = අධ්‍යාපනය | | | 33% අ | 50% අ | 25% අ |
| ස = සෞඛ්‍යය | | | 33% ස | 25% ස | 50% ස |
| ජී = ජීවන තත්වය | | | 33% ජී | 25% ජී | 25% ජී |
| ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක බර තැබීම 2 | 50% අ | ස්පියර්මන් | 0.941 | | |
| | 25% ස | | | | |
| | 25% ජී | කෙන්ඩල් ටෝ-බී | 0.813 | | |
| ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක බර තැබීම 3 | 25% අ | ස්පියර්මන් | 0.963 | 0.899 | |
| | 50% ස | | | | |
| | 25% ජී | කෙන්ඩල් ටෝ-බී | 0.860 | 0.753 | |
| ජාතික බහුමාන දරිද්‍රතා දර්ශක බර තැබීම 4 | 25% අ | ස්පියර්මන් | 0.968 | 0.862 | 0.945 |
| | 25% ස | | | | |
| | 50% ජී | කෙන්ඩල් ටෝ-බී | 0.887 | 0.713 | 0.840 |

මූලාශ්‍රය: 2019 ගෘහවීකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

## සමතිරික්තතා විශ්ලේෂණය

එක් එක් දර්ශකයන් නව තොරතුරු හඳුන්වා දෙන්නේද යන්නද මග නොහැරිය හැකි අවසාන පැනයක් වෙයි. උදාහරණයක් ලෙස, පාසල් කාලය සහ පාසල් යාම සඳහා එකම වාරණය නොකළ ජනගහන අනුපාතය පවතින අතර විහීනතාවයට පත්වී ඇත්තේද එම පුද්ගලයින්ම විය හැකි තත්වය සළකමු. මෙය සිදුවී ඇත්තේ නම්, එවිට සකසුරුවම සලකා, අපිට කිසිදු තොරතුරු හානියකින් තොරව එක් දර්ශකයක් ඉවත් කළ හැකි විය යුතු වේ. පහත 9 වන වගුව සමතිරික්තතා පරීක්ෂාවක ප්‍රතිඵල දක්වයි. එහි අන්තර්ගතයන් සත්‍ය වශයෙන්ම විහීනතාවයට පත්ව ඇති, දර්ශකයන් දෙකෙන්ම විහීනතාවයට පත්විය හැකිව ඇති පුද්ගලයින්ගේ ප්‍රතිශතයන් පෙන්වයි. උදාහරණයක් ලෙස, සනීපාරක්ෂාව සහ පාසල් යාම සලකමු (12 වන රූපය බලන්න). එක් එක් දර්ශකයෙන් සියයට 2 කට මදක් වැඩි පුද්ගලයින් ප්‍රතිශතයක් දරිද්‍රතාවයට පත්වී ඇත. මෙම පුද්ගලයින් හරියටම එකම පුද්ගලයින් වන බවට අපිට සැක කළ හැකිය. එසේ වන්නේ නම්, එවිට යටින් ඉරි ඇඳි අගයන් සහිත කොටු තුළ 1.0 සඳහන්ව තිබිය යුතු වේ. නමුත් සත්‍ය වශයෙන්ම පවතින්නේ 0.062 වේ. මෙයින් අදහස් වන්නේ සනීපාරක්ෂාව සහ පාසල් යාම යන දෙකෙන්ම විහීනතාවයට පත්විය හැකි පුද්ගලයින් ගෙන් සත්‍ය වශයෙන්ම එම දෙකෙන්ම විහීනතාවයට පත්ව ඇත්තේ සියයට 6.2 ක් පමණක් බවයි. සියළුම දර්ශකයන් තුළ, ආහාර පිසීමේ ඉන්ධන සහ සෞඛ්‍යය පහසුකම් සඳහා ප්‍රවේශය යන දෙකෙන්ම විහීනතාවයට පත්විය හැකි පුද්ගලයින් ගෙන් එම දෙකෙන් සත්‍ය වශයෙන්ම විහීනතාවයට පත්ව ඇත්තේ සියයට 83.4 ක් පමණක් වේ. එක් එක් දර්ශකය විසින් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අළුතෙන් තොරතුරු එකතු කරන බව මෙම වගුව තුළින් අපට පැහැදිලිවේ.

**9 වගුව:** ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය - වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්හි සමතිරික්තතා විශ්ලේෂණය (ආර්$_0$ මිණුම)

| | පාසල් කාලය | පාසල් යාම | නිදන්ගත රෝග | සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | නිවාස | සනීපාරක්ෂාව | පානීය ජලය | ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | වත්කම් | මූලික පහසුකම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් කාලය | 1.000 | | | | | | | | | |
| පාසල් යාම | 0.383 | 1.000 | | | | | | | | |
| නිදන්ගත රෝග | 0.449 | 0.056 | 1.000 | | | | | | | |
| සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | 0.389 | 0.169 | 0.153 | 1.000 | | | | | | |
| නිවාස | 0.499 | 0.133 | 0.081 | 0.328 | 1.000 | | | | | |
| සනීපාරක්ෂාව | 0.432 | 0.062 | 0.055 | 0.213 | 0.350 | 1.000 | | | | |
| පානීය ජලය | 0.760 | 0.729 | 0.667 | 0.758 | 0.804 | 0.816 | 1.000 | | | |
| ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | 0.759 | 0.631 | 0.712 | 0.834 | 0.811 | 0.763 | 0.712 | 1.000 | | |
| වත්කම් | 0.534 | 0.475 | 0.498 | 0.510 | 0.732 | 0.640 | 0.692 | 0.690 | 1.000 | |
| මූලික පහසුකම් | 0.441 | 0.393 | 0.375 | 0.826 | 0.567 | 0.399 | 0.702 | 0.724 | 0.460 | 1.000 |
| වාරණය නොකළ ජන. දරි. අනුපාතය | 0.254 | 0.023 | 0.041 | 0.154 | 0.075 | 0.026 | 0.658 | 0.584 | 0.389 | 0.343 |

මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

10 වන වගුව දුප්පත් ජනගහනය සඳහා මෙම විශ්ලේෂණය නැවත සිදු කරයි. දුප්පත් පුද්ගලයින් හඳුනා ගනු ලබන්නේ ඔවුන් බහුවිධ විහීනතාවයන් ගෙන් පෙළෙන නිසා බැවින් අපි මෙම වගුවේ සමහර විචල්‍යයන් සඳහා වැඩි සමතිරික්තතාවක් අපේක්ෂා කරමු. සත්‍ය වශයෙන්ම එය ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන, සහ සෞඛ්‍යය පහසුකම් සඳහා වඩා වැඩි අගයන් ගනියි. ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන සඳහා බොහෝ ඉහළ වාරණය කළ ජනගහන අනුපාතයන් පැවතීම සහ සෞඛ්‍යය පහසුකම් සඳහා බර තැබීම ඉහළ වීම නිසා මෙම අපසරණයන් අපේක්ෂා කළ යුතු වන අතර, එබැවින් මෙම දර්ශකයන් නුසුදුසු ලෙස නම් කළ යුතු නොවේ.

**10 වගුව:** ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය - වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්හි සමතිරික්තතා විශ්ලේෂණය (ආර්$_0$ මිණුම)


| | පාසල් කාලය | පාසල් යාම | නිදන්ගත රෝග | සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | නිවාස | සනීපාරක්ෂාව | පානීය ජලය | ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | වත්කම් | මූලික පහසුකම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් කාලය | 1.000 | | | | | | | | | |
| පාසල් යාම | 0.473 | 1.000 | | | | | | | | |
| නිදන්ගත රෝග | 0.611 | 0.069 | 1.000 | | | | | | | |
| සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | 0.692 | 0.208 | 0.237 | 1.000 | | | | | | |
| නිවාස | 0.657 | 0.159 | 0.121 | 0.690 | 1.000 | | | | | |
| සනීපාරක්ෂාව | 0.661 | 0.135 | 0.126 | 0.509 | 0.580 | 1.000 | | | | |
| පානීය ජලය | 0.838 | 0.836 | 0.772 | 0.846 | 0.877 | 0.905 | 1.000 | | | |
| ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | 0.905 | 0.705 | 0.893 | 0.933 | 0.903 | 0.932 | 0.900 | 1.000 | | |
| වත්කම් | 0.667 | 0.555 | 0.633 | 0.727 | 0.846 | 0.829 | 0.812 | 0.901 | 1.000 | |
| මූලික පහසුකම් | 0.756 | 0.469 | 0.525 | 0.898 | 0.822 | 0.686 | 0.840 | 0.921 | 0.767 | 1.000 |
| වාරණය කළ ජන. දරි. අනුපාතය | 0.084 | 0.018 | 0.026 | 0.119 | 0.035 | 0.011 | 0.135 | 0.145 | 0.102 | 0.126 |

මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්



# 3

# ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය



ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් වයස අවුරුදු 18 ට අඩු ළමයින් වේ. වසර 2019 දී, මිලියන 5.9 ක් වන ළමා ජනගහනයෙන් ආසන්න වශයෙන් එක් මිලියනයක් මූල්‍යමය දරිද්‍රතාවයෙන් යුතුව සිය දිවි ගෙවයි. නමුත්, උදාහරණයක් ලෙස, ඔවුන් ඒ අතරම සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස සහ පානීය ජලය, වැනි වෙනත් මානයන්ගෙන්ද පීඩාවට පත්වෙමින් ඇත්දැයි අපි නොදනිමු. එබැවින්, ළමා දරිද්‍රතාව එහි සියළුම මානයන් සඳහා ප්‍රමාණනය කිරීම සහ ඊට නිසි ප්‍රතිකර්ම යෙදීම ඉතා වැදගත් වන අතර, තිරසර සංවර්ධන අරමුණු වල ප්‍රථම අරමුණෙහි ඉලක්කයක් ලෙස ළමා දරිද්‍රතාව පිටු දැකීම නිශ්චිත ලෙස හඳුන්වාදී තිබීම එහි වැදගත්කම තවත් ඉස්මතු කරමින් පෙන්වයි.

ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය වයස අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමා ජනගහනය එල්ල කර සිදු කරන සංර්ධන කටයුතු මෙහෙයවීම සඳහා වන ප්‍රතිපත්ති මෙවලමක් වේ. එය වයස අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමුන් අතර පවතින තනි පුද්ගල දරිද්‍රතාව ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට කෙලින්ම සම්බන්ධිත හා සංගත වන ලෙස, සහ ළමයින්ට සුවිශේෂී වන විහීනතාවයන් දෘශ්‍යමාන කරවන ලෙස ප්‍රමාණනය කරයි. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය පළමුව, ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ මානයන් තුනට අනුව ළමයා අත්විඳිනා සියළුම දරිද්‍රතාවන් හසුකර ගනියි. දෙවනුව, එය එක් එක් ළමයා ඒ අතරම අත්විඳිනු ලබන ළමුන් සඳහා සුවිශේෂී වන විහීනතා දර්ශකයන් කට්ටලයක්ද තවත් එක් මානයක් තුළින් හසුකර ගනියි. එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව දරිද්‍රතාවෙන් පෙළෙන ඕනෑම ළමයෙක් ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුවද දරිද්‍රතාවෙන් පෙළෙයි. අමතරව, ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය දරිද්‍රතාවෙන් නොපෙළෙන ගෘහඒකකයන් තුළ වෙසෙන ප්‍රතිපත්තිමය අවධානය අවශ්‍ය වන තවත් බොහෝ ළමයින් වෙන් වෙන් වශයෙන් හඳුනා ගනියි. ඒ අතරම මේ වන විට දරිද්‍රතාවේ තීව්‍රතාවයට සහ සංයුතියටද ළමුන් සඳහා සුවිශේෂී වන විහීනතාවයන් ඇතුලත්ව ඇත. එක් එක් ළමයින් සඳහා ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය විශ්ලේෂණය කිරීමේදී දුප්පත් ළමයින් අත්විඳිනා විවිධ විහීනතාවයන් වෙන් වෙන්ව පෙනෙන  අතර වයස් කාණ්ඩ හරහා, සහ ගැහැණු හා පිරිමි ළමුන් අතර ඇති විෂමතාවන් තුළටද එය එබී බලයි.




# 3.1. ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ සැලැස්ම

ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය මෙන්ම ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයද 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත ගොනුව මත පදනම් වී ගණනය කර ඇත. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය මානයන් හතරකින් (අධ්‍යාපනය, සෞඛ්‍යය, ජීවන තත්වය, සහ ළමා සංවර්ධනය) සහ අනුරූප දර්ශකයන් දොළහකින් සමන්විත වේ (14 වන රූපය බලන්න). පළමු මානයන් තුන ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට හරි සමාන වන අතර ඒවා ගෘහඒකකයේ විහීනවීම් ආවරණය කරයි.

4 වන මානය මුල් ළමා වියේ විහීනතාවයන්: පෝෂණ ඌනතාව (අඩු බර ඇති හෝ වයසට සරිලන උස නොමැති වීම) සහ මුල් ළමාවිය සංවර්ධනය ප්‍රමාණනය කරයි. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය විසින් පරීක්ෂා කර බලනු ලබන දර්ශකයන් ශ්‍රී ලංකාවේ සංදර්භය නියෝජනය කිරීම සඳහා යෝග්‍ය වන ලෙස පුළුල් පරාසයක රාජ්‍ය නිලධාරීන්, සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ප්‍රමුඛ ජාත්‍යන්තර සංවිධාන සමග යෙදුන දීර්ඝ උපදෙස් ලබා ගැනීමේ සාකච්ඡා තුළින් තෝරා ගනු ලැබ ඇත.

**14 රූපය:** ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ ව්‍යුහය



මුල් ළමාවිය සංවර්ධනය යොමු වන්නේ ළමයින්ගේ සෞඛ්‍ය සම්පන්න භෞතික හා සංජානන සංවර්ධනය අවහිර කරන ආකාරයේ වයස-විශේෂිත දරිද්‍රතාවන් වෙතයි. මුල් ළමාවිය සංවර්ධන දර්ශකය විවිධ වයස් වල පසුවන දරුවන් සඳහා වෙනස් වෙනස් ලෙස අර්ථ දක්වා ඇති අතර ළමයින් වයසින් වැඩි වන විට දර්ශකයන් සංඛ්‍යාවද වැඩි වෙයි.

- **මාස 5 ක් හෝ ඊට අඩු වයසැති** දරුවන් ඔවුන්ගේ ජීව විද්‍යාත්මක දෙමව්පියන් සමග නොවෙසෙන්නේ නම් හෝ ඔවුන් පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හැරදා ගොස් සිටියේ නම් ඔවුන් මුල් ළමාවිය සංවර්ධන දර්ශකයෙන් විහීන තත්වයට පත් වූවා වෙයි.

- **මාස 6 ත් 11 ත් අතර වයසැති** දරුවන් ඉහත සඳහන් එක් තත්වයකට හෝ පත්ව සිටින්නේ නම් හෝ නිවසේ ඔවුන් සතුව මෘදු ක්‍රීඩා භාණ්ඩ නොමැති නම් හෝ ඔවුන්ගේ ස්වකීය ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ සහය නොලැබෙන්නේ නම් ඔවුන් විහීන තත්වයට පත් වූවා වෙයි.

- **අවුරුදු 1 ත් 3 ත් අතර වයසැති** දරුවන් ඉහත මාස 5 හෝ ඊට අඩු වයසැති දරුවන් සඳහා අදාල වන එක් තත්වයකට හෝ පත්ව සිටින්නේ නම් හෝ නිවසේ ඔවුන් සතුව මෘදු ක්‍රීඩා භාණ්ඩ සහ පොත් නොමැති නම් හෝ ඔවුන්ගේ ස්වකීය ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ සහය නොලැබෙන්නේ නම් ඔවුන් විහීන තත්වයට පත් වූවා වෙයි.

- **අවුරුදු 4 ක් වයසැති** දරුවන් ඉහත අවුරුදු 1 ත් 3 ත් අතර වයසැති දරුවන් සඳහා අදාල වන එක් තත්වයකට හෝ පත්ව සිටින්නේ නම් හෝ ඔවුන් පෙරපාසල් නොයන්නේ නම් ඔවුන් විහීන තත්වයට පත් වූවා වෙයි.

ඊට අමතරව, ළමයෙකු අඩු බර ඇති හෝ වයසට සරිලන උසකින් තොර නම් ඔහු හෝ ඇය නිසි පෝෂණයෙන් විහීන තත්වයට පත් වූවා වෙයි. මෙම දර්ශකයන් සහ ඒවාහි දරිද්‍රතා සීමාවන් සම්බන්ධ විස්තරාත්මක තොරතුරු 11 වන වගුවේ දක්වා ඇත.

ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ඇති ලෙසම ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේද සෑම මානයකටම සමානව බර තබන අතර ළමා සංවර්ධන මානය තුළ ඇති දර්ශකයන් දෙකටද සමාන ලෙස බර තබා ඇත. වයස අවුරුදු 4 හා ඊට අඩු වයසැති ළමයකු සියයට 25 ක දරිද්‍රතා සීමාවට [12] අනුරූප වන ලෙස අවම වශයෙන් එක් මානයකින් හෝ විහීනතාවයට පත්වී ඇත්නම් ඔහු හෝ ඇය බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන අයකු ලෙස හඳුනා ගනු ලැබේ. මෙයින් ගම්‍ය වන්නේ, දැනටමත් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව දරිද්‍රතාවයෙන් පෙළෙන සෑම ළමයකුම

12 ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය මාන තුනකින් සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය මාන හතරකින් සමන්විත වන බැවින් ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා සියයට 25 න සීමාවක් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ සියයට 33 න සීමාවක් භාවිතා කර බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන ලෙස හඳුනා ගනු ලැබූ ළමා ජනගහනයට අනුරූප වේ.



ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුවද දරිද්‍රතාවයෙන් පෙළෙන බවයි. අමතර වශයෙන්, නව දර්ශකයන් දෙකෙන්ම හෝ එකකින් විහීනතාවයට පත්වී ඇති බැවින් දරිද්‍රතාවෙන් නොපෙළෙන ගෘහඒකක වල වෙසෙන තවත් බොහෝ ළමයින්ද දරිද්‍රතාව තුළට ඇතුල් වෙයි.

**11 වගුව:** ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා මාන, දර්ශක, සහ බර තැබීම් (වසර 4 හෝ ඊට අඩු වයසැති ළමුන්)

| | ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය (වසර 4 හෝ ඊට අඩු වයසැති ළමුන්) | | | |
|---|---|---|---|---|
| | මානය | දර්ශකය | විහිනවීමේ සීමාව: වසර 4 හෝ ඊට අඩු වයසැති ළමයෙක් විහීන තත්වයට පත්වීමට නම් ..... | බර තැබීම |
| ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට හර සමාන දර්ශක | අධ්‍යාපනය (1/4) | පාසල් කාලය | ඔවුන් පාසල් යන කාලයේ පැවති අනිවාර්ය මට්ටමට අඩු පාසල් මට්ටමක් සහිත හෝ කිසිදා පාසල් නොගිය, හෝ විශේෂ අධ්‍යාපනය ලබන වයස අවු. 17 හෝ ඊට වැඩි එක් සාමාජිකයෙක් හෝ ගෘහඒකකයේ සිටියි | 1/16 |
| | | පාසල් යාම | පාසල් යන වයසේ (අවුරුදු 5-16) සිටින පාසල් නොයන එක් ළමයෙක් හෝ ගෘහඒකකයේ සිටියි | 3/16 |
| | සෞඛ්‍යය (1/4) | නිදන්ගත රෝග | එක් මසක් හෝ වැඩි කාලයකට ඔවුන්ගේ සාමාන්‍ය කටයුතු හෝ රැකියාව නතර කිරීමට තරම්වූ නිදන්ගත රෝගයකින් පීඩා විඳින එක් සාමාජිකයෙක් හෝ ගෘහඒකකයේ සිටියි | 1/8 |
| | | සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | ගෘහඒකකයේ සිට සෞඛ්‍ය පහසුකම් සඳහා ළඟා වීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගතවේ | 1/8 |
| | ජීවන තත්වය (1/4) | නිවාස | ගෘහඒකකයේ බිත්ති, ගෙබිම හෝ වහල සඳහා ස්ථිර නොවන ද්‍රව්‍ය යොදා ගෙන ඇත | 1/24 |
| | | සනීපාරක්ෂාව | ගෘහඒකකයේ පහසුකම වැඩි දියුණු නොකළ හෝ පහසුකම වෙනත් ගෘහඒකකයක් සමග හවුලේ ඇති | 1/24 |
| | | පානීය ජලය | ගෘහඒකකයට ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් නොමැති, හෝ ඒ සඳහා විනාඩි 15 කට සමාන හෝ වැඩි කාලයක් ගතවන හෝ දුර කි.මී. 1 කට වැඩි, හෝ පසුගිය මාසයේ පානීය ජලය ප්‍රමාණවත් නොවූ, හෝ පානීය ජලයේ තත්වය වැඩි දියුණු නොකළ තත්වයේ ඇති | 1/24 |
| | | ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | ගෘහඒකකය ආහාර පිසීම සඳහා දර, භූමිතෙල්, ලී කුඩු හෝ දහයියා යොදා ගනියි | 1/24 |
| | | වත්කම් | ගෘහඒකකයට රූපවාහිනී, සෝදන යන්ත්‍ර, ශීතකරන, පරිගණක, යතුරු පැදි, ත්‍රී රෝද රථ, කාර්, වෑන්, බස්, ලොරි ආදියෙන් එකක් වත් අහිමි සහ ඉඩම්, සත්ව පාලන, කෘෂිකාර්මික/ ධීවර උපාංග (ට්‍රැක්ටර්, පාහින යන්ත්‍ර, සංයුක්ත අස්වනු යන්ත්‍ර, ධීවර බෝට්ටු, මාළු දැල් ආදියෙන් එකකට වැඩියෙන් නොමැති | 1/24 |
| | | මූලික පහසුකම් | ගෘහඒකකයට ආසන්නම බස් නැවතුමට ළඟා වීමට විනාඩි 15 කට සමාන හෝ වැඩි කාලයක් හෝ ප්‍රාථමික හෝ ද්විතීයික පාසලට ළඟා වීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගත වන | 1/24 |
| ළමා සුවිශේෂිත මානය | ළමා සංවර්ධනය (1/4) | පෝෂණය | ඔහු හෝ ඇය අඩු බර ඇති හෝ වයසට සරිලන උසකින් තොර වේ | 1/8 |
| | | මුල් ළමාවිය සංවර්ධනය | ඔහු හෝ ඇය:<br>මාස 5 හෝ ඊට අඩු වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හෝ අවුරුදු 10 ට අඩු වෙනත් ළමයෙකු සමග හැරදා ගොස් සිටියේ නම් හෝ මව්පිය දෙපළම ළමයා සමග නොවෙසේ නම්<br>මාස 6 ත් 11 ත් අතර වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හැරදා ගොස් සිටියේ නම් හෝ නිවසේ ඔවුන් සතුව මෘදු ක්‍රිඩා භාණ්ඩ නොමැති නම් හෝ ඔවුන්ගේ ස්වකීය ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ සහය නොලැබෙන්නේ නම් හෝ මව්පිය දෙපලම ළමයා සමග නොවෙසේ නම්<br>අවුරුදු 1 ත් 3 ත් අතර වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හැරදා ගොස් සිටියේ නම් හෝ නිවසේ ඔවුන් සතුව මෘදු ක්‍රිඩා භාණ්ඩ සහ පොත් නොමැති නම් හෝ ඔවුන්ගේ ස්වකීය ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ සහය නොලැබෙන්නේ නම් හෝ මව්පිය දෙපළම ළමයා සමග නොවෙසේ නම්<br>අවුරුදු 4 ක් වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හැරදා ගොස් සිටියේ නම් හෝ නිවසේ ඔවුන් සතුව මෘදු ක්‍රිඩා භාණ්ඩ සහ පොත් නොමැති නම් හෝ ඔවුන්ගේ ස්වකීය ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ සහය නොලැබෙන්නේ නම් හෝ මව්පිය දෙපළම ළමයා සමග නොවෙසේ නම් හෝ පෙරපාසල් නොයන්නේ නම් | 1/8 |

## 3.2. ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රතිඵල

මෙම කොටසේදී ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ විස්තර 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත ගොනුව මත පදනම්ව ඉදිරිපත් කරනු ලබයි. අපි පළමුව, ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ විසංයෝජනයන් සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව ළමා දරිද්‍රතාවේ පැතිරී ප්‍රමාණය සහ තීව්‍රතාව ඉදිරිපත් කරමු. ඉන් පසුව, අපි එක් එක් නව දර්ශකයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරවමින් ළමයින් එක් එක් දර්ශකයට අනුව දුප්පත් වන්නේ කෙසේදැයි පෙන්වමු. අවසාන කොටසේදී ළමා සංවර්ධන මානයට දෙන ලද බර තැබීම් හා දරිද්‍රතා සීමාවන් වෙනස් කළද ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ආසන්න වශයෙන් සමාන ප්‍රතිපත්ති තොරතුරු සපයන බව පෙන්වනු ලබන දෘඩතා විශ්ලේෂණය, සහ සමතිරික්තතා විශ්ලේෂණය පිළිගන්වයි.



### 3.2.1. දරිද්‍රතා මට්ටම: ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය, H, A

ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව බහුමාන දරිද්‍රතා පැතිරී ප්‍රමාණය සියයට 16 ක් සහ එහි වයස අවුරුදු 4 හෝ ඊට අඩු ළමුන් සඳහා විසංයෝජනය සියයට 14 ක් වන බව මෙහිදී මෙනෙහි කරමු. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව වයස අවුරුදු 4 හෝ ඊට අඩු ළමුන්ගෙන් සියයට 42.2 ක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙයි. ඒ අනුව, ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ප්‍රතිපත්ති අවධානය ලැබිය යුතු තවත් බොහෝ ළමයින් බහුමාන දරිද්‍රතාවෙන් නොපෙළෙන ගෘහඒකක තුළින්ද හඳුනා ගනියි.[13]

දරිද්‍රතාවේ සාමාන්‍ය තීව්‍රතාව, එනම් එක් එක් දුප්පත් ළමයා සාමාන්‍ය වශයෙන් අත්විඳින බර තබන ලද විහීනතා කොටස, සියයට 35.1 ක් වේ. එනම් වයස අවුරුදු 4 හෝ ඊට අඩු එක් එක් දුප්පත් ළමයා, සාමාන්‍ය වශයෙන්, බර තබන ලද දර්ශක වලින් තුනෙන් එකකට වඩා අහිමිතාවට පත්වී ඇති බවයි. සියයට 95 විශ්‍රම්භ මට්ටමකදී දරිද්‍රතා තීව්‍රතාවේ සැබෑ අගය සියයට 34.2 ත් 35.9 ත් අතර පිහිටයි.

13 සියළු නියැදි සමීක්ෂණ ඇස්තමේන්තු වල දෝෂ සීමාවන් පවතින බැවින් වගු වල ඒවාහි 95% විශ්‍රම්භ ප්‍රාන්තර ඇස්තමේන්තූන්ද දක්වා ඇත. ඒ අනුව ළමා ජනගහන දරිද්‍රතාවේ සැබෑ අගය 39.3% සහ 45.1% අතර පවතින බව 95% ක විශ්වාසයකින් යුතුව ප්‍රකාශ කළ හැකි වේ.


DRAYTON
KOTAGAL
DT
1161
PUBG
BATTLEGROUNDS

බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන ළමයින්ගේ ප්‍රතිශතය (දරිද්‍රතා පැතිරී ප්‍රමාණය, H) දුප්පත් ළමයින් මුහුණ දෙනු ලබන විහීනතාවයන්ගේ බර තබන ලද සාමාන්‍ය දායකත්වයෙන් (තීව්‍රතාව, A) ගුණ කිරීමෙන් ගණනය කරනු ලබන ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ අගය 0.148 ක් වේ. මෙම අගයෙන් කියවෙන්නේ වයස අවුරුදු 5 ට අඩු සියළුම ළමයින් සියළුම දර්ශක වලින් විහීනතාවයට පත්වූවහොත් ඔවුන්ට අත්විඳීමට සිදුවන විහීනතාවයෙන් සියයට 14.8 ක විහීනතාවයක් ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන ළමයින් අත්විඳින බවයි. සියයට 95 විශ්‍රම්භ මට්ටමට ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ සැබෑ අගය 0.137 ත් 0.159 අතර පිහිටයි. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය වෙනස්වීම් වලට වඩාත්ම සංවේදී බැවින් එය නිල සංඛ්‍යාතිය වේ.

12 වන වගුව ජනගහන දරිද්‍රතාව හෝ වයස අවුරුදු 5 ට අඩු ළමයින් අතර දරිද්‍රතාවේ ප්‍රමාණය, H, හෝ දරිද්‍රතාවේ පැතිරී ප්‍රමාණය ලෙසද හඳුන්වනු ලබන (හෝ බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන ලෙස හඳුනාගත් අවුරුදු 5 ට අඩු වයසැති ළමයින්ගේ සමානුපාතය), සහ දරිද්‍රතාවේ තීව්‍රතාව (හෝ දුප්පත් ළමයින් විහීනතාවයට පත්වී ඇති දර්ශකයන්ගේ බර තබන ලද සාමාන්‍ය සමානුපාතය, A), ඇතුළු 2019 ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අදාල ප්‍රධාන සංඛ්‍යාති අගයන් පෙන්වයි.


**12 වගුව:** ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය, පැතිරී ප්‍රමාණය, සහ තීව්‍රතා මට්ටම්

| දරිද්‍රතා සීමාව (k) | දර්ශකය | අගය | විශ්‍රම්භ ප්‍රාන්තරය (95%) | |
|---|---|---|---|---|
| k අගය = 33% | ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය | 0.067 | 0.062 | 0.071 |
| | පැතිරී ප්‍රමාණය හෝ ජනගහන දරිද්‍රතාව (H) | 16.0% | 15.0% | 17.1% |
| | තීව්‍රතාව (A) | 41.6% | 41.2% | 42.1% |
| k අගය = 25% | ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය | 0.148 | 0.137 | 0.159 |
| | පැතිරී ප්‍රමාණය හෝ ජනගහන දරිද්‍රතාව (H) | 42.2% | 39.3% | 45.1% |
| | තීව්‍රතාව (A) | 35.1% | 34.2% | 35.9% |

මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදුකළ ගණනය කිරීම්
සටහන: වයස අවුරුදු 5 ට අඩු ළමයින් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 6.6 ක් වේ.

15 වන රූපය අවුරුදු 5 ට අඩු වයසැති ළමයින් අතර දරිද්‍රතා තීව්‍රතාවේ ව්‍යාප්තිය පෙන්වයි. ශ්‍රී ලංකාවේ අවුරුදු 5 ට අඩු වයසැති සියලු දුප්පත් ළමයින්ගෙන් සියයට 60 ක් පමණ සියයට 25 ත් 34.9 ත් අතර වන අඩුම තීව්‍රතා කාණ්ඩය තුළ පිහිටන අතර, දුප්පත් ළමයින්ගෙන් සියයට 10 කට ආසන්න ප්‍රමාණයක් මානයන් 2 කින් හෝ වැඩි ගණනකින් විහීනතාවයට පත්ව (විහීනතා ලකුණු ගණන සියයට 50 ට සමාන හෝ ඊට වැඩි වී) සිටියි. මේ අනුව දුප්පත් ළමයින්ගෙන් වැඩි ප්‍රමාණයක් දරිද්‍රතා රේඛාවට ඉතා ආසන්නව සිටින බැවින් කෙටි කාලීනව හා මධ්‍ය කාලීනව හෝ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය තුළින් තව දුරටත් ඉදිරියට යාම තර්කානුකූල ප්‍රතිපත්ති අරමුණක් වන බව පෙන්වයි. අනිත් අතට, අවුරුදු 5 ට අඩු වයසැති දුප්පත් ළමයින්ගෙන් සියයට 1.6 ක් බර තබන ලද දර්ශකයන්ගෙන් සියයට 60 ක් හෝ වැඩි ප්‍රමාණයකින් විහීනතාවයට පත්වී වැඩිම දරිද්‍රතා තීව්‍රතාව අත්විඳිමින් සිටියි. කෙසේ වෙතත්, කිසිම ළමයෙකු සියළුම මානයන්ගෙන් තුනෙන් දෙකකට වඩා විහීනතාවයට පත්වී නොමැත: ඉහළම විහීනතා පැතිකඩ සියයට 66.6 ක් වේ.

**15 රූපය:** දුප්පත් ළමා ජනගහනයෙන් (වසර 4 හෝ ඊට අඩු වයසැති) කෙතරම් ප්‍රතිශතයක් කෙතරම් විහීනතා මට්ටමක් අත්විඳින්නේද?




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදුකළ ගණනය කිරීම්

## 3.2.2. දර්ශකයට අනුව ළමා දරිද්‍රතාවේ සංයුතිය


මෙම අවස්ථාවේදී, වඩාත් සුදුසු වන්නේ ඔවුන් කුමන විහීනතාවයන් අත්විඳින්නේද සහ ඒවා අවම කරන්නේ කෙසේද යන්න විමසීමයි. මෙම පැනයන්ට පිළිතුරු සැපයීමට, අපි ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය එහි එක් එක් දර්ශකයන් අනුව විභේදනය කර ඒවාහි සංයුතිය පරීක්ෂා කරමු. ළමා දරිද්‍රතා ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා දිවයිනේ අඩු වයසේ පසුවන ළමයින්ගේ බහුමාන දරිද්‍රතාවේ සංයුතිය වටහා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

### වාරණය කළ ජාතික ජනගහන දරිද්‍රතා අනුපාත

බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන සහ එක් එක් දර්ශකයෙන් විහීන වී (වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාත) සිටින අවුරුදු 5 ට අඩු වයසැති ළමයින්ගේ ප්‍රතිශතය විශ්ලේෂණය කිරීමෙන් ළමා බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන ළමයින් ඉහළම මට්ටමේ විහීනතාවයන්ට මුහුණ දෙන දර්ශකයන් හෙළි වේ. බර තබන ලද වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්හි එකතුවෙන්ද ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ගණනය කළ හැකි බව මෙහිදී මෙනෙහි කරමු. එම නිසා ඕනෑම දුප්පත් ළමයෙකුගේ ඕනෑම විහීනතාවක (එනම්, ඕනෑම වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයක) අඩු කිරීමක් ළමා බහුමාන දරිද්‍රතා දර්ශක අගය අඩු කරන අතර ළමයින්ගේ මුල් කාලයේ දිවිය වැඩි දියුණු කරයි.

16 වන රූපය, ශ්‍රී ලංකාවේ අවුරුදු 5 ට අඩු වයසැති ළමයින්ගෙන් විශාල ප්‍රතිශතයක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතරම ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන දර්ශකයෙන්ද (සියයට 34) විහීනතාවයට පත්වී ඇති බව පෙන්වයි. ඒ සමගම අවුරුදු 5 ට අඩු වයසැති ළමයින්ගෙන් තුනෙන් එකක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතර අඩු බරැති හෝ වයසට සරිලන උසකින් තොර හෝ වෙයි (සියයට 33.4). ඊට අමතරව, ළමයින්ගෙන් සියයට 32.9 ක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතර ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයකින් තොර වන අතර, සියයට 24.4 ක් ආසන්නම බස් නැවතුමට ළඟා වීමට විනාඩි 15 ක් වත් ගතවන හෝ ප්‍රාථමික හෝ ද්විතීයික පාසලට ළඟාවීමට විනාඩි 30 ක් වත් ගතවන තරම් දුරකින් පිහිටි නිවසක වෙසෙයි. ශ්‍රී ලංකාවේ ළමා දරිද්‍රතාව අවම කිරීම සඳහා මෙම විහීනතාවයන් මැඩ පැවැත්වීමට ඉහළ ප්‍රමුඛතාවක් දිය යුතු වේ.

**16 රූපය:** ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය: වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදුකළ ගණනය කිරීම්

## වයස් කාණ්ඩ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විසංයෝජනය: දරිද්‍රතා මට්ටම සහ එහි සංයුතිය

ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ උපසමූහ විසංයෝජනය කිරීමේ හැකියාව යොදා ගැනීමෙන් වයස් කාණ්ඩ: වසරකට අඩු, වසර, දෙක, තුන සහ හතර වයසැති සේම ළමයාගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව දරිද්‍රතා මට්ටම සහ එහි සංයුතිය විසංයෝජනය කළ හැකි වේ. 13 වන වගුව, ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය, සිද්ධිය, සහ තීව්‍රතාව වයස් කාණ්ඩ අනුව විසංයෝජනය කර පෙන්වයි. වගුවේ දක්වා ඇති පරිදි, ජනගහනයට වැඩිම දායකත්වයක් (සියයට 22.5 ක්) දක්වන අවුරුදු 4 ක් වයසැති ළමයින් අනෙකුත් වයස් කාණ්ඩ වලට සාපේක්ෂව වැඩි දරිද්‍රතා මට්ටමකින් යුක්ත වේ. අවුරුදු 4 ක් වයසැති ළමයින්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් (සියයට 47.5 ක්) බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතර එය වසර තුනක් වයසැති ළමයින්ගේ ජනගහන දරිද්‍රතා අනුපාතයට (සියයට 34.2) වඩා නිශ්චිත වශයෙන්ම වැඩි අගයක් වන නමුත් එය අනෙකුත් වයස් වර්ෂ වලින් සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු තරම් වෙනස් නොවේ.

සාමාන්‍ය වශයෙන්, වසර 4 ක් වයසැති දුප්පත් ළමයින් ආසන්න වශයෙන් බර තබන ලද දර්ශකයන් ගෙන් සියයට 36 ක් තුළින් විහීනතාවයන් අත්විඳින අතර එම අගය අනෙකුත් වයස් කාණ්ඩ සමග මෙන්ම, වයස අවුරුදු 5 ට අඩු මුළු ළමා ජනගහනයේ එම අගය සමගද සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු තරම් වෙනස් නොවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වසර 4 ක් වයසැති ළමයින් අතර ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය 0.170 ක් වන අතර එම අගය සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු තරම් වැඩි වන්නේ වසර 3 ක් වයසැති ළමයින් ගේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට (0.119 ට) පමණි.

**13 වගුව:** වයස් කාණ්ඩය අනුව ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය


| වයස් කාණ්ඩය | ජනගහන කොටස (%) | ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය | | | දරිද්‍රතා පැතිරි ප්‍රමාණය හෝ ජනගහන දරිද්‍රතාව (H) | | | තීව්‍රතාව (A) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය | | අගය | 95% විශ්‍රම්භ පරාසය | |
| වසර 1 ට අඩු | 17.9% | 0.158 | 0.137 | 0.182 | 46.6% | 40.4% | 53.0% | 34.0% | 32.5% | 35.5% |
| වසරක් වයසැති | 19.2% | 0.155 | 0.134 | 0.179 | 43.3% | 37.5% | 49.3% | 35.8% | 33.9% | 37.8% |
| වසර 2 ක් වයස | 20.2% | 0.135 | 0.117 | 0.156 | 39.2% | 33.9% | 44.8% | 34.5% | 33.2% | 36.0% |
| වසර 3 ක් වයස | 20.2% | 0.119 | 0.100 | 0.142 | 34.2% | 28.7% | 40.1% | 34.9% | 33.2% | 36.7% |
| වසර 4 ක් වයස | 22.5% | 0.170 | 0.152 | 0.191 | 47.5% | 42.5% | 52.6% | 35.9% | 34.5% | 37.3% |
| ජාතික | 100.0% | 0.148 | 0.137 | 0.159 | 42.2% | 39.3% | 45.1% | 35.1% | 34.3% | 35.8% |

මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්


දරිද්‍රතාවේ සංයුතිය වයස් කාණ්ඩය අනුව විශ්ලේෂණය කිරීමෙන් ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග සඳහා ශක්තිමත් අභ්‍යන්තර අවබෝධයන් ලබා දෙයි (17 වන රූපය බලන්න). සියළුම වයස් කාණ්ඩ හරහා, පෝෂණයෙන් විහීනවීම පමණක් සමස්ත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට හතරෙන් එකකට වඩා දායක වෙන අතර එය වසරකට වඩා අඩු වයසැති ළමයින් අතර සැලකිය යුතු ලෙස ඉහළ වේ (එනම්, 17 වන රූපයේ වසරකට වඩා අඩු වයසැති දරුවන්ගේ, 33.3%). සෞඛ්‍යය පහසුකම් සඳහා ප්‍රවේශය (සමස්ත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට සියයට 15 කින් පමණ දායක වන) සහ මුල් ළමාවිය සංවර්ධනය (සියයට 14 ට මදක් අඩු) ඊට ආසන්නව පසුපසින් සිටියි. සෞඛ්‍යය පහසුකම් සඳහා ප්‍රවේශයෙන් විහීනවීම අවුරුදු 2 ක් හා 3 ක් වයසැති ළමයින්ගේ සමස්ත දරිද්‍රතාවට අනෙකුත් වයස් කාණ්ඩ වලට වඩා වැඩි වශයෙන් (පහෙන් එකකට ආසන්නව) දායක වෙයි. අවුරුදු 4 ක් වයසැති ළමයින් අතර, මුල් ළමාවිය සංවර්ධන දර්ශකය එහි ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ සියයට 22.9 කට වග කියන අතර අවුරුදු 2 ක් හා 3 ක් වයසැති ළමයින්ගේ එය සියයට 10 ට වඩා අඩු අගයක් වේ. මෙම දර්ශකය සහ පෝෂණයේ එකතු කළ දායකත්වය අවුරුදු 4 ක් වයසැති සහ වසරකට වඩා අඩු වයසැති ළමයින්ගේ සියයට 45 කට වඩා වැඩි වීම මුල් ළමාවිය සංවර්ධන මානය වසර 5 ට වඩා අඩු වයසැති ළමයින්ගේ සමස්ත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට ඇති ප්‍රමුඛම දායකයා බවට පත්කරයි. ජීවන තත්වය මානය තුළ ඇති දර්ශකයන් වයස් කාණ්ඩ හරහා ඉතා සමාන ලෙස දායක වෙන බවද පෙනෙයි.

මෙම විශ්ලේෂණයේ සත්‍ය වශයෙන්ම ධනාත්මක තොරතුර වන්නේ ශ්‍රී ලංකාවේ අඩු වයසේ පසුවන ගැහැණු ළමයින් හා පිරිමි ළමයින්ගේ දරිද්‍රතා මට්ටම් අතර සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු තරමේ වෙනස්කම් නොමැති බව හෙළිවීමයි. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය: ගැහැණු ළමයින් සඳහා 0.150 සහ පිරිමි ළමයින් සඳහා 0.146, සංඛ්‍යානමය වශයෙන් සමාන වන අතර ගැහැණු ළමයින් හා පිරිමි ළමයින් අතර බහුමාන දරිද්‍රතාවේ සංයුතියද බොහෙවින් සමාන වේ. බොහෝ රටවල් වල දක්නට නොමැති මෙම තත්වය දිවියේ මුල් අවධියේ ස්ත්‍රී-පුරුෂ සමානතාව පිළිබිඹු කරන බැවින් එය සැබවින්ම ශ්‍රී ලාංකිකයින්ගේ අභිමානයට හේතුවන ස්වභාවයකි (18 වන රූපය බලන්න).

**17 රූපය:** වයස් කාණ්ඩය (වසර 4 හෝ ඊට අඩු) අනුව ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන ප්‍රතිශත දායකත්වය




**18 රූපය:** ළමයාගේ (වසර 4 හෝ ඊට අඩු වයසැති ළමුන්ගේ) ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට ඒ ඒ දර්ශකය විසින් ඇතිකරන නිරපේක්ෂ දායකත්වය




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්



“


ශ්‍රී ලංකාවේ අඩු වයසේ පසුවන ගැහැණු ළමයින්ගේ හා පිරිමි ළමයින්ගේ දරිද්‍රතා මට්ටම් අතර සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු තරමේ වෙනස් කම් නොමැත. බොහෝ රටවල් වල දක්නට නොමැති මෙම තත්වය දිවියේ මුල් අවධියේ ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය පිළිබිඹු කරයි.

”

## වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාත

ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රධාන ප්‍රතිඵලයන් විශ්ලේෂණය සමාප්ත කිරීම සඳහා, 19 වන රූපය වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාතයන් ඉදිරිපත් කරයි. මෙම ජනගහන දරිද්‍රතා අනුපාත එක් එක් දර්ශකය සඳහා නිමානය කරන අතර, ඒවා අනුරූප දර්ශකයෙන් විහීනතාවයට පත්වී ඇති අවුරුදු 5 ට අඩු ළමයින්ගේ සමානුපාතය ඔවුන් දුප්පත් වීම හෝ නොවීම නොසලකා පෙන්වනු ලබයි. 19 වන රූපය පෙන්වන ආකාරයට, ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් සඳහා ඇති ප්‍රවේශය සඳහා වන විහීනතාව (ළමයින්ගෙන් සියයට 65 ක් මෙම දර්ශකයෙන් විහීනතාවයට පත්වී සිටියි), පෝෂණය (56.5%), ආහාර පිසීමේ ඉන්ධන (56%), ආසන්නම බස් නැවතුමට හෝ ප්‍රාථමික හෝ ද්විතීයික පාසලකට ළඟා වීම බඳු මූලික පහසුකම් සඳහා ප්‍රවේශය (35.8%) යන දර්ශකයන් ඉහළම විහීනතාවයන් සහිත වේ. අනිත් අතට සමහර දර්ශකයන් බෙහෙවින් අඩු විහීනතා අනුපාතයන් පෙන්වයි. විශේෂිත වශයෙන් සියළුම දර්ශකයන් අතර අවම විහීනතාව පාසල් යාම (0.8%) වන අතර නිදන්ගත රෝග (1.9%) සහ සනීපාරක්ෂාව (2.8%) යන දර්ශකයන්ගෙන්ද සාපේක්ෂව අඩු ජනතාවක් විහීනතාවයට පත්වී ඇත.

**19 රූපය:** ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය: වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

## 3.2.3. ප්‍රතිඵලයන්හි දෘඪතාව සහ සමතිරික්තතා විශ්ලේෂණය


මෙම අවසාන කොටස තෝරා ගත් k-අගය (දරිද්‍රතා සීමාව) සඳහා, සහ ළමා සංවර්ධන මානය තුළ සලකා බලන ලද සහ එක් එක් දර්ශකයන් සඳහා වෙනස් ලෙස බර තබන ලද වෙනස් ව්‍යුහයන් සඳහා දෘඪතා පරීක්ෂාවන් සමග සමතිරික්තතා විශ්ලේෂණය ඉදිරිපත් කරයි.

### විකල්ප දරිදතා සීමාවන් සහ බර තැබීම් (ළමා සංවර්ධන මානය) සඳහා දෘඪතාව

20 වන රූපය දරිද්‍රතා සීමාවේ විවිධ මට්ටම් සඳහා එක් එක් පළාතෙහි H අගය (ජනගහන දරිද්‍රතාව) ප්‍රස්තාර ගත කරයි. මෙම රූපයේ ඡේදනය වන රේඛාවන් මගින් ගත හැකි සියළුම k සීමාවන් සඳහා ළමා දරිද්‍රතාව අනුව පළාත් අතර පෙළ ගැස්වීම නිරවුල් නොවන බව පෙන්වයි. කෙසේ වෙතත්, සාමාන්‍ය වශයෙන්, සියයට 1 සහ සියයට 56 අතර ඇති සෑම දරිද්‍රතා සීමාවක් සඳහාම කොළඹ අග නගරය පිහිටා ඇති බස්නාහිර පළාතේ දරිද්‍රතා මට්ටම සියළුම පළාත් අතර අවම වන බව අපට දැකගත හැකි වෙයි. එබැවින් බස්නාහිර පළාතේ වයස අවුරුදු 5 ට අඩු ළමයින්ගේ බහුමාන දරිද්‍රතාවේ සාමාන්‍ය පැතිරි ප්‍රමාණය මෙම සීමාව තුළ තෝරාගත් දරිද්‍රතා සීමාවේ බලපෑමෙන් ස්වායත්තව දිවයිනේ අඩුම අගය ගනියි.

සාමාන්‍ය වශයෙන්, මෙහි අනෙක් පැත්ත සියයට 1 සිට සියයට 35 දක්වා ඇති සෑම දරිද්‍රතා සීමාවක් සඳහාම පළාත් අතර ළමා බහුමාන දරිද්‍රතාවේ උපරිම සාමාන්‍ය පැතිරි ප්‍රමාණය සහිත ලෙස හඳුනා ගත් ඌව පළාත සඳහා සත්‍ය වේ. සියයට 13 සිට සියයට 47 දක්වා ඇති සෑම දරිද්‍රතා සීමාවක් සඳහාම දිවයිනේ ළමා බහුමාන දරිද්‍රතාවේ අඩුම සාමාන්‍ය පැතිරි ප්‍රමාණය සහිත පළාත් තුන ලෙස බස්නාහිර, දකුණු සහ වයඹ පළාත් හඳුනා ගැනෙයි. සියයට 36 ත් සියයට 62 ත් අතර ළමා බහුමාන දරිද්‍රතාවෙන් ඉහළම සිටින්නේ ඌව සහ මධ්‍යම පළාත් වේ.

**20 රූපය:** විවිධ දරිද්‍රතා සීමාවන් (k) සඳහා පළාත් ජනගහන දරිද්‍රතාව (H)




මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්



14 වන වගුව තෝරාගත් දරිද්‍රතා සීමාව, k=25%, සහ විකල්ප දරිද්‍රතා සීමාවන් 10%, 15%, 35%, සහ 50% යොදා ගනිමින් සිදු කළ පළාත් පෙළ ගැස්වීම සඳහා ස්පියර්මන් සහ කෙන්ඩල් ටෝ-බී ශ්‍රේණිගත කිරීමේ සහසම්බන්ධතා සංගුණකයන් ඉදිරිපත් කරයි. k=10% සහ k=50% අතර විකල්ප දරිද්‍රතා රේඛාවන් සඳහා ස්පියර්මන් සංගුණකය 0.7 ඉක්මවයි. මෙයින් ගම්‍ය වන්නේ අපි 10% සහ 50% අතර විකල්ප දරිද්‍රතා රේඛාවන් සැලකූ විට, දරිද්‍රතා සීමාව, k=25% යොදා ගත් විට ඔවුන් වාර්තා කළ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව සිදුකළ පළාත් ශ්‍රේණිගත කිරීම විශාල දුරකට (අවම වශයෙන් සියයට 70 ක් අවස්ථාවන්හිදී) ආරක්ෂිතව පවතින බවයි.

k=10% සහ k=50% අතර එක් එක් අගයන් සඳහා 0.556 ඉක්මවා යමින් සහ k=10% සහ k=15% සඳහා 0.944 දක්වා ඉහළ යමින් කෙන්ඩල් ටෝ-බී සංගුණකයද සමාන ප්‍රතිඵල ලබා දෙයි (බද්ධ ශ්‍රේණි සඳහා වග වන බැවින් එය සැමවිටම ස්පියර්මන්ට වඩා අඩුවේ). එම නිසා තෝරා ගත් සීමාව අනුව සිදුකළ පළාත් සංසන්දනය කිරීම 10% සහ 50% අතර තෝරා ගත් විකල්ප දරිද්‍රතා සීමාවන්ට දෘඪව පවතින බව නිගමනය වේ.

**14 වගුව:** විවිධ දරිද්‍රතා සීමාවන් සඳහා පළාත් ශ්‍රේණිගත කිරීම් අතර සහසම්බන්ධතාව

| | | k = 25% |
|---|---|---|
| k = 10% | ස්පියර්මන් | 0.983 |
| | කෙන්ඩල් ටෝ-බී | 0.944 |
| k = 15% | ස්පියර්මන් | 0.983 |
| | කෙන්ඩල් ටෝ-බී | 0.944 |
| k = 35% | ස්පියර්මන් | 0.967 |
| | කෙන්ඩල් ටෝ-බී | 0.889 |
| k = 50% | ස්පියර්මන් | 0.700 |
| | කෙන්ඩල් ටෝ-බී | 0.556 |

මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

අපි මෙහි තවත් ගැඹුරට ගොස් වඩාත් නිශ්චිත දෘඪතා පරීක්ෂාව ඉදිරිපත් කරමු. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ශ්‍රී ලංකාවේ වසර 5 ට අඩු වයසැති ළමයින්ගේ නියැදියක් මත පිහිටන නිසා එය සැමවිටම නියැදි දෝෂයට යටත් වේ. ඔවුන්ගේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව පළාත් පෙළ ගැස්වීමේ දෘඪතාව තක්සේරු කිරීමේදී සම්මත දෝෂයන් සලකා බැලීම වැදගත් වේ. අපි මුලින්ම තෝරාගත් මුල් තත්වය වන සියයට 25 හි දරිද්‍රතා සීමාව අනුව සෑම පළාත් යුගලකම ළමා බහුමාන දරිද්‍රතා දර්ශක අගයයන් එකිනෙකට සසඳමු. 2019 ගෘහවීකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ සීමාවන් මත සහ එක් එක් පළාතේ වයස අවුරුදු 5 ට අඩු ළමයින්ගේ නියැදිය කුඩා වීම නිසා, සම්මත දෝෂයන් සැලකිය යුතු ලෙස විශාල වේ. මෙම තත්වය ස්වාභාවිකවම දෘඪතා විමසුමට බලපෑම් ඇති කරනු ලබයි.

අපි තෝරාගත් දරිද්‍රතා සීමාව (k=25%) සහ බර තැබීම් පෙල (11 වන වගුව බලන්න) අනුව සම්මත දෝශයන් සලකමින් සෑම පළාත් යුගලකම ළමා බහුමාන දරිද්‍රතා දර්ශක අගයයන් එකිනෙකට සැසඳුවෙමු. ඉන් පසුව
i) පළමුවන පළාත දෙවන පළාතට වඩා දුප්පත්ද,
ii) දෙවන පළාත පළමුවන පළාතට වඩා දුප්පත්ද, හෝ
iii) වඩා දුප්පත් වන්නේ කුමන පළාතද කියා සංඛ්‍යානමය වශයෙන් තීරණය කළ නොහැකිද ලෙස පැනවීමට හැකිදැයි කියා විමසුවෙමු. අපි මෙම පළාත් ශ්‍රේණිගත කිරීම පදනම් තත්වය ලෙස සළකමු. ඉන් පසු අපි දරිද්‍රතා සීමාවේ වෙනස් කම් වලට සහ බර තැබීමේ යෝජනාවට (උපග්‍රන්ථයේ ඇති 17 වන වගුවේ සහ 18 වන වගුවේ දැක්වෙන ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ මාන බර තැබීමේ එක් එක් වෙනස් ව්‍යුහයන්ට) අනුව දෘඪතා පරීක්ෂාවන් පහත අයුරු සිදු කළෙමු.

අපි එම තෝරාගත් බර තැබීමේ යෝජනාව යටතේ විකල්ප දරිද්‍රතා සීමාවන් k=22% සහ k=30% සඳහා පළාත් ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ඇස්තමේන්තු කළෙමු. පදනම ලෙස ගත් පළාත් පෙළගැස්වීම එහිදී වෙනස් නොවූයේ නම් අපි යුගල වශයෙන් කළ සංසන්දනය කිරීම දෘඪ ලෙස සලකමු. යුගල වශයෙන් ගත හැකි සංසන්දනය කිරීම් 36 න් 22 ක් එනම් සියයට 61.1 ක්, පදනම මත නිශ්චිතව වෙනස් බව, සහ විකල්ප දරිද්‍රතා සීමාවන් යටතේ ඉන් 18 ක් (81.8%) ද නිශ්චිතව වෙනස් බව, සහ දුප්පත්ම කුමන පළාතද ලෙස ඇති පෙළගැස්වීම එසේම පවතින බවද අපට හෙළිවිය. ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව පළාත් පෙළ ගැස්වීම් දරිද්‍රතා සීමාවේ වෙනස් වීම් සඳහා විශාල වශයෙන් ස්ථාවරව පවතින බව මෙම ප්‍රතිඵලයන්ගෙන් පෙනී යයි.

දැන් ව්‍යුහ-බර තැබීමේ යෝජනාවට එදිරිව පළාත් පෙළ ගැස්වීමේ ස්ථාවරත්වය දෙසට හැරෙමින්, අපි පදනම (k=25% සහ ළමා සංවර්ධන මානය තුළ ඇති දර්ශක දෙක මත සමානව බර තැබූ), සහ මෙම මානය තුළ ඇති දර්ශකයන් සඳහා බර තැබීමේ වෙනස් යෝජනාවන් සලකා බලන ලද විකල්ප ව්‍යුහයන්ට යටත්ව ලබාගත් පෙල ගැස්වීම් අතර සම්බන්ධතාව පරීක්ෂා කිරීම සඳහා ඉහත ආකාරයේම යුගල වශයෙන් සිදු කළ සංසන්දනය කිරීමේ පරීක්ෂාවන් සිදු කළෙමු. ළමා සංවර්ධන මානය තුළ විකල්ප දර්ශකයන් සහ බර තැබීම් සලකා බලන ලද පළමු විකල්ප ව්‍යුහයන් දෙක (උපග්‍රන්ථයේ ඇති 17 වන වගුව සහ 18 වන වගුව බලන්න) ගණනය කිරීමෙන් සහ ඉන් පසුව ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ ව්‍යුහය සහ විකල්ප දර්ශකයන් සහිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශක දෙක අතර ඔවුන්ගේ බහුමාන දරිද්‍රතා දර්ශකය අනුව පළාත් පෙළ ගැස්වීම සංසන්දනය කිරීමෙන්, ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ ව්‍යුහය තුළ නිශ්චිතව වෙනස් වන යුගල වශයෙන් කළ සංසන්දනය කිරීම් වලින් සියයට 95.5 ක් දර්ශකයන් දෙක (ජීව විද්‍යාත්මක දෙමව්පියන් සමග වෙසෙන සහ පාසල් යන) වෙන් වශයෙන් හඳුන්වා දෙන ලද පළමු විකල්ප ව්‍යුහය තුළද නිශ්චිතව (දුප්පත් පළාත සමාන වීමද සහිතව) වෙනස් වන බවයි. ජීව විද්‍යාත්මක දෙමව්පියන් සමග වෙසෙන සහ පෙර පාසල් යන දර්ශකයන් සඳහා මුල් ළමා විය සංවර්ධන දර්ශකයේ බර තැබීමෙන් අඩක් ගන්නා සංයෝජනයක් වන දෙවන විකල්ප ව්‍යුහය සමග ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සංසන්දනය කළ විට මෙම ප්‍රතිශතය සියයට 100 ක් දක්වා ඉහළ යයි.[14]

## සමතිරික්තතා විශ්ලේෂණය

පහත 15 වන වගුව සහ 16 වන වගුව ළමා බහුමාන දරිද්‍රතාව ගණනය කිරීම සඳහා යොදාගත් දර්ශකයන් සඳහා සිදු කළ සමතිරික්තතා පරීක්ෂාවේ ප්‍රතිඵල ඉදිරිපත් කරයි. මෙහි ඇතුළත් වන්නේ දර්ශකයන් දෙකෙන්ම විහීනතාවයට පත්විය හැකි සහ සත්‍ය වශයෙන්ම විහීනතාවයට පත්ව සිටින පුද්ගලයින්ගේ ප්‍රතිශතයයි. පෙර පරිදිම, දර්ශකයන් එකිනෙක අනන්‍ය තොරතුරු වලින් දායක වන බව, සහ බොහෝ සිද්ධි වලදී ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ අතිරික්තතාව ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ අතිරික්තතාවට වඩා අඩු බව පෙනී යයි.

14 මෙම ප්‍රතිඵලයන්හි සාරාංශයක් සඳහා කරුණාකර උපග්‍රන්තයේ ඇති 20 වන වගුව බලන්න

**15 වගුව:** ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය - වාරණය නොකළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්හි සමතිරික්තතා විශ්ලේෂණය (ආර්$_0$ මිණුම)

| | පාසල් කාලය | පාසල් යාම | නිදන්ගත රෝග | සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | නිවාස | සනීපාරක්‍ෂාව | පානීය ජලය | ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | වත්කම් | මූලික පහසුකම් | පෝෂණය | මුල් ළමා විය සංවර්ධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් කාලය | 1.000 | | | | | | | | | | | |
| පාසල් යාම | 0.582 | 1.000 | | | | | | | | | | |
| නිදන්ගත රෝග | 0.412 | 0.000 | 1.000 | | | | | | | | | |
| සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | 0.343 | 0.345 | 0.262 | 1.000 | | | | | | | | |
| නිවාස | 0.340 | 0.148 | 0.055 | 0.409 | 1.000 | | | | | | | |
| සනීපාරක්‍ෂාව | 0.293 | 0.149 | 0.023 | 0.228 | 0.443 | 1.000 | | | | | | |
| පානීය ජලය | 0.771 | 0.649 | 0.633 | 0.761 | 0.713 | 0.733 | 1.000 | | | | | |
| ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | 0.762 | 0.687 | 0.654 | 0.821 | 0.753 | 0.746 | 0.699 | 1.000 | | | | |
| වත්කම් | 0.441 | 0.257 | 0.272 | 0.409 | 0.731 | 0.554 | 0.720 | 0.702 | 1.000 | | | |
| මූලික පහසුකම් | 0.460 | 0.422 | 0.434 | 0.798 | 0.572 | 0.477 | 0.689 | 0.690 | 0.435 | 1.000 | | |
| පෝෂණය | 0.602 | 0.542 | 0.628 | 0.607 | 0.705 | 0.638 | 0.659 | 0.594 | 0.614 | 0.600 | 1.000 | |
| මුල් ළමා විය සංවර්ධනය | 0.252 | 0.075 | 0.060 | 0.245 | 0.342 | 0.264 | 0.687 | 0.665 | 0.411 | 0.385 | 0.597 | 1.000 |
| වාරණය නොකළ ජන. දරිද්‍රතා අනුපාතය | 0.219 | 0.008 | 0.019 | 0.191 | 0.077 | 0.028 | 0.650 | 0.560 | 0.332 | 0.358 | 0.565 | 0.206 |

මූලාශ්‍රය: 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්‍ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්

**16 වගුව:** ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය - වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතයන්හි සමතිරික්තතා විශ්ලේෂණය (ආර්$_0$ මිණුම)

| | පාසල් කාලය | පාසල් යාම | නිදන්ගත රෝග | සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | නිවාස | සනීපාරක්ෂාව | පානීය ජලය | ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | වත්කම් | මූලික පහසුකම් | පෝෂණය | මුල් ළමා විය සංවර්ධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පාසල් කාලය** | 1.000 | | | | | | | | | | | |
| **පාසල් යාම** | 0.651 | 1.000 | | | | | | | | | | |
| **නිදන්ගත රෝග** | 0.476 | 0.000 | 1.000 | | | | | | | | | |
| **සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය** | 0.406 | 0.386 | 0.303 | 1.000 | | | | | | | | |
| **නිවාස** | 0.374 | 0.166 | 0.064 | 0.464 | 1.000 | | | | | | | |
| **සනීපාරක්ෂාව** | 0.337 | 0.166 | 0.000 | 0.309 | 0.579 | 1.000 | | | | | | |
| **පානීය ජලය** | 0.800 | 0.684 | 0.731 | 0.796 | 0.748 | 0.780 | 1.000 | | | | | |
| **ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන** | 0.883 | 0.770 | 0.626 | 0.855 | 0.796 | 0.829 | 0.820 | 1.000 | | | | |
| **වත්කම්** | 0.539 | 0.287 | 0.314 | 0.436 | 0.779 | 0.631 | 0.807 | 0.839 | 1.000 | | | |
| **මූලික පහසුකම්** | 0.585 | 0.473 | 0.501 | 0.805 | 0.616 | 0.599 | 0.781 | 0.818 | 0.565 | 1.000 | | |
| **පෝෂණය** | 0.736 | 0.607 | 0.725 | 0.668 | 0.772 | 0.788 | 0.786 | 0.779 | 0.788 | 0.744 | 1.000 | |
| **මුල් ළමා විය සංවර්ධනය** | 0.308 | 0.084 | 0.069 | 0.286 | 0.380 | 0.358 | 0.725 | 0.760 | 0.471 | 0.460 | 0.752 | 1.000 |
| **වාරණය කළ ජනගහන දරිද්‍රතා අනුපාතය** | 0.159 | 0.007 | 0.017 | 0.173 | 0.067 | 0.021 | 0.329 | 0.340 | 0.213 | 0.244 | 0.334 | 0.164 |

මූලාශ්‍රය: 2019 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත කතෘ විසින් සිදු කළ ගණනය කිරීම්



# 4

# සමාප්තය

මෙම වාර්තාව 2019 ගෘහඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත නිමානය කරන ලද සහ තිරසර සංවර්ධන අරමුණු දර්ශක 1.2.2 වශයෙන් වාර්තා කරනු ලබන ශ්‍රී ලංකාවේ නව නිල සංඛ්‍යාතීන් දෙකක් වන ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය භාවිතා කරමින් බහුමාන දරිද්‍රතාව පිළිබඳව අංග සම්පූර්ණ දල විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත.

සමස්තයක් වශයෙන්, ජනගහනයෙන් සියයට 16.0 ක් ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව දරිද්‍රතාවෙන් පෙළෙන නමුත් දිවයිනේ දරිද්‍රතා මට්ටම් විවිධ අගයන් ගනියි. දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනයෙන් අඩකට වඩා වෙසෙන වතු ප්‍රදේශයන් සහ දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනයෙන් සියයට 80 කට වඩා වෙසෙන ග්‍රාමීය ප්‍රදේශයන් ඉහළම දරිද්‍රතාව සහිත ප්‍රදේශයන් වේ. නුවරඑලිය, බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි ඉහළම බහුමාන දරිද්‍රතාව පවතින අතර අවුරුදු 65 ට වැඩි වයසැති ජනගහනය අතරද ඉහළ දරිද්‍රතාවයක් පවතී.

ප්‍රතිපත්ති ප්‍රමුඛතාවන් කලාප සහ කණ්ඩායම් අනුව වෙනස් වෙයි. පොදු වශයෙන් සනීපාරක්ෂාව, නිදන්ගත රෝග, සහ පාසල් යාම යන විහීනතාවයන්ට අඩු නැඹුරුතාවක් පවතින අතර, සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය, පානීය ජලය, සහ ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන සහ මූලික පහසුකම් යන විහීනතාවයන්ට වැඩි නැඹුරුතාවක් පවතී. නිල ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සහ එහි ආශ්‍රිත තොරතුරු වේදිකාව එක් එක් අංශය, දිස්ත්‍රික්කය, හෝ ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්හි වැඩි බලපෑමක් කළහැකි ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාකරන්නන් හට උපාය මාර්ගිකව යොදා ගත හැකි ආකාරයේ අන්තර් සම්බන්ධිත විහීනතාවයන්හි කාඩ්-දිශානුගත පැතිකඩයන් සපයයි.

අලුතෙන් හඳුන්වා දෙන ලද තනි පුද්ගල ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය අනුව යන නිල සංඛ්‍යාතියක් වේ. තනි පුද්ගල මට්ටමින් මනිනු ලබන සහ වයස අවුරුදු 5 ට අඩු සියළු ළමයින් ආවරණය කරනු ලබන ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ඇති සියළුම දර්ශකයන් ඇතුලත් වන (ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව දරිද්‍රතාවෙන් පෙළෙන සියළුම ළමයින් තවදුරටත් දුප්පත්ව පවතින) අතර ශ්‍රී ලංකාව තුළ මූලික වශයෙන් වැදගත් වන පෝෂණ ඌනතාව සහ මුල් ළමාවිය සංවර්ධනය යන විහීනතාවයන් දෙකද සලකා බැලෙන සේ එහි විහීනතා වපසරිය පුළුල් කර ඇත.

මෙම සම්බන්ධිත ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව වයස අවුරුදු 5 ට අඩු ළමයින් ගෙන් සියයට 42.2 ක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන අතර, කුඩා දරුවන්ගෙන් අනතුරු අඟවන සුළු තුනෙන් එක් කොටසක් දරිද්‍රතාවෙන් පෙළෙන අතරම පෝෂණ ඌනතාවෙන්ද පෙළෙයි. ළමා වියේ දරිද්‍රතාවේ බලපෑම ජීවිත කාලය පුරාම පැවතිය හැකි බැවින් ළමයින්ගේ ගැටළු මතට ආලෝකය එල්ල කිරීම, සහ පෙර පාසල් යාමේ සහ සංජානන සංවර්ධනය සඳහා සක්‍රීය දෙමව්පිය උත්තේජනයේ ඇති සැලකිය යුතු තරමේ වෙනස්කම් පැතිකඩ ඉදිරිපත් කිරීම ඉතාම තීරණාත්මක වේ. කෙසේ වෙතත්, ගැහැණු සහ පිරිමි ළමයින්ගේ දරිද්‍රතා මට්ටම් අතර සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු වෙනසක් නොමැති වීමේ තොරතුර වැනි ධනාත්මක සොයා ගැනීම්ද වෙයි.

ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ඉලක්කය වනුයේ බහුමාන දරිද්‍රතා මට්ටම සහ එහි හැඩය හෙළි කරන අන්දමේ පැහැදිලි හා ශක්තිමත් සංඛ්‍යාති ලබාදීම, ඉලක්ක කළ යුතු තැන් පිළිබඳ තොරතුරු සැපයීම, අයවැය ප්‍රතිපාදන සුදුසු ලෙස වෙන් කිරීම, බහුආංශික ප්‍රතිපත්ති නිර්මාණය කිරීම, සහ දරිද්‍රතාව පිටුදැකීමේ ක්‍රියාවන් සම්බන්ධීකරණය කිරීම වේ. එම අරමුණු සියල්ලම ළමයින් සඳහා පවතින ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා අනුපූරකයක් වේ. මෙම දත්ත 2019 කෝවිඩ් වසංගතයට පෙර රැස් කරනු ලැබූ ඒවා බැවින් දුප්පතුන් කෙරෙහි වසංගතය විසින් ඇති කළ බලපෑම ඊළඟ දත්ත රැස් කිරීම විසින් හෙළි කරනු ඇත. ඕනෑම දුප්පත් පුද්ගලයෙකුගේ ඕනෑම විහීනතාවයක අඩුවීම බහුමාන දරිද්‍රතාව අඩු කිරීමටද හේතු වන බැවින් ඉදිරි කාලයේදී, ජාතික සහ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයන් ඒවාට ඵලදායි ලෙස ලඟාවිය හැකි කාර්යයක් වන දරිද්‍රතාව පිටුදැකීමේ උන්නතිය අධීක්ෂණය කිරීම සඳහා යොදා ගනු ලබනු ඇත.

# සම්බන්ධ යොමු

ඇල්කයර්, එස්. සහ ජේ. ෆොස්ටර් (2011) "Counting and Multi-dimensional Poverty Measurement" *Journal of Public Economics.*

ඇල්කයර්, එස්., ෆොස්ටර්, ජේ. ඊ., සෙත්, එස්., සැන්ටෝස්, එම්. ඊ., රෝච්, ජේ. එම්., සහ බැල්ලොන්, පී (2015) (2011). *Multidimensional poverty measurement and analysis.* Oxford University Press.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මූලාරම්භ ආයතනය (OPHI) (2019). *How to build a national multidimensional poverty index (MPI): using the MPI to inform the SDGs.* UNDP

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන මූලාරම්භ ආයතනය (OPHI) (2021). *Global Multidimensional Poverty Index 2021: unmasking disparities by ethnicity, caste and gender.* UNDP.

# උපග්‍රන්ථය

**17 වගුව:** ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා විකල්ප ව්‍යුහය 1: (ගෘහඒකක මට්ටම් මිණුම)

| මානය | දර්ශකය | විහීනවීමේ සීමාව: වසර 5 ට අඩු වයසැති ළමුයෙක් විහීන තත්වයට පත්වීමට නම් ..... | බර තැබීම |
|---|---|---|---|
| අධ්‍යාපනය (1/4) | පාසල් කාලය | ඔවුන් පාසල් යන කාලයේ පැවති අනිවාර්ය මට්ටමට (වයස මත තීරණය වන) අඩු පාසල් මට්ටමක් සහිත හෝ කිසිදා පාසල් නොගිය, හෝ විශේෂ අධ්‍යාපනය ලබන වයස අවුරුදු 17 හෝ ඊට වැඩි එක් සාමාජිකයෙක් හෝ ගෘහඒකකයේ සිටියි | 1/16 |
| | පාසල් යාම | පාසල් යන වයසේ (අවුරුදු 5-16) සිටින පාසල් නොයන එක් ළමයෙක් හෝ ගෘහඒකකයේ සිටියි | 3/16 |
| සෞඛ්‍යය (1/4) | නිදන්ගත රෝග | එක් මසක් හෝ වැඩි කාලයකට ඔවුන්ගේ සාමාන්‍ය කටයුතු හෝ රැකියාව නතර කිරීමට තරම්වූ නිදන්ගත රෝගයකින් පීඩා විඳින එක් සාමාජිකයෙක් හෝ ගෘහඒකකයේ සිටියි | 1/8 |
| | සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | ගෘහඒකකයේ සිට සෞඛ්‍ය පහසුකම් සඳහා ළඟා වීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගතවේ | 1/8 |
| ජීවන තත්වය (1/4) | නිවාස | ගෘහඒකකයේ බිත්ති, ගෙබිම හෝ වහල සඳහා ස්ථිර නොවන ද්‍රව්‍ය යොදා ගෙන ඇත | 1/24 |
| | සනීපාරක්ෂාව | ගෘහඒකකයේ පහසුකම වැඩි දියුණු නොකළ හෝ පහසුකම වෙනත් ගෘහඒකකයක් සමග හවුලේ භාවිතා කරන | 1/24 |
| | පානීය ජලය | ගෘහඒකකයට ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් නොමැති, හෝ ඒ සඳහා විනාඩි 15 කට සමාන හෝ වැඩි කාලයක් ගතවන හෝ දුර කි.මී. 1 කට වැඩි, හෝ පසුගිය මාසයේ පානීය ජලය ප්‍රමාණවත් නොවූ, හෝ පානීය ජලය වැඩි දියුණු නොකළ තත්වයේ ඇති | 1/24 |
| | ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | ගෘහඒකකය ආහාර පිසීම සඳහා දර, භූමිතෙල්, ලී කුඩු හෝ දහයියා යොදා ගනියි | 1/24 |
| | වත්කම් | ගෘහඒකකයට රූපවාහිනී, සෝදන යන්ත්‍ර, ශීතකරන, පරිගණක, යතුරු පැදි, ත්‍රී රෝද රථ, කාර්, වෑන්, බස්, ලොරි ආදියෙන් එකක් වත් අහිමි සහ ඉඩම්, සත්ව පාලන, කෘෂිකාර්මික/ ධීවර උපාංග (ට්‍රැක්ටර්, පාහින යන්ත්‍ර, සංයුක්ත අස්වනු නෙලීමේ යන්ත්‍ර, ධීවර බෝට්ටු, මාළු දැල් ආදියෙන් එකකට වැඩියෙන් නොමැති | 1/24 |
| | මූලික පහසුකම් | ගෘහඒකකයට ආසන්නම බස් නැවතුමට ළඟා වීමට විනාඩි 15 කට සමාන හෝ වැඩි කාලයක් හෝ ප්‍රාථමික හෝ ද්විතීයික පාසලට ළඟා වීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගත වන | 1/24 |
| ළමා සංවර්ධනය (1/4) | පෝෂණය | ගෘහඒකකයේ අඩු බර ඇති හෝ වයසට සරිලන උසකින් තොර එක් ළමයෙක් හෝ සිටියි | 1/16 |
| | ජීව විද්‍යාත්මක මව්පියන් | මව්පිය දෙපළම (ජීව විද්‍යාත්මක මව්පියන්) ඔහු හෝ ඇය සමග නොවෙසෙන වයස අවුරුදු 18 ට අඩු එක් ළමයෙක් හෝ ගෘහඒකකයේ සිටියි | 1/16 |
| | මුල් ළමාවිය සංවර්ධනය | මාස 5 හෝ ඊට අඩු වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හෝ අවුරුදු 10 ට අඩු වෙනත් ළමයෙකු සමග හැරදා ගොස් සිටි<br><br>මාස 6 ත් 11 ත් අතර වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හෝ අවුරුදු 10 ට අඩු වෙනත් ළමයෙකු සමග හැරදා ගොස් සිටි හෝ නිවසේ ඔවුන් සතුව මෘදු ක්‍රීඩා භාණ්ඩ නොමැති හෝ ඔවුන්ගේ ස්වකීය ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ සහය නොලැබෙන<br><br>අවුරුදු 1 ත් 3 ත් අතර වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හෝ අවුරුදු 10 ට අඩු වෙනත් ළමයෙකු සමග හැරදා ගොස් සිටි හෝ නිවසේ ඔවුන් සතුව මෘදු ක්‍රීඩා භාණ්ඩ සහ පොත් නොමැති හෝ ඔවුන්ගේ ස්වකීය ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ සහය නොලැබෙන<br><br>එක් ළමයෙකු හෝ ගෘහඒකකයේ සිටියි | 1/16 |
| | පෙර පාසල් අධ්‍යාපනය | පෙර පාසල් වයසේ පසුවන (අවුරුදු 4 ක් වයසැති) පෙර පාසල් නොයන එක් ළමයෙකු හෝ ගෘහඒකකයේ සිටියි | 1/16 |

**18 වගුව:** ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා විකල්ප ව්‍යුහය 2: (වසර 4 හෝ ඊට අඩු වයසැති ළමුන් - තනි පුද්ගල - සංජානන සංවර්ධනය සමග)

| මානය | දර්ශකය | විහීනවීමේ සීමාව: වසර 5 ට අඩු වයසැති ළමුයෙක් විහීන තත්වයට පත්වීමට නම් ..... | බර තැබීම |
|---|---|---|---|
| **අධ්‍යාපනය (1/4)** | පාසල් කාලය | ඔවුන් පාසල් යන කාලයේ පැවති අනිවාර්ය මට්ටමට (වයස මත තීරණය වන) අඩු පාසල් මට්ටමක් සහිත හෝ කිසිදා පාසල් නොගිය, හෝ විශේෂ අධ්‍යාපනය ලබන වයස අවු. 17 හෝ ඊට වැඩි එක් සාමාජිකයෙක් හෝ ගෘහඒකකයේ සිටියි | 1/16 |
| | පාසල් යාම | පාසල් යන වයසේ (අවුරුදු 5-16) සිටින පාසල් නොයන එක් ළමයෙකු හෝ ගෘහඒකකයේ සිටියි | 3/16 |
| **සෞඛ්‍යය (1/4)** | නිදන්ගත රෝග | එක් මසක් හෝ වැඩි කාලයකට ඔවුන්ගේ සාමාන්‍ය කටයුතු හෝ රැකියාව නතර කිරීමට තරම්වූ නිදන්ගත රෝගයකින් පීඩා විඳින එක් සාමාජිකයෙක් හෝ ගෘහඒකකයේ සිටියි | 1/8 |
| | සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | ගෘහඒකකයේ සිට සෞඛ්‍ය පහසුකම් සඳහා ළඟා වීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගතවේ | 1/8 |
| **ජීවන තත්වය (1/4)** | නිවාස | ගෘහඒකකයේ බිත්ති, ගෙබිම හෝ වහල සඳහා ස්ථිර නොවන ද්‍රව්‍ය යොදා ගෙන ඇත | 1/24 |
| | සනීපාරක්ෂාව | ගෘහඒකකයේ පහසුකම වැඩි දියුණු නොකළ හෝ පහසුකම වෙනත් ගෘහඒකකයක් සමග හවුලේ භාවිතාව ඇති | 1/24 |
| | පානීය ජලය | ගෘහඒකකයට ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් නොමැති, හෝ ඒ සඳහා විනාඩි 15 කට සමාන හෝ වැඩි කාලයක් ගතවන හෝ දුර කි. මී. 1 කට වැඩි, හෝ පසුගිය මාසයේ පානීය ජලය ප්‍රමාණවත් නොවූ, හෝ පානීය ජලයේ තත්වය වැඩි දියුණු නොකළ තත්වයේ ඇති | 1/24 |
| | ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | ගෘහඒකකය ආහාර පිසීම සඳහා දර, භූමිතෙල්, ලී කුඩු හෝ දහයියා යොදා ගනියි | 1/24 |
| | වත්කම් | ගෘහඒකකයට රූපවාහිනී, සෝදන යන්ත්‍ර, ශීතකරන, පරිගණක, යතුරු පැදි, ත්‍රී රෝද රථ, කාර්, වෑන්, බස්, ලොරි ආදියෙන් එකක් වත් අහිමි සහ ඉඩම්, සත්ව පාලන, කෘෂිකාර්මික/ ධීවර උපාංග (ට්‍රැක්ටර්, පාහින යන්ත්‍ර, සංයුක්ත අස්වනු නෙලීමේ යන්ත්‍ර, ධීවර බෝට්ටු, මාළු දැල් ආදියෙන් එකකට වැඩියෙන් නොමැති | 1/24 |
| | මූලික පහසුකම් | ගෘහඒකකයට ආසන්නම බස් නැවතුමට ළඟා වීමට විනාඩි 15 කට සමාන හෝ වැඩි කාලයක් හෝ ප්‍රාථමික හෝ ද්විතීයික පාසලට ළඟා වීමට විනාඩි 30 කට සමාන හෝ වැඩි කාලයක් ගත වන | 1/24 |
| **ළමා සංවර්ධනය (1/4)** | පෝෂණය | ඔහු හෝ ඇය අඩු බර ඇතිව හෝ වයසට සරිලන උසකින් තොරව සිටියි | 1/8 |
| | මුල් ළමාවිය සංවර්ධනය | ඔහු හෝ ඇය<br>මාස 6 ට අඩු වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හෝ අවුරුදු 10 ට අඩු වෙනත් ළමයෙකු සමග හැරදා ගොස් සිටියේ නම්<br>මාස 6 ත් 11 ත් අතර වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හෝ අවුරුදු 10 ට අඩු වෙනත් ළමයෙකු සමග හැරදා ගොස් සිටියේ නම් හෝ නිවසේ ඔවුන් සතුව මෘදු ක්‍රීඩා භාණ්ඩ නොමැති නම් හෝ ඔවුන්ගේ ස්වකීය ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ සහය නොලැබෙන්නේ නම්<br>අවුරුදු 1 ත් 3 ත් අතර වයසැති සහ පැයකට වැඩි කාලයක් සඳහා නිවසේ තනිව හෝ අවුරුදු 10 ට අඩු වෙනත් ළමයෙකු සමග හැරදා ගොස් සිටියේ නම් හෝ නිවසේ ඔවුන් සතුව මෘදු ක්‍රීඩා භාණ්ඩ සහ පොත් නොමැති හෝ ස්වකීය ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටියන්ගේ සහය නොලැබෙන්නේ නම් | 1/16 |
| | සංජානන වර්ධනය | ඔහු හෝ ඇය<br>වයස අවුරුදු 4 ට අඩු සහ මව්පිය දෙපළම (ජීව විද්‍යාත්මක මව්පියන්) සමග නොවෙසේ නම්<br>පෙර පාසල් වයසේ පසුවන (අවුරුදු 4 ක් වයසැති) සහ පෙර පාසල් නොයන්නේ නම් | 1/16 |

**19 වගුව:** ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයයෙහි දෘඪතාවය පිළිබඳ විශ්ලේෂණය

| දෘඪතා විශ්ලේෂණය | දරිද්‍රතා සීමාවේ (k) විකල්ප අගයන්ට දෘඪතාව | ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ ව්‍යුහය තුළ සලකා බලන ලද මානයන්හි විකල්ප බර තැබීමේ යෝජනාවන්ට දෘඪතාව | | |
|---|---|---|---|---|
| **දෘඪතා පරීක්ෂාවෙන් ලබාගත් තොරතුරු** | **ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ දරිද්‍රතා සීමාව (k = 33%) සමග k = 30% සහ k = 40%** | A1* **සමග ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ බර තැබීම** | A2** **සමග ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ බර තැබීම** | A3*** **සමග ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයේ බර තැබීම** |
| A: දිස්ත්‍රික්ක 25 අතර යුගල වශයෙන් ගතහැකි සැසඳීම් | 300 | 300 | 300 | 300 |
| B: පදනම (ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය) මත සැලකිය යුතු ලෙස වෙනස් වන (95% විශ්‍රම්භ සීමාවට) යුගල සැසඳීම් ගණන | 154 | 154 | 154 | 154 |
| C: ඉහත B හි යුගල සැසඳීම් ගණන + පදනම (ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය) මත සැලකිය යුතු ලෙස වෙනස් නොවන (95% විශ්‍රම්භ සීමාවට) නමුත් පැවති වැඩි දුප්පත් පිළිවෙල වෙනස් නොවී පවතින යුගල සැසඳීම් ගණන | 216 | 227 | 235 | 252 |
| D: විකල්පයන් තුළ සැලකිය යුතු ලෙස වෙනස් වන (95% විශ්‍රම්භ සීමාවට) සහ පදනම (ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය) හි පැවති වැඩි දුප්පත් පිළිවෙල වෙනස් නොවී පවතින ඉහත B හි යුගල සැසඳීම් ගණන | 125 | 130 | 127 | 139 |
| **දෘඪතා අනුපාතය** | | | | |
| **සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු දෘඪතා අනුපාත:** සියළුම සැලකිය යුතු ලෙස වෙනස් යුගල සැසඳීම් අතර දෘඪ යුගල සැසඳීම් (D/B) | 81.2% | 84.4% | 82.5% | 90.3% |

*A1, අධ්‍යාපන මානයට 50% ක් සහ සෞඛ්‍යය සහ ජීවන තත්වය මානයන්ට 25% බැගින් බර තබනු ලබන ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට පළමුවන විකල්ප බර තැබීමේ ව්‍යුහයට අනුරූප වේ.
**A2, සෞඛ්‍යය මානයට 50% ක් සහ අධ්‍යාපන සහ ජීවන තත්වය මානයන්ට 25% බැගින් බර තබනු ලබන ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට දෙවන විකල්ප බර තැබීමේ ව්‍යුහයට අනුරූප වේ.
***A3, ජීවන තත්වය මානයට 50% ක් සහ සෞඛ්‍යය සහ අධ්‍යාපන මානයන්ට 25% බැගින් බර තබනු ලබන ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකයට පළමුවන විකල්ප බර තැබීමේ ව්‍යුහයට අනුරූප වේ.

**20 වගුව:** ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයයෙහි දෘඪතාවය පිළිබඳ විශ්ලේෂණය

| දෘඪතා විශ්ලේෂණය | දරිද්‍රතා සීමාවේ (k) විකල්ප අගයන්ට දෘඪතාව | ළමා සංවර්ධන මානය තුළ ඇති දර්ශකයන්ට වෙනස් බර තැබීමේ යෝජනාවන් සලකා බලන ලද ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ විකල්ප බර තැබීමේ ව්‍යුහයන්ට දෘඪතාව | |
|---|---|---|---|
| **දෘඪතා පරීක්ෂාවෙන් ලබාගත් තොරතුරු** | **ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ දරිද්‍රතා සීමාව (k = 25%) සමග k = 22% සහ k = 30%** | **A1* සමග ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ බර තැබීමේ යෝජනාව** | **A2** සමග ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයේ බර තැබීමේ යෝජනාව** |
| A: පළාත් 9 අතර යුගල වශයෙන් ගතහැකි සැසඳීම් | 36 | 36 | 36 |
| B: පදනම (ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය) මත සැලකිය යුතු ලෙස වෙනස් වන (95% විශ්‍රම්භ සීමාවට) යුගල සැසඳීම් ගණන | 22 | 22 | 22 |
| C: ඉහත ඊ හි යුගල සැසඳීම් ගණන + පදනම (ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය) මත සැලකිය යුතු ලෙස වෙනස් නොවන (95% විශ්‍රම්භ සීමාවට) නමුත් පැවති වැඩි දුප්පත් පිළිවෙල වෙනස් නොවී පවතින යුගල සැසඳීම් ගණන | 32 | 34 | 36 |
| D: විකල්පයන් තුළ සැලකිය යුතු ලෙස වෙනස් වන (95% විශ්‍රම්භ සීමාවට) සහ පදනම (ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය) හි පැවති වැඩි දුප්පත් පිළිවෙල වෙනස් නොවී පවතින ඉහත B හි යුගල සැසඳීම් ගණන | 18 | 21 | 22 |
| **දෘඪතා අනුපාතය** | | | |
| **සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු දෘඪතා අනුපාතඃ** සියළුම සැලකිය යුතු ලෙස වෙනස් යුගල සැසඳීම් අතර දෘඪ යුගල සැසඳීම් (D/B) | 81.8% | 95.5% | 100.0% |

*A1, ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට පළමුවන විකල්ප බර තැබීමේ ව්‍යුහයට අනුරූප වේ (විස්තර සඳහා උපග්‍රන්ථයේ 17 වන වගුව බලන්න).
**A2, ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයට දෙවන විකල්ප බර තැබීමේ ව්‍යුහයට අනුරූප වේ (විස්තර සඳහා උපග්‍රන්ථයේ 18 වන වගුව බලන්න).

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
නො. 3/1, රාජකීය මාවත,
කොළඹ 07, ශ්‍රී ලංකාව
Tel: +94 112 677550
Fax: +94 11 2677110
www.unicef.org/srilanka

UNICEFSriLanka
unicef_srilanka
UNICEF_SriLanka

unicef
for every child
සෑම දරුවෙක් වෙනුවෙන්ම
ஒவ்வொரு சிறுவர்களுக்காகவும்

ISBN 978-955-1720-05-6
9 789551 720056